නීනා ගර්නත් සහ
ග්‍රිගෝරි යැප්ෆෙල්ඩ්

කැතී සහ කිඹුලා



ජේ.ඊ. ගුණසේකර

සූරිය පොතක්

කැති

සහ

කිඹුලා

KATHIE AND CROCODILE
by Nina Girnath & Gregory Yadgefeld

Sinhala translation by
J. E. Gunasekara

Published by
Athula Jayakody
SOORIYA PUBLISHERS
Rev. S. Mahinda Mawatha,
Maradana, Colombo 10
Sri Lanka.
Tel / Fax - 693607

නීනා ගර්නත්

සහ

ග්‍රිගොරි යැප්ෆෙල්ඩ්

කැතී

සහ

කිඹුලා

අනුවාදක

ජේ. ඊ. ගුණසේකර

සංශෝධක

ජේ. පී. ගුණසේකර

චිත්‍ර

බී. කලවුෂන්

සූරිය ප්‍රකාශකයෝ

කැතී සහ කිඹුලා
පළමු වන මුද්‍රණය - 1964
දෙ වන මුද්‍රණය - 2000

© ජේ. ඊ. ගුණසේකර

ISBN 955-8425-14-X

පරිගණක පිටු සැකැසුම
ප්‍රසාද් සමරසේකර
(12 ප්‍රමාණයේ අභය අකුරු මෝස්තරයෙනි)

මුද්‍රණය
එස්. ඇන්ඩ් එස්. ප්‍රින්ටර්ස්
33, පාසැල් පටු මඟ
කොළඹ - 9

ප්‍රකාශනය
අතුල ජයකොඩි
සූරිය ප්‍රකාශකයෝ
109, එස්. මහින්ද හිමි මාවත,
මරදාන, කොළඹ 10
ටෙලි: 693607

අනුවාදකගෙන් වචනයක්.........

පොත් -හොඳ පොත්- තවත් හොඳ පොත් යනු අද සිංහල උගන්නා දස ලක්ෂ සංඛ්‍යාත ළමා පරපුර කෙරෙන් නැග එන සටන් පාඨය වී තිබේ.

සිඟිත්තන් කිරට අඬන්නාක් මෙන් හොඳ පොත් ඉල්ලා අඬන්න තරම් හැම ළමයකුට ම අයිතියක් ඇත. ඔවුන් ගේ කියවීම් පිපාසය සඳහා කළ හැකි සියල්ල කිරීම පොත පත ලියන්නවුන් සතු යුතුකම ය.

කැතී සහ කිඹුලා නම් සෝවියට් ළමා කථාව සිංහල කියවන ළමයින් වෙත ඉදිරිපත් කරනුයේ එහෙයිනි. මේ කථාව මෙන් ම ඒ අනුව සාද ඇති චිත්‍ර පටිය ද සෝවියට් දේශයෙහි ළමයින් අතර අතිශයින් ජනප්‍රිය වී තිබේ. මොස්කව් හි විදේශ භාෂා ප්‍රකාශක මන්දිරයෙන් පළ කර ඇති මේ පොතේ අනුවාදයන් ලොව මුළුල්ලේ නොයෙක් භාෂා උගන්නා ළමෝ ආශාවෙන් කියවති.

හෙමින් හෙමින් නමුදු ක්‍රමවත් සිංහල ළමා සාහිත්‍යයක් ගොඩ නැඟීගෙන එයි. කැතී සහ කිඹුලා ද එයට රුකුලක් වනු ඇතැයි සිතමු.

ජේ. ඊ. ගුණසේකර

1964 ඔක්තෝබර් 10,
හබරකඩ
හෝමාගම.



සංශෝධකගෙන් වචනයක්..........

කැතී සහ කිඹුලා නම් ළමා චිත්‍රපටි කථාව නීනා ගර්නත් සහ ග්‍රිගොරි යැප්ෆෙල්ඩ් යන සෝවියට් ලේඛකයන් විසින් ලියන ලදී.

නීනා ගර්නත් ළමයින් ගේ ලේඛිකාවකි. ඕ 1904 දී ඔඩෙස්සා හි උපන්නී ය; 1930 දී ලෙනින්ග්‍රෑඩ් නාට්‍යායතනයෙන් නාට්‍ය අධ්‍යක්ෂණය පිළිබඳ උපාධි ලද්දී ය. උපාධි ලාභයෙන් පසු නාට්‍ය අධ්‍යක්ෂණය අත් හැර ලේඛක වෘත්තියට පිළිපන්නී ය. එ තැන් පටන් ඇ විසින් ළමයින් උදෙසා ලියන ලද කෙටි කථා, නාට්‍ය සහ වෙනත් පොත් බොහෝ ය.

1908 දී ලෙනින්ග්‍රෑඩ් හි උපන් ග්‍රිගොරි යැප්ෆෙල්ඩ් එම නාට්‍යායතනයෙ හි සිනමා අංශයෙන් උපාධි ලැබූවෙකි. ඔහු වේදිකාව ට මෙන් ම සිනමා තිරයට ද කථා රාශියක් ලියා ඇත.

මාගරට් වැට්ලින්ගේ ඉංගිරිසි අනුවාදය සිංහලට නඟන ලද්දේ ළමා නාට්‍ය ලිවීමේ සහ නිෂ්පාදනය කිරීමේ හුරු කම් ද ඇති පළ පුරුදු ලේඛකයකු වූ ජේ. ඊ. ගුණසේකර විසිනි.

අනුවාදක මෙයට දෙළොස් වසරකට පෙර අභාවයට පත් වූව ද වසර 36 කට පසු මෙහි දෙවන මුද්‍රණය ප්‍රකාශයට පත් කිරීම සඳහා කෘතිය අගය කළ සූරිය ප්‍රකාශකයනට ස්තුතිය පිරි නැමේ.

සංශෝධක,
ජේ. පී. ගුණසේකර
56, හබරකඩ.

1

කැතී බෝලය බිම ගසා අල්ලමින් සෙවන මාවත දිගේ ගමන් කළා ය.

ඈ බෝලය දෙස බැලුවේ යන්තමිනි. එහෙත් බිම වැදුණ වහා ම නොපෙනෙන රබර් පටියකින් අතේ බඳින ලද්දක් මෙන්-අතට ම ඇදී ආවේ ය. ගස්වල සෙවනැලි පාර පුරා විසිරී තිබුණ නමුත් බෝලය හැම විට ම වැදුණේ ඉර අව්ව ඇති තැන්වල ය. සුළඟින් අතු සැලෙන නිසා අව්ව ඇති තැන් වහා ම වෙනස් වන වේලාවක එසේ කිරීම පහසු කාරියක් නො වී ය.

කැතී බෝලය බිම ගසා ඇල්ලීමේ සෙල්ලමෙහි ගජ හපනියකි.

බෝලය බිම වැදෙන වරක් පාසා ම ඈ "තුන් සිය පහයි.... තුන් සිය හයයි.... තුන් සිය හතයි...." යනුවෙන් තොල් මතුළා ය. ඈ මුමුණන මේ ගණන් වලින් ඇගේ ගණන් කිරීමේ හැකියාව සහ ක්‍රීඩාවෙහි දක්ෂතාවත් ඈ ගමන් කර ඇති දුරත් ඔබට සිතා ගත හැකි ය.

ඇගේ යෙහෙළියන්ගෙන් එකියකට වත් මේ ක්‍රීඩාවෙහි දී ඈ පරදවන්නට බැරි ය. ඈ වසන වත්තේ හෝ වීදියේ හෝ ඉන්නා කිසි ම දැරියකට ඈ පරදවන්නට බැරි ය. කැතී ඔවුන් හැම දෙන පරදවා ඇත. දැන් ඈ ඊළඟ වීදියට ද බැස, එහි සිටින අයටත් සිය හපන් කම් පෙන්නීමට ගමන් කරයි.

ඈ ගහක් ළඟ නැවතුණා ය.

ගහ මුල බංකුවක අත දරුවකු වඩා ගත් ආයාවක් වාඩි වී උන්නා ය. ඈට පමණක් ඇසෙන සේ "ගහන්නම් ඔයාගේ කරට උඩින්" යි තොල් මතුළ කැතී පිට පිට හත් වාරයක් ම බෝලය ආයාගේ කරට උඩින් ගසට ගැසුවා පමණක් නොව සෑම වරක ම ආපසු එන

බෝලය ඇල්ලීමට පෙර පුරා රවුමක් කරකැවුණා ය. මාවත අද්දර මල් පාත්තිවලට වතුර දමමින් සිටි මහල්ලා ද බංකුවක වාඩි වී අව්ව තපිමින් හුන් මැහැල්ල ද වැලි ගොඩක සෙල්ලම් කරමින් සිටි ළමයින් රංචුව ද ඇස් අයා ඈ දෙස මවිතයෙන් බලා සිටීම අරුමයක් නො වී ය.

කැතී පළමුව වමතින් ද යළි දකුණතින් ද බෝලය බිම ගසා අල්ලමින් නොනැවත ගමන් කළා ය.

ග්‍රීෂ්ම නිවාඩුව නිමිත්තෙන් පාසල වසා තිබුණි. ඈ නිල් වන් අලුත් ගවුමක් ඇඳ සිටියා ය. රෝස පාට කඩදසිවල එතූ සීනි බෝල කිහිපයක් ගවුම් සාක්කුවේ රුවා තිබුණ.

හදිසියේ දුවගෙන ආ දඟකාර කුඩා පිරිමි ළමයෙක් මොන ම හේතුවක් වත් නැතිව ඇගේ බෝලයට පහරක් දුන්නේ ය. බෝලය වේගයෙන් ගොස් විදියේ එහා පැත්තේ අවුලා කමින් සිටි ගේ කුරුලු රංචුවක් මැදට වැටී යළි උඩ ගොස් බිත්තියක වැදී පෙරළී ගොස් කණුවක හැපී නැවතුණේ ය.

"........දෙනවා එකක්......." කැතී දබර ඟිල්ල පෙන්වා ළමයාට තරවටු කළා ය. ඔහු සිය ආච්චිගේ සායට මුවා වී අත මිට මොළවා ඈට උරුක් කෙළේ ය.

"බය ගුල්ලා! බය ගුල්ලා!"යි ඔහුට ඔච්චම් කරමින් කැතී බෝලය පසු පස දිව්වා ය. එය අවුලා ගැනීමට පාත් වුණු ඈ විස්මයෙන් මුව අයා ගෙන නැවතුණා ය.



කැතී සහ කිඹුලා

කිරි මෙන් සුදු හාවෙක් එක එල්ලේ ඈ දෙස බලා සිටී! උගේ මඳ රතු ඇස් ඇගේ ඇස් දෙසට යොමු වී තිබිණ. උගේ සිඟිති තොල් ඈට රහසක් කියන්නාක් මෙන් සැලිණ. පිට දිගට විහිදුවා ගත් දිගටි කන් ඇති තව හාවෙක් ඌට පිටුපසින් උන්නේ ය.

හාවුන් සිටියේ කූඩුවක් ඇතුළේ ය. කූඩුව ගෙයක ආලින්දයට ගොඩ වෙන පඩි පෙලේ පහළ ම පඩිය මත තුබුණේ ය. දෙ වැනි පඩියෙහි තව කූඩුවක් විය. එය තුළ සිටි කහ තිත් සහිත කළු පාට කුරුල්ලෙක් හිස ඔසවා දෙපැත්තට වනමින් කැතී දෙස ඕනෑකමින් බැලී ය.

ඉහළ ම පඩියෙහි දෙමනසින් බර වූ මුහුණ ඇති කුඩා පිරිමි ළමයෙක් විය. ඇස් ඔරවා ගෙන එක එල්ලේ ඉස්සරහ බලා ගෙන සිටි ඔහුගේ උකුළ මත කහ පාට හිස් සපත්තු පෙට්ටියක් තුබුණේ ය. "ඉක්මන් ගමන්" යන වචන වෙළඳ ලකුණත් සමග පෙට්ටියේ මුද්‍රණය කොට තිබිණ. එය මුදුනේ දිගටියට කැපූ පොඩි සිදුරක් විය. ඇතුළේ මොකෙක් දෝ පහුරු ගාන හඬක් ඇසිණ.

ළමයාගේ පා මුල ද දිග ලී පෙට්ටියක් විය. ඒ මතු පිට රතු පාටින් මුද්‍රණය කර තුබූ අකුරුවලින් එය ලී පන්දු කෙළියට අවශ්‍ය උපකරණ දැමීමට ගන්නා පෙට්ටියක් බව දැක්විණ.

කැතී බුම්මාගෙන සිටිය ළමයා දෙස හොරහින් බැලුවා ය. සැබවින් ම ඈ විසින් කළ යුතු ව තුබූ හොඳ ම දෙය බෝලය අවුලා ගෙන තමන්ගේ පාඩුවේ යාම ය. එහෙත් හාවෝ එසේ යාමට සිත් නොදෙන තරම් සුන්දර සත්තු ය. තව ද සපත්තු පෙට්ටියේත් ලී පෙට්ටියේත් මොනවා ඇත්දැයි කාට කිව හැකි ද? අනෙක් අතට මේ සතුන් හැම දෙනා ම ගෙයින් පිටත මහ පාර අයිනේ ඉන්නේ කවර හෙයින් ද?

මේ සියල්ල දැන ගෙන මිස තමාට මෙතැනින් යා නොහැකි බව කැතීට හැඟිණ. එහෙයින් ඈ ළමයා දෙස බලා ගත් වන ම ටික වේලාවක් සිටියා ය. ඔහු තවමත් ඇසිපිය නොහෙළා බලා ගත් අතේ බලා ගෙන සිටියි.

කැතී ඇඟිලි තුඩුවලින් ඇවිදිමින් හාවුන්ට ළං වී එකකුගේ රෝස පාට නාසයට ඇඟිල්ලක් කිට්ටු කළා ය.

"එපා උන් අල්ලන්න!" ළමයා ඒ පැත්ත වත් නො බලා ම කැතීට කඩා පැන්නේ ය.

කැතී සහ කිඹුලා

"අනේ ! එක සැරයක්" කැතී යාප්පුවෙන් කීවා ය.

"අහකට යනවා" ළමයා සැරෙන් කීය.

කිසිවක් කීමට කැතීට ඉඩක් ලැබෙන්නට පෙර සපත්තු පෙට්ටියේ කැපුම තුළින් සර්පයකුගේ හිසක් බඳු හිසක් පිට වී, ඒ මේ අතට නැමී යළි ඇතුළට ඇදුණේ ය.

"අපොයි ! අපොයි ! නයෙක් !" කැතී විස්මයෙන් කෑගෑවා ය.

"ඔයයි නයා !" ළමයා යළිත් කඩා පැන්නේ ය. ඔහුගේ වචන ගොරෝසු වුවත් කට හඬෙහි මුලින් තරම් තරහ ගතියක් නො වී ය. කැතීගේ විස්මය දකීමෙන් සන්තෝෂයට පත් වූ ඔහු පියනේ කොණක් එසවී ය.

ඇතුළේ වූ යේ ඉබ්බෙකි!

ඉබ්බා, සර්ප හිසක් වැනි උගේ හිසෙන් සන කඩදසි පෙට්ටිය තෙරපමින් ද එය හූරමින් ද ඉන් පිට වෙන්න තැත් කෙළේ ය. උගේ උල් වූ කුඩා වලිගය සිනහ උපදවන අයුරින් කටුවෙන් පිටට නෙරා තිබිණ.

පුදුමයට පත් කැතී "ඔහ්! " කියමින් ඉබ්බා වෙතට කිට්ටු විය. එහෙත් එසේ කිරීමේ දී පය පැකිළී ඈ ලී පෙට්ටිය උඩ ඇද වැටුණා ය. ළමයා ඇගේ අතින් අල්ලා එසවී ය.

"පරෙස්සම් වෙන්න! මැරෙන්න ද හදන්නෙ? යන්න ඔයා යන දිහාවක" ඔහු කෑගැසී ය.

එහෙත් කැතීට නම් දැන් කොහොමවත් යන්නට බැරි ය. ලී පෙට්ටිය ඇතුළේත් කිසියම් දෙයක්-කිසියම් භයානක දෙයක් ඇති බව දැන් ඈට සහතික ය. ඈ ලී පෙට්ටියේ ලිස්සන සුලු පියන දෙස යළිත් බැලුවා ය. එහෙත් ඇතුළේ කුමක් ඇද්දැයි නොදකිය හැකි තරම් එහි සිදුර කුඩා ය.

ලී පෙට්ටිය ඇතුළේ කුමක් ඇද්දැයි ළමයාගෙන් අසන්නට කැතීට සිතිණ. එහෙත් ඒ සමඟ ම ඔහු තමා කෙරෙහි අමනාපයෙන් සිටිතැයි ද තම ප්‍රශ්නවලට උත්තර දෙන එකක් නැතැයි ද ඈට හැඟුණ නිසා ඈ ඒ සිතුවිල්ල මැඩ ගත්තා ය.

මොහොතක් කල්පනා කළ කැතී අඩියක් පස්සට ගෙන ළමයාට ද ඇසෙන සේ තමාට ම මෙසේ කියා ගත්තා යඃ

"එයා නිකං ගණන් තග්ගන්න හදනවා. ලී පෙට්ටියේ ඇති භයානක දෙයක් නැහැ. බාගෙද කාඩ්බෝඩ් පෙට්ටියෙ තවත්

ඉක්මන් ගමන් කාරයෙක් වෙන්න ඇති!"

ඔහුට කීමට සුදුසු තවත් ඇනුම් පද ගැන කැතී සිතුවා ය. ඔහු හැකි තරම් කුප්පන්නට ඇට ඕනෑ විය. එහෙත් ඔහු උගුර පාද උර හිස් මදක් හැකුළුවා පමණි.

ඔහුට ටිකක් වත් කේන්ති ගොස් ඇතැයි කැතීට සිතිණ. ඈ ගැඹුරු හුස්මක් ගෙන ඔහුට සරදම් කළා ය.

"අනේ බලන්න, මම කොච්චර බය උණා ද? ඔයා ඔය ලී පෙට්ටියේ දගෙන ඉන්නෙ කොටියෙක් වෙන්න ඇති! නැත්නම් පිඹුරෙක්! ඒත් නැතිනම් කිඹුලෙක්!"

"කිඹුලෙක් තමයි" ළමයා ශෝකී ලෙස ම කීවේ ය.

කැතී සාවඥ ලෙස හොඳට ම සිනා සුණා ය.

"වෙන්න බෑ-උඹ සිංහයෙක්!"

"නෑ කිඹුලෙක්" ළමයා යළිත් කීය.

"ඔයාට ලැජ්ජ නැද්ද ඔහොම බොරු කියන්නෙ?"

"බොරු ? මේ බලන්න" කියමින් ළමයා පියන ඉස්සුවේ ය. පෙට්ටිය ඇතුළේ පණ පිටින් කිඹුලෙක් විය.

2

අවුරුදු පහකට පෙර මිත්‍යා පාසලේ පළමු වැනි පංතියේ සිටිද්දී පුංචි නැවක කප්පිත්තකු වූ ඔහුගේ පියා අප්‍රිකාවේ සිට ගෙදර එන ගමන් පිඟන් මැටියෙන් සැදුවාක් වැනි අරුම පුදුම බිත්තරයක් රැගෙන ආවේ ය.

එය කුමන සතකුගේ බිත්තරයක් ද කියා හෝ එය රැක්කවිය හැකි ද කියා හෝ අනෙකෙක් තබා මිත්‍යාගේ පියා වත් නො දැන සිටියේ ය. එහෙත් ඔවුහු සෙල්ලමට මෙන් පෙට්ටියක් ගෙන එහි කපු පුළුන් අතුරා බිත්තරය තැන්පත් කර උණුසුම් රේඩියේටරය යටින් තැබූ හ.

පෙට්ටිය කොතරම් දීර්ඝ කාලයක් එ තැන තුබුණි දැයි කිවහොත් සේවිකාව වූ ඇනා කීප වතාවක් ම එය ඉවත වීසි කරන්නට ද සැරසුණා ය. දිනක් මිත්‍යා කාමරයට පැමිණි විට පෙට්ටිය තුළ හිස් බිත්තර කටුවක් තිබෙනු දුටුවේ ය. තව දුර සොයා බලන විට තරමක කටුස්සකුට හුරු වූ ද තරමක් සුරංගනා කථාවල එන මකරකුගේ රූපයට හුරු වූ ද පුංචි සතෙක් රේඩියේටරය යට සිට සොයා ගන්නා ලදී.

ඌ කිඹුල් පැටියෙක් විය.

"අප්‍රිකාවෙන් අමුත්තෙක්" යන ශීර්ෂ පාඨය යටතේ ළමයින්ගේ පුවත් පත මේ සිද්ධිය සම්බන්ධයෙන් විශේෂ ලිපියක් පළ කෙළේ ය. මිත්‍යා කිඹුල් පැටියා සමග සිටිද්දී ගන්නා ලද ඡායා රූපයක් ද ලිපිය සමග පළ විය. මේ ලිපිය පත්‍රයෙන් කපා වෙන් කර ගත් මිත්‍යා ගේ මෑණියෝ එය අත් බෑගයේ දමා සුරැකි ව තබා ගෙන සිය මිතුරන්ට ආඩම්බරයෙන් පෙන්වූ හ.

මිත්‍යාගේ පාසල් යහළුවෙක් වූ චුකොව්ස්කිගේ පොත් සියල්ල ද මිලි මීටර් 16 කැමරාවක් ද කිඹුල් පැටියා වෙනුවට හුවමාරු

කිරීමට කැමැත්ත පළ කෙළේ ය. එහෙත් මිත්යා යෝජනාව ප්‍රතික්ෂේප කෙළේ ය. මිත්යාගේ මවු ද කිඹුල් පැටියාටත් ඌ නිසා ඇති වූ කෞතුක ප්‍රබෝධයටත් අතිශයින් කැමැති වූවා ය. අමුත්තකුට ඌ පෙන් වූ සැම විටක ම ඈ මෙසේ කීවා ය.

"අපි ඌ ඇති කරනවා. ගෙදරක කිඹුල් පැටියෙක් ඉන්න එක කොයි තරම් විනෝදයක් ද?"

කිඹුලා ගැන අකැමැත්තෙන් සිටි එක ම තැනැත්තිය ඈනා ය. කිසියම් හේතුවක් නිසා ඈ ඌට මීයන්ටත් වඩා භය වූවා ය. ඌ නපුරු හොල්මනකැයි ඈ කීවා ය.

හොල්මන මොකක් වගේ දැයි මිත්යා ඇසූ විට ඈ මෙස් කීවා ය. "හරියට ඔයාගෙ මළ යකා වගෙයි."

ටිකින් ටික කවුරුනුත් කිඹුලාට පුරුදු වූ නිසා මිනිස්සු ඌ බලන්නට ඒම නැවැත්වූ හ. ගෙදරක සුරතලයට ඇති කරන අනෙක් ඕනෑම සතකුට වඩා අමුත්තක් කවුරුත් ඌ ගැන නො දැක්වූ හ. ඌ රිසි සේ ගේ හැම තැන බඩ ගෑවේ ය; පළමුවෙන් මුහුණ සෝදන බේසමේ ද පසු ව නාන බාල්දියේද පීනුවේ ය.

කිඹුල් පැටියා ප්‍රමාණයෙන් වැඩෙන්නට වැඩෙන්නට මිත්යාගේ මවු ඌට දක් වූ ආශාව ටිකින් ටික අඩු කළා ය. මෙය මිත්යාට ලොකු හිරිහැරයක් විය. වරෙක ඌ මවගේ අලුත ගෙනා නයිලෝන් මේස් ජෝඩුව හප කර දැම්මේ ය. වරෙක විදුලි මීටරය ගණන් ගන්නට ආ තරුණිය ගෙයි අඳුරු මුල්ලක සිට තමා දෙසට බඩගා එන අස්වාභාවික සත්ත්වයකු දැකීමෙන් හටගත් කම්පනය නිසා මුසපත් වන්නට ම ගියා ය.

තවත් වරෙක ඈනා ගෙබිම අමදිමින් සිටියදී කිඹුලා ඇගේ කකුල හැපුවේ ය. මේ සියල්ල මිත්යාගේ වරදින් සිදු නොවූ බව සැබෑ වුවත් සියලු දෙස් ආවේ ඔහු පිටට ය. කිඹුලා නිසා ඇති වූ කරදර හිරිහැර සියල්ල විස්තර කිරීමට ගියොත් මේ කථාව තව ඉතා දිග එකක් වනු ඇත.

කෙසේ වුවත් නියම හිරිහැරය ඇරඹුණේ පසුගිය සරත් සෘතුවෙහි දී ය.

මිත්යා පස් වැන්නට සමත් විය. මේ සිද්ධිය සිහිපත් වීම සඳහා පියා "බ්‍රෙම්" ගේ සත්ත්ව ජීවිතය නම් පොතක් ගෙනවුත් තෑගි කෙළේ ය. මිත්යා කිඹුලන් ගැන පොතෙහි වූ සෑම තොරතුරක් ම කියෙව්වේ ය. තමාගේ කිඹුලා නයිල් කිඹුල් ගණයට අයිති බවත් ඒ ගණයෙහි කිඹුලන් දකුණු ලිම්පොපෝවෙහි හමු වන යෝධ මැඩගස්කර වර්ගයට බෙහෙවින් සමාන බවත් සිය මවට පැහැදිලි කර දීමට තරම් හෙතෙම මෝඩ විය.

ලිම්පොපෝ යන්න මිත්යාගේ මව කෙරෙහි කිසි යම් හැඟීමක් ඇති කරවීමට සමත් නො වී ය. එහෙත් "යෝධ" යන වචනය ඇසුණ වහා ම ඈ සුදුමැලි වූවා ය.

එද රෑ මිත්යා නින්දට ගිය හැටියේ ම ඈ බ්‍රෙම්ගේ පොත ගෙන එහි "සන්නද්ධ උරගයෝ" යන පරිච්ඡේදය පෙරළුවා ය. ඇයට තමා සොයන කාරණය සම්බ වීමට වැඩි වේලාවක් ගත නො වී ය.

"පැතලි අඩිය සහිත ඔරුවලින් ගිය ස්වදේශිකයන් කිඹුලන් විසින් අල්වා ගන්නා ලද අවස්ථා රාශියක් විය........."

"හරියට මම හිතපු දේ ම යි" යනුවෙන් තොල් මතුළ ඈ තව දුරටත් කියවා ගෙන ගියා ය.

".......... මෙසේ අල්ලා ගන්නා ලද මිනිසුන් සවස් කාලයේ හෝ රාත්‍රියේ හෝ ගං ඉවුරේ පාලු තැනකට ගෙන යන මොවුහු බිය සැක නැති ව කා දමති."

"අපොයි, දෙය්යනේ ! කවද හරි නින්දෙන් ඇහැරෙන කොට අපිත් කිඹුල් කටේ හිර වෙලා සිටින බව පෙනේවි!" ඈ සංවේගයෙන් කෑ ගැසුවා ය.

"නයිල් කිඹුල්ලු" යන පරිච්ඡේදයට පැමිණි ඈ සමහර එවුන් අඩි 30 ක් පමණ දිගට වැඩෙන බව කියවා, පොත හඬ නැඟෙන සේ වසා දමා අසුනෙන් ඉවතට පැන ටේප් පටියක් ගෙන ඉතා ඕනෑ කමින් කාමරයෙහි දිග මැන්නා ය. සාලයත් එක්ක ම කාමරය අඩි 21 ක් විය.

"කොටින් ම බිත්තියත් කඩන්න වේවි. සතා වලිගය අල්ලපු ගෙටත් දමාවි. යස වැඩේ !" මිත්යාගේ මව කෙඳිරි ගෑවා ය. එද රෑ

මොහොතක් වත් නො නිද ගත කළ ඈ පසු දට එලි වුණ හැටියේ, කිඹුලා ගෙදරින් පිට කරන්නට මිත්‍යාට අණ කළා ය.

හොඳ ම ජීව විද්‍යාඥයන් මේ අඩි 30 අතිශයෝක්තියක් වශයෙන් සලකන බව අම්මාට ඔප්පු කිරීමට බ්‍රෙම්ගේ පොතේ ද උපකාරය ඇති ව මිත්‍යා උත්සාහ කළ මුත් එය නිෂ්ඵල විය. ගණන් මිනුම් වැරදි නම් බ්‍රෙම් එවැන්නක් කිසි සේත් නො ලියති යි ඈ තරයේ කියා සිටියා ය.

කිඹුලකු අඩි 30 ක් දිගට වැඩීමට අඩු ගණනේ අවුරුදු සියයක් ගත වන බව සඳහන් කොටස මිත්‍යා ශබ්ද නඟා කියෙව්වේ ය. එහෙත් පොත විප්ලවයට කලින් මුද්‍රණය කරන ලද්දක් බවත් ඒ නිසා පොතේ මතය යල් පැනපු එකක් බවත් මවු කීවා ය.

ඉන් පසු සෑම ද ම ඈ ටේප් පටියෙන් කිඹුලාගේ දිග මැන්නා ය. දවසක් ඌ ඇගේ අතේ ඇඟිල්ලකින් ටිකක් කඩා ගන්නට තැත් කරන තුරු මැනීම නොකඩවා කෙරිණ. එදට පසු ඈ උගේ දිග මැන්නේ ඇසිනි. කිඹුලා දෙස බලන සෑම වරෙක ම ඌ දිගින් තවත් අඩියක් පමණ වැඩී ඇතැයි ඈට සිතිණ.

වසන්ත ඍතුවේ දී කරුණු තවත් නරක අතට හැරුණේ ය.

ග්‍රීෂ්ම ඍතුවේ පාසල් වාරය අවසානයේ දී මිත්‍යාගේ පාසල අලුත්වැඩියා කිරීමට පටන් ගත්තා ලදී. සිසුන් විසින් තමන්ගේ සත්ත්ව විද්‍යා පාඩම් සඳහා රැස් කරන ලද සතුන් අලුත්වැඩියා කරනු ලබන ගොඩනැගිල්ලේ තබා ගත නොහැකි විය. ඒ නිසා ළමෝ ඊළඟ වාරය එනතුරු රැක බලා ගැනීම සඳහා ඒ සතුන් තම තමන්ගේ ගෙවලට ගෙන ගියහ. මිත්‍යා හාවුන් දෙදෙනකු සහ ඉබ්බකු ද "හලෝ" සහ "පෙරට යා" යන වචන උච්චාරණය කිරීමට හැකි සැළ ලිහිණියකු ද බාර ගත්තේ ය.

කිඹුලා නිසා ඇති වූ අපමණ හිරිහැරවලින් පසු ව මේ අලුත් සතුනුත් ගෙදරට වැද්ද ගැනීමට මිත්‍යාගේ මවු සහ ඇනා ඇබිත්තක් වත් සතුටු නො වූ හ. කථා කරන සැළ ලිහිණියා තවත් හොල්මනකැ යි ඇනා තරයේ කියා සිටියා ය. තමා සත්ත්වෝද්‍යානයක් තුළ ජීවත් විය යුතු මන්දැයි තමාට නොතේරෙන බව මවු කීවා ය.

ඈ වහා ම සිය තොප්පිය සහ අත් බෑගය රැගෙන ප්‍රධානාචාර්ය තුමා හමු වීම සඳහා යන්නට පිටත් වූවා ය. එහෙත් මිත්‍යා

පොරොන්දු දෙකක් දී ඈ නවතා ගත්තේ ය. පළමු වැනි පොරොන්දුව පාසල පටන් ගත් විට අනෙක් සතුන් සමග කිඹුලා ද පාසලට බාර දීම ය. දෙ වැන්න මවුට අයිති කිසි ම බඩුවක් මින් පසු කිඹුලා විසින් නාස්ති නොකරන බවට මිත්‍යා වග බලා ගැනීමට ය. ඒ වෙනුවට අගොස්තු 31 වැනි ද වන තුරු සතුන් ගෙදර තබා ගන්නට ඉඩ දීමට මවු පොරොන්දු වූවා ය.

එහෙත් එද උදේ ඇති වූයේ සංවේගදයක සිද්ධියකි.

මිත්‍යාගේ මවු, ඇනා සහ මිත්‍යා උදය ආහාරය ගනිමින් උන් හ. ඇනා කිරි පෝච්චිය ගෙන තමාගේ කෝප්පයට කිරි වත් කර ගනිද්දී හදිසියෙන් ම කෝප්පය පසෙකට ලිස්සා ගොස් මේස රෙද්ද පුරා කිරි ගලා ගියේ ය. මිත්‍යා දෙස නපුරු බැල්මක් හෙළූ ඇනා "මේ මොකද ?" යි කෑගැසුවා ය. සීනි බෝතලය සහ ජෑම් භාජනය මේස රෙද්දත් සමග ඇදී ගියේ ය. තමාගේ කෝප්පය සහ පාන් පිඟාන බේරා ගැනීමට ඇනාට යන්තමින් ඉඩ ලැබිණ. මේස රෙද්ද පණ ඇති දෙයක් සේ මේසයට උඩින් ඇදී ගියේ කෑම බඳුන් සියල්ල මහ හඬින් බිම පෙරළමිනි.

මිත්‍යාගේ මවු රෙද්ද කොනකින් අල්ලා ආපසු ඇද්ද ය. පෙරළුණු කෝප්පවලින් තේ වතුරු ඉහිරිණ. භාජනය තුළින් ජෑම් වැගිරිණ. ඈ මේස රෙද්ද ගස්සා තදින් ඇද්ද ය. දත්වලින් රෙද්ද තරයේ ඩැහැ ගත් කිඹුල් හොම්බ මේසයේ අනෙක් කෙළවරින් මතු විය.

"මේක පිස්සත් කොටුවක්." මවු බිරුසත් දුන්නා ය.

"මම යනවා ගෙදර යන්න." ඇනා මොර හඬ නැඟුවා ය.

"හලෝ !" සැළ ලිහිණියා උගේ කූඩුවේ සිට ප්‍රීතියෙන් හඬ නැඟී ය.

හරියට නියම වේලාවට කරන ලද මේ සමාචාරය නිසා මවගේ ඉවසීමේ සීමාව ඉක්මිණ.

"මුන් එලෝල දන්න ඕනෑ. ඔව්! ඔක්කොම යවන්න ඕනෑ" ඈ සැරෙන් කීවා ය.

"මොකද ඔක්කොම ? හාවුන්ගෙ වැරැද්දක් නෑ. ඉබ්බගෙත් නෑ. මොකද උන් කළේ ?" මිත්‍යා හරස් විය.

හදිසියේ ම ඇනා මහ හඬින් කෑගසා මවුගේ ඔප දැමූ හම්

සපත්තුවක් මේසය යටින් ඇද ගත්තාය ය. ඉන් බාගයක් කිඹුලා කා තිබිණ.

"මම තව මොහොතක් මුන් මෙතන තියා ගන්න ඉඩ දෙන්නෙ නෑ" මවු ස්ථිර ලෙස කීවා ය.

"ඔව්, එක්කො උන් - නැත්නම් මම !"

3

මේ කණගාටුදයක කතන්දරය ඇසීමෙන් පසු මිත්‍යා සහ ඔහුගේ ඉන්ට හිටින්ට තැනක් නැති සතුන් හැම දෙනා කෙරෙහි ම බළල් පැටියකු නො වී කිඹුලකු ව ඉපදීම ගැන කිසි සේත් දෙස් පවරන්නට බැරි කිඹුලා කෙරෙහි පවා - කැතී අනුකම්පා කළා ය.

ඈ සිය සාක්කුවෙන් සීනි බෝල රැගෙන මිත්‍යාට දුන්නා ය. ඔහු කිසි සතුටක් නො දක් වා ඒවා කටේ ඔබා ගත්තේ ය.

"මොකද දූන් ඔයා කරන්ට යන්නෙ ?" කැතී ඇසුවා ය.

"දන්නෙ නෑ. මම කල්පනා කරනවා" මිත්‍යා කීවේ ය.

කැතී කෙළින් සිට යුගත් පපුව මත බැඳ ගෙන මෙසේ කීවා ය.

"මේ අහන්න ! මම දන්නවා කරන්න ඕන දේ. උන් ටික මට දෙන්න! මම උන්ව පරිස්සමින් බලාගන්නම්. ඇත්තමයි. මට පුළුවන්, මම උන්ව හොඳ හැටි බලාගන්නම්. අනේ, මට උන් දෙන්න !"

ඈ අමාරුවෙන් හුස්ම ගනිමින් බලාපොරොත්තු සහිත ව බලා ගෙන සිටියා ය. මිත්‍යාගෙන් පිළිතුරක් ලැබීමට බොහෝ වේලා ගත විය. අන්තිමේ දී ඔහු මෙසේ කීවේ ය.

"ඔයාගෙ අම්මල තාත්තල කැමති වේවි ද කියල කොහොම ද දන්නෙ ?"

"ඕ ! ඒ ගොල්ලො කැමති වේවි. ඇරත් ඒ ගොල්ලො අද ගෙදරත් නෑ" කැතී සතුටින් කීවා ය.

"ගෙදර පුංචි ගෑණු ළමයි හෙම ඉන්නවාද ?"

"පුංචි ගෑණු ළමයි !"

"ඔව්, ඒ ගොල්ලො නිතර ම පුංචි සත්තුන්ගෙ ඇස්වලට ඇඟිල්ලෙන් අනිනවා. ඒ ගොල්ලො මගේ සත්තුන්ටත් හිරිහැර

කරල මරා දමාවි. මටයි ඒවට උත්තර දෙන්න වෙන්නෙ."

කැතී බියට පත් වූ නමුත් ඇත්ත කීවා ය.

"මගේ නංගි ඉන්නව - මියෙල්කා. ඒත් එයා යනව ළදරු පාසලට. එයා එනකොට හවස් වෙනව. ඇරත් උන්ට වද දෙන්න මම එයාට කීයටවත් ඉඩ තියන්නෙ නෑ."

මිත්‍යා නැවතත් කල්පනාවට වැටුණේ ය. කැතී බලා ගෙන සිටියා ය. ඇට සිය බලාපොරොත්තු අත් හැර දැමීමට සිදු වෙතැයි සිතෙන තරම් වේලා ඔහු කල්පනා කෙළේ ය.

අන්තිමේ දී මිත්‍යා කථා කෙළේ ය.

"හොඳයි, මේකයි අපි කරන්න යන්නෙ. මුළු නිවාඩු කාලයට ම උන් ඔයාට දෙන්න මට බැහැ. මට අයිතියක් නැහැ. සතුන් අයිති පාසලට යි. ඔයා පිට කෙනෙක්..........."

කැතී සුසුමක් හෙළුවා ය.

"............. ඒ උනත් මම උන් ඔයාට දෙන්නම් අද හැන්දෑව වෙන කල්. මම ගොහින් නිවාඩුවක් ගත කරන්න පිටිසරට ගිය අපේ යාළුවෙක් හමු වෙලා එන තෙක් ඔයාට උන් බලා ගන්න පුළුවනි."

කැතී ප්‍රීතියෙන් පිනා ගොස් හඬ නගා සිනා සුණා ය.

"ඒත් පරිස්සම් වෙන්න. මොවුන් මහජනයාට අයිති - රජයේ දේපල බව අමතක කරන්න එපා" මිත්‍යා අවවාද කෙළේ ය.

"මම අමතක කරන්නෙ නෑ" සිය යුගත් පපුවට තද කර ගනිමින් කැතී පොරොන්දු වූවා ය.

"ඔයා දන්නවද, රජයේ දේපල ආරක්ෂා කළ යුතු කොහොම ද කියා ?"

"කොහොම ද ?"

"ඔයාගෙ පණ වාගෙ."



"ඔව්, මම දන්නවා මේ සතුන් මහ ජනයාට අයිති - රජයේ දේපල බව. මම උන් මගෙ පණ වාගෙ ආරක්ෂා කරනවා."

"අපි ලියමු සත්තුන්ගෙ ලැයිස්තුවක්. ඒකට ඔයා අත්සන් කරන්න ඕනෑ. ඒකට කියන්නෙ කුවිතාන්සිය කියලයි."

කැතී සෑම කොන්දේසියකට ම එකඟ වූවා ය.

මිත්යා කිඹුලා සහිත ලී පෙට්ටිය හිසට ගෙන හා කූඩුව අතින් එල්ලා ගත්තේ ය. කැතී බෝලය දකුණතින් ද සැළ ලිහිණි කූඩුව වමතින් ද ගෙන ඉබි පෙට්ටිය කිහිල්ලේ රඳවා ගත්තා ය.

ඔවුන්ට පසු කරන්නට තිබුණේ වීදි දෙකකි. මේ නිසා යාමට වැඩි දුරක් නො වී ය. එහෙත් මඟ දී හමු වුණු දන්නා හඳුනන හැම දෙනාට ම ඔවුන් නවතා හාවුන් සහ සැළ ලිහිණියා බලන්නටත් උන් ගැන තොරතුරු දැනගන්නටත් ඕනෑ විය. එහෙයින් ගමන මඳක් පමා විය.

අධික සන්තෝෂය නිසා නැඟී එන සිනාව මැඩ පවත්වා ගැනීම සඳහා කැතී සිය තොල් තද කර ගෙන ගමන් කළා ය. ඈ තට්ටු නිවාසයේ මිදුලට ඇතුළු වන විට ම කුඩා දැරියක් ඔවුන් කරා දුව ආවා ය.

"කැතී, අපි බෝල ගහමු. මම යි මුලා !" දැරිය කීවා ය.

කැතීගෙන් පිළිතුරක් නො ලැබිණ. දැරිය ඔවුන් පස්සේ වැටුනා ය. ඈ පෙට්ටිවලටත් කූඩුවලටත් එබිකම් කරමින් ඒවා ඇතුළේ කුමක් ඇද්දැයි දැනගැනීමට උත්සාහ කළා ය.

මියෙල්කාගේ යෙහෙළිය වූ ඔල්ගා මිදුලේ සෙල්ලම් කරමින් සිටිනු දුටු කැතී ඈ අමතා මෙසේ කීවා ය.

"ඔල්ගා ! මගේ සත්තුන්ට අත තියන්න වත් එපා. උන් රජයට අයිති දේපල."

ඔල්ගා කට බලියා ගෙන ඇස් ඔරවා ගෙන බලා සිටියා ය.

කැතී සහ මිත්යා තට්ටු නිවාසයේ තුන් වැනි තට්ටුවට නැංගාහ. ඔවුහු කැතීගේ ගෙයි දෙරකඩ ළඟ නැවතුණා හ. දෙරේ නාම පුවරුවක් විය.

යූ. පී. පැස්ටුෂ්කොව්

"මෙක තමයි" කියමින් කැතී නූලක ගැට ගසා සිය බෙල්ලේ එල්ලා ගෙන සිටි යතුරක් අතට ගත්තා ය.

හදිසියෙන් ම මිත්‍යාගේ මුහුණ නොසන්සුන් විය. ඔහු මෙසේ ඇසී යː

"ඔයාට සහතික ද ගෙදර කවුරු වත් නැති බව ?"

"ඔව් ඔව්, අම්මා ඈත ගමනක් ගිහින්. ආච්චි කඩ පොළට ගිහින්. තාත්තා නාට්‍ය පුරුදුකිරීමට ගිහින්. නංගී - මියෙල්කා ළදරු පාසලේ."

ඈ දෙර හැරියා ය. ඔවුන්ට පළමු ව ඇසුණේ වයලීනයක සිහින් හඬකි. මිත්‍යා කැතී දෙස නපුරු බැල්මක් හෙළුවා ය.

"තාත්තා ගෙදර ඉන්නවා වගෙයි. නාටක පුරුදු කිරීම කල් යන්න ඇති." කැතී පහත් හඬින් කීවා ය.

ඔවුන් පා ඇඟිලි තුඩුවලින් සාලය දිගේ යද්දි මිත්‍යා උපහාසාත්මක ලෙසින් "හ්ම් - ම්...." කීවේ ය. ආච්චිගේ සුදු බළලා අල්මාරිය මුදුනේ හිඳ ඔවුන් දෙස රවා ගෙන සිටියේ ය.

ඔවුහු කැතීගේ කාමරයට ගියහ. පොඩි දරුවන් සෙල්ලම් කිරීමට ගන්නා ලී කැබලි වගයක් බිම සීසීකඩ දමා තුබුණි. බිත්තියේ බට්ටා සහිත ලොකු ඔරලෝසුවක් 'ටික්' හඬ නැඟුවේ ය. ඔරලෝසුවේ මුහුණත බළල් පැටියකුගේ මුහුණක් ලෙසින් සාද තුබුණි. ඔරලෝසුවට යටින් තොටිල්ලක් විය. තොටිල්ලේ අවුරුදු පහක් පමණ වයසැති කුඩා දැරියක් නිද ගෙන සිටියා ය.

මියෙල්කා දුටු කෙණෙහි කැතී අන්දුන්කුන්දුන් විය. මේ වර මිත්‍යාගේ බැල්ම මුල් වාරයටත් වඩා දරුණු විය. ඈ විසින් තමා රවටා ඇති බව දුන් ඔහුට පැහැදිලි ය. ඈ සතුන් අයිති කර ගනු සඳහා තමාට බොරු කර ඇතැයි ඔහු සිතුවේ ය.

එහෙත් ඇත්ත වශයෙන් කැතී ඔහු රවටන්නට අදහස් නො කළා ය. එක් ළමයකු සරම්ප සෑදී පැමිණි නිසා ළදරු පාසල වසා දමා වසංගත රෝග වැළැක්වීමේ නීතිය උඩ වෙන් කර තබන ලද බවත් ඒ නිසා මියෙල්කා ගෙදර ආ බවත් ඈ දන්නේ කෙසේ ද ?

කැතී කුරුළු කූඩුව සහ ඉබි පෙට්ටිය බිම තැබුවාය ය. ඈ යළිත් යුගත් පපුව මත බැඳගෙන මිත්‍යාට කරුණු පැහැදිලි කිරීමට තමාගේ මුළු ශක්තිය ම යෙදුවා ය.

එහෙත් මිත්‍යා කිසිවකට ඇහුම්කන් දුන්නේ නැත. වැඩි දුර කතා නැති ව මෙතැනින් පිටත් ව යාමට ඔහු ඉටා ගත්තේ ය. ඔහු පෙට්ටි දෙක ද කූඩු දෙක ද උස්සා ගත් නමුත් ඉබ්බාගේ පෙට්ටිය ඔහු අතින් ගිලිහී බිම වැටුණි. එය අවුලා ගන්නට තැත් කරන විට කිඹුලාගේ

පෙට්ටිය මහ හඬින් බිම ඇද වැටුණි. එය යළි ඔසවා ගෙන කරෙහි තබා ගත් නමුත් අනෙක් පෙට්ටිය සහ කූඩු දෙක ම එක් අතකින් අල්ලා ගැනීමට ඔහුට නො හැකි විය.

කැතී සෙමින් ඉකි ගසන්නට වූවා ය.

මිත්‍යා ඇ දෙස ද අනතුරු ව කූඩු දෙස ද බලා මෙසේ කීවා ය.

"හා හොඳයි, ලියන්න කුවිතාන්සියක්."

කැතීගේ මුහුණට මඳ සිනාවක් නැගිණ. ඇ වහා ලියන මේසය වෙතට දුව ගොස් තමාගේ ගණිත සටහන් පොතෙන් කොළයක් කඩා, පෑන ගෙන එහි තලය ද පිස දැමුවා ය.

මිත්‍යා කියවන විට කැතී ලීවා ය. තීන්ත පැල්ලම් හෝ වැරදි හෝ නොසිටින සේ ලියන්නට ඇ බොහෝ පරෙස්සම් වූවා ය. අවසානයේ ඇ 'කැතී' යැයි අත්සන් කළා ය. එහෙත් මෙය රාජකාරි ලියවිල්ලක් නිසා ඇගේ සම්පූර්ණ නාමය වූ 'කැතරිනා' යනුවෙන් අත්සන් කළ යුතු බව මිත්‍යා කියා සිටියේ ය.

කැතී එසේ අත්සන් කොට පහත දැක්වෙන කුවිතාන්සිය මිත්‍යාට දුන්නා ය.

"සුදු හාවුන්	2 යි.
ඉබ්බන් (යුරෝපීය)	1 යි.
කතා කරන සැළ ලිහිණි	1 යි.
කිඹුලන් (නයිල්)	1 යි.

මා වෙත බාර දෙන ලද පාසලට අයිති ඉහත සඳහන් සතුන් කිසි හානියක් නො කර දැන් සිටින තත්ත්වයෙන් ම ආපසු බාර දීමට මෙයින් පොරොන්දු වෙමි.

කැතරිනා පැස්ටුෂ්කෝවා."

"සැළ ලිහිණියාට කියන්න පුළුවන් මොනවා ද?" කැතී ඇසුවා ය.

"නොයෙක් දේවල්" යි නොසැළකිලිමත් ලෙස කිවූ මිත්‍යා කුවිතාන්සිය ගෙන එහි තීන්ත උරවා හතරට නමා සාක්කුවේ ලා ගත්තේ ය. ඊට පසු ඔහු තව කඩදසි කැබැල්ලක් ගෙන කැතීට දුන්නේ ය.

"මේ මොකක් ද ?" කැතී ඇසුවා ය.

"හාවුන්ට දෙන කෑම වට්ටෝරුවක්" යි කී ඔහු ඉන් කීපයක් කියෙව්වේ ය.

"උන්ට පිදුරු දීලා ඇති......... ඩැන්ඩලියොන්......... පාර්ස්නිප් එහෙම නැද්ද ?"

"එහෙනම් උන්ට 'ඕට්' දෙන්න !"

"හොඳයි" කැතී කීවා ය.

"නාන බාල්දියක් තියනවද ?"

"ඔව්"

"කිඹුලා ඒකට දන්න"

මේ මොහොතේ තාත්තාගේ කාමරය දෙසින් ආ වයලින් නාදය නැවතිණ. මිත්යාගේ මුහුණ ඇඹුල් විය.

"මම යනවා. ගිහින් ඉක්මනින් එනවා. හොඳට බලාගන්න" කියමින් හෙතෙම පිට වී ගියේ ය.

"අනේ මම හොඳ හැටියට ම බලා ගන්නම්" කියමින් කැතී ඔහු ධෛර්යමත් කළා ය.

මිත්යා පේනතෙක් මානයෙන් ඉවත් ව යන තුරු ඔහු දෙස බලා සිටි ඈ දෙර වසා ආපසු පැමිණ සතුන් මද්ධ්‍යයෙහි සිට ගත්තා ය.

කැතී කිඹුලකු ඇතුළු දුර්ලභ සතුන් රංචුවක භාරකාරිය ලෙස සිටිනු ඇගේ පන්තියේ යෙහෙළියන් දුටුවොත් - ඔවුන් විස්මයෙන් ගොළු නොවෙත් ද ? විශේෂයෙන් ම .... ලිලී ! .... ඒ වාගේ ම........ තාන්යා......... එහෙත් ඇගේ එක් මිතුරියක් වත් ඈ දකින්නට මෙහි නැත. ඒ නිසා දැන් ම වැඩ පටන් ගැනීම සුදුසු බව ඈ සිතුවා ය.

ඈ කිඹුලා සහිත පෙට්ටිය නාන කාමරයට ගෙන ගොස් නාන බාල්දියේ කරාමය හැර පෙට්ටිය එයට ඇල කළා ය. කිඹුලා ඇගේ ඇඟ පුරා වතුර විසුරුවමින් බාල්දියට ඇද වැටුණේ ය. කැතී සිනා සුණා ය.

"අකීකරු ළමයා ! දඟ නැතිව ඉඳින්. මම ඉක්මනින් එනවා."

සැළ ලිහිණියාගේ කූඩුවෙහි වූ පැන් බඳුනට ඈ අලුත් වතුර ටිකක් වත් කළා ය.

සැළ ලිහිණියා "හලෝ!" කීවේ ය. කැතී සතුටින් සිනා සුණා ය.

ඈ ඉබ්බා පුංචි පෙට්ටියෙන් ඉවතට ගෙන දිග ලී පෙට්ටියට දමා "ඇවිදපන් දැන් ඕන තරම් ඉඩ තියෙන්නේ" කීවා ය.

ඈ ඕට් ටිකක් ගේන්ට සිල්ලර කඩේට යා යුතු ය. ඒත් මුදල් කෝ ?

ඇතැම් විට තාත්තාගෙන් මුදල් ටිකක් ඉල්ලා ගත හැකි වේ යැයි ඈට සිතිණ. එහෙත් එවිට ම තාත්තා ගේ කාමරයෙන් යළිත් වයලින් නාදය නිකුත් වීමට පටන් ගත්තේ ය. ඔහු දන් ශාස්ත්‍රීය සංගීතයේ "හීම ආලප" වාදනය කරයි. තාත්තා මේ ශාස්ත්‍රීය වාදනය පටන් ගත් වහාම පුංචි මියෙල්කා ඇවිදින්ට යාමට පිටත් කරනු ලැබේ. එවිට අනෙකෙක් තබා ආච්චි පවා ඔහුගේ කාමරයට යාමට තරම් එඩිතර නො වේ. මේ දුෂ්කර වාදනයෙහි යෙදී සිටින තාත්තාගේ අවධානය කැඩීමට තරම් කැතීට ධෛර්යයක් නැත.

ඈ මොහොතක් නැවතී කල්පනා කළා ය.

"ඕහ් ! මම වාගෙ මෝඩියක් !" යි තමාට ම කියාගත් ඈ රාක්කයක් වෙතට ගොස් සිය කාසි කැටය හැර ගත්තා ය. මැජික් ලන්තෑරුමක් මිළට ගැනීම සඳහා ඈ එකතු කළ මුදල් එහි තිබේ. කැටය සොලවා, ඇතැයි සිතෙන තරම් තඹ සහ නිකල් කාසි ඉවතට ගැනීමට ඈට සෑහෙන වේලාවක් ගත විය.

මේ අතර මියෙල්කා උන් හැටියේ ම සෙලවුණා ය. කැතී තිගැස්සුණා ය. මියෙල්කා සතුනුත් සමග ඉන්දදී ඈ ඉවත යන්නේ කෙසේ ද ? මියෙල්කා කෙරෙහි කොහොම වත් විශ්වාසය තබන්නට බැරි ය.

එහෙත් මොහොතකින් නැවතත් මියෙල්කාට තදින් නින්ද ගියේ ය. ඈ මේ වර ඉක්මනින් අවදි නොවන බව කැතීට සහතික ය. සිල්ලර කඩේට ගොස් ඕට් ගෙන ඒමට ඈට විනාඩි දහයකට වඩා ගත නො වේ. ඈ සල්ලිත් මිට මොලවාගෙන වේගයෙන් දිව්වා ය.

කැති සහ කිඹුලා

සිල්ලර කඩය එතරම් ඈත නො වේ. ඈට තිබුණේ බාබර සාප්පුව සහ කිරි පට්ටිය පසු කර "නැප්චූන්" සිනමා හල ළඟ හන්දියේ දී පාර හරහා යාම පමණකි. විනාඩි පහක දී කැති වෙළඳ හලේ කවුන්ටරය ඉදිරියේ සිටියා ය.

"කරුණා කර මගේ හාවුන්ට දීමට ඕට් ටිකක් දෙන්න !" ඈ කීවා ය.

"අපි ඕට් විකුණන්නෙ නෑ. ඕට් පිටි නම් තියනවා" වෙළඳ සේවිකාව පිළිතුරු දුන්නා ය.

"එහෙනම් ඕට් පිටි දෙන්න. මගෙ හාවෝ ඒවා කනවා. මගෙ ඉබ්බා ඕට් කන්නෙ නැහැ. මගෙ කිඹුලා ! - ඌ නම් ගෑණු සපත්තුත් හපනවා හරියට බාගෙට !"

වෙළඳ හලේ උන් හැම කෙනෙක් ම කැතී දෙස බලන්නට වූ හ. පාන් වළලු ටිකක් ඇමිණූ වැලක් දකුණු උරයෙහි දමා ගෙන මැකරෝනි පිරවූ කඩදසි ගොටුවක් වමතින් රැගෙන සිටි පුංචි පිරිමි ළමයෙක් ඉදිරියට ඇවිත් ගෑණු සපත්තු බාගෙට හපන්නී කැතී යැයි සිතා ගෙන මෙන් ඈ දෙස බලා සිටියේ ය. ඈ වෙළඳ හලෙන් පිට වන විට ම පිට වූ හෙතෙම පාන් වළල්ලක් හපමින් ඈ පසු පස යන්නට විය.

කැතී බොහෝ කලබලයෙන් ගමන් කළා ය. ඈ වීදිය හරහා දුව ගොස් සිනමා හල ළඟ හන්දියෙන් හැරුණා ය. සිනමා හලේ දොරටුව වෙත ගලා ගෙන යන මිනිස් වැලක් විය.

සිනමා හලට ඇතුළු වෙමින් සිටි තාන්යා හදිසියෙන් කැතීගේ ඇසට ලක් විය. තාන්යා කැතීගේ හොඳ ම යෙහෙළි ය ය.

"තාන්යා ! පොඩ්ඩක් ඉන්න, ඔයාට බඩුවක් කියන්න තියනවා" ඈ කෑගැසුවා ය. එතකොටත් තාන්යා ඇතුළේ ය.

ඈ කොහොම නමුත් තාන්යා හමු විය යුතු ම ය. නැත්නම් ඇගේ හොඳ ම යාළුවා ඈට ලැබී ඇති සතුන් ගැන දැනගන්නේ කොහොම ද? චිත්‍රපටි දර්ශනය අවසාන වූ පසු තාන්යා ඈ හමුවීමට එති යි සිතිය නො හැකි ය. ඈට ද තාන්යා හමු වන්නට යාමට කාලයක් නැත.

එයා අපූරු යාළුවා ! ගෙදර පණ පිටින් කිඹුලෙක් ඉන්දද්දී තමාගේ හොඳ ම යාළුවාට උගේ වල්ගා කොන වත් පෙන්නන්නේ නෑ ! කැතී මෙබඳු සිතුවිලි වලින් යුතු ව තාන්යා ලුහුබැඳ දිව්වා ය.

"කරුණාකර ඔබේ ටිකට්ටුව දෙන්න" යි කියමින් කැතී හඬ නැගූ නමුත් එහි වූ මහත් ගෝට්ටිය නිසා එය

තාන්යාට නො ඇසිණ.

මැකරෝනි සහ පාන් වළලු රැගෙන සිටි පුංචි පිරිමි ළමයා සිනමා හලේ දෙරටුව වෙත නැවතුණේ ය. ඔහුත් ඇතුළු වන්නට ගිය නමුත් අමුත්තන් පිළිගන්නා කාන්තාව ටිකට් ගැන ඇසූ විට කතා නැති ව එතැන බිත්තියට හේත්තු වී දෙවැනි පාන් වළල්ල රැහැනින් ගලවා ගෙන හපන්නට පටන් ගත්තේ ය.

අමුත්තන් පිළිගන්නා කාන්තාවට තමාගේ තැන අත්හැර කැතී පස්සේ දුවන්නට හැටියක් නැත. ඒ නිසා ඈ කලේ අතුරු ශාලාවේ පොදි කන සෙනඟ අතරේ කැතී ඇද්දූයි කර ඔසවා බැලීම ය. කැතී ද සෙනඟ දෙපසට තෙරපමින් බෙල්ල දික් කර තාන්යා සෙවූවා ය.

සීනුවක් නාද විය. සෙනඟ සිය ආසන කරා යාමට පටන් ගත් හ. කැතී ඈත අසුනක් කරා යන තාන්යා දුටුවා ය. ඈ එදෙසට දුව ගිය මුත් තදබදය නිසා පමා විය. තාන්යාගේ අසුන බිත්තිය අද්දර බව දුටු කැතී වදෙන් පොරෙන් එතැනට පැන ගත්තා ය.

"තාන්යා ! මට මිනිත්තුවයි තියෙන්නෙ ! ඔයා පස්සෙ එළවමින් කාලය නාස්ති කරන්නට මට බැහැ. මට හම්බ උනා සතුන් වගයක් -"

ඈ ඉතා වැදගත් තැනට එන විට ම විදුලි පහන් නිවිණ.

"ස් - ස් වාඩිවෙන්න" යි පසු පස ආසනවල හුන් අය කෙඳුරූ හ.

දැරියෝ දෙදෙනා ම එක් අසුනක වාඩි වූ හ. ඉක්මනින් ම දෙපැත්තේ අසුන්වල වාඩි වී හුන් අය නිහඬ වන ලෙසත් සන්සුන් වන ලෙසත් ඔවුන්ට තදින් අවවාද කරන්නට වූ හ.

තාන්යා අසුන මත වාඩි වී ඉඳිද්දී කැතී බිත්තිය අයිනේ ඈන තියාගෙන යුහු යුහු ව සිය කතන්දරය කීවා ය. ඉදිරියෙහි වාඩි වී හුන් මිනිහා දැරියන්ගේ කරච්චලය නිසා තමාට කිසිවක් නෑසෙන බව කියන්නට පටන් ගත්තේ ය. එහෙත් ඔහුට ඇසෙන්නට එහි කිසි දෙයක් නො වී ය. තව ම තිරයෙහි වැටෙන්නේ නළු - නිළියන්ගේ සහ නිෂ්පාදකයන්ගේ නම් පමණකි.

මේ වන විට තාන්යා සියල්ල අවබෝධ කර ගත්තා ය.

"කිඹුලෙක් !............... කතා කරනවා ? .... එහෙනම් යමු !"

නරඹන්නන්ගේ කකුල්වල ගැටෙමින් ගමන් කළ ඔවුහු ශාලාවෙහි පසෙක අසුන් පනවා නැති කොටසට යන්තමින් පැන ගත් හ. ඔවුන් එසේයන විට නරඹන්නෝ "ස් - ස්" යනුවෙන් සිය අප්‍රසාදය පළ කළ හ. පේළියේ කොනේ අසුනෙහි වාඩි වී සිටි පුංචි

පිරිමි ළමයෙක් කැතීගේ ගෙතූ කෙස් වැටියෙන් අල්ලා ඇද්දේ ය.

ශාලාවේ හිස් කොටස හරහා දුව යද්දී මිනිස්සු ඔවුන්ට බැණ වැදුණා හ. අන්තිමේ දී දෙරටුව වෙතට ළඟා වූ ඔව්හු නවතනු ලැබූ හ. අමුත්තන් පිළිගන්නා කාන්තාව පිට වීම සඳහා ඔවුන් කළ ඉල්ලීමට කන් දුන්නේ නැත.

"ඔයාලට යන්න උවමනා නම් "රත්තරන් මාළුවා" ඉවර උණාම යන්න. ඊට කලින් යන්න බෑ." ඈ තර්ජනාත්මක ලෙස පහත් හඬින් කීවා ය.

මෙය ඔවුන්ගේ මහත් භීතියට හේතු විය. මක්නිසාද යත් තිරයෙහි මහල්ලා තව ම එක් වරක් වත් ඔහුගේ දැල නීලවර්ණ සමුද්‍රයෙහි නො හෙළූ හෙයිනි.

කාන්තාව ඔවුන්ට හිස් අසුනක් පෙන්වා වාඩිවෙන්නැයි අණ කළා ය.

කැතීගේ කේන්තිය ඇවිස්සුණේ ය. පහත් හඬින් කළත් ඇට තර්ජනය ඉවසන්නට බැරි ය. එහෙයින් ඈ තර්ජනයෙන් ම පිළිතුරු දුන්නා ය.

"නිකං ඉන්නවා. ටිකට් තියන අය විතරයි අවසානය දක්වා ඉඳගෙන ඉන්න ඕන. ඒත් මට ටිකට් නෑ. ඉතින් ඔයාට බලයක් නෑ මට රත්තරන් මාළුවා පෙන්වන්න. ඔයාගේ යුතු කම මාව පන්නා දැමීම යි. ඔයා ඒ යුතු කම හරියට ඉටු කරන්නෙ නෑ. හැබෑට ම ඔයාට ලජ්ජා නැද්ද ?"

"මොනවා! ටිකට් නෑ ? කෝ ඔයාගෙ ටිකට්ටුව !" කලබල වූ කාන්තාව කීවා ය.

"මට ඇති ටිකට්ටුවක් නැහැ." කැතී ගරු සරු නැති ව කීවා ය. පසු බා ගිය කාන්තාව වහා දොර හැරියා ය. දැරියෝ දෙදෙන අතුරු ශාලාවට පැන දෙරටුව දෙසට දිවූ හ.

"අර ඉන්නෙ එයා තමයි. පුංචි හෙර ! එහෙනම් ඔයාව එළියට දැම්මා ! එහෙම නේද?" කැතී දුටු කෙණෙහි දෙරටුව මුර කරන කාන්තාව කෑගැසුවා ය.

ඇත්තෙන් ම ඇටත් කදිම පිළිතුරක් දෙන්නට කැතීට හැකියාව තුබුණි. එහෙත් ඈ ඒ සඳහා සූනංගු නො වී තාන්යාත් සමග කඩිමුඩියේ වීදියට පැන ගත්තා ය.

පාන් වළලු හප හපා සිටි මැකරෝනි ළමයා ද බිත්තියෙන් මෑත් ව ඔවුන් පස්සේ දුවන්නට විය.

4

කැතී ඕට් පිටි මිළ දී ගනිද්දී මියෙල්කා ශාන්ත නිද්‍රාවක පසු වූවා ය.

කිඹුලා නාන බාල්දියේ පීනුවේ ය. සැළ ලිහිණියා එහා මෙහා පනිමින් රුං........ රුං.......... ගගා පියෑඹූ මැස්සන් සමූහයකට "පෙරට යා" යන අණ දුන්නේ ය. දිග ලී පෙට්ටිය තමාට පුරුදු කාඩ්බෝඩ් පෙට්ටියට වඩා ඉඩ කඩ ඇති එකක් වූ නිසා ඉබ්බා හිතේ හැටියට ඔබ මොබ ඇවිද්දේ ය. හාවෝ උන්ගේ කූඩුවේ තුබූ අවසාන ඩැන්ඩලියන් කොළය ද කා නිම කළහ. තාත්තා තමාගේ "හීම ආලාප" වාදනයේ තිස් හත් වැනි පාදයේ දී පුරුදු වැරැද්ද යළිත් කර නැවතත් මුල සිට පටන් ගත්තේ ය.

කොටින් කියතොත් සියල්ල සත්සුන්ව පැවැත්තේ ය.

එහෙත් කැතී "නැප්චූන්" සිනමා හලට ළඟා වූ මොහොතේ ම වාගේ මියෙල්කාගේ මුහුණට හිරු රැස් කළඹක් වැටිණ. ඈ තින්දෙන් ම එය පිස ද හැරීමට තැත් කළා ය. එහෙත් එයින් පලක් නොවූ විට ඈ කිඹුහුමක් හැර අත් මිට මොළවා ඇස් පිරිමැද අවදි වූවා ය. ටික වේලාවක් ඈනුම් හරිමින් ද ඇඹරෙමින් ද ගත කර ඇස් හැර බැලූ ඈට කුරුල්ලා, හාවුන් සහ ඉබ්බා පෙනුණි.

ඈ තදින් ඇස් පියා ගෙන මඳ වේලාවක් සිට යළිත් ඇස් හැර බැලුවා ය. හාවෝ, කුරුල්ලා සහ ඉබ්බා තවමත් සිටිති. මියෙල්කා වහා ඇඳෙන් පැන උන් වෙතට ගියා ය.

මේ සතුන් කොහි සිට ආ එවුන් දැයි කියා හෝ උන් තමාගේ කාමරය තුළට වී ඉන්නේ කුමක් හෙයින් දැයි කියා හෝ සොයා බැලීම පස් හැවිරිදි මියෙල්කාට අවශ්‍ය නො වී ය. කොයි හැටියකින් නමුත් උන් මෙහි ඉන්නා බව මියෙල්කාට පෙනේ. ඈට එපමණක් ඇත. එහෙයින් ඈ හා කුඩුව ඉදිරියේ ඇනතියාගෙන එය ඇතුළට ඇඟිල්ල එබුවා ය.

"පෙරට යා !" යි සැළ ලිහිණියා කෑගැසී ය.

මියෙල්කා උඩ බලා හිස වැනුවා ය. ඈට එක් වර ම කාරණය වැටහුණේ ය. කුරුල්ලා සෙල්ලම් ළදරු පාසලක් පවත්වයි. ! ඌ ගුරුතුමියගේ කොටස ඉටු කරමින් අණ දෙයි !

"අගෙයි ! අපි සෙල්ලම් කරමු" මියෙල්කා කැමැත්ත පළ කළා ය.

ඈ සරඹ පන්තියේ දී මෙන් කඳ කෙළින් තබා ගෙන, තාත්තාගේ කාමරයෙන් එන සංගීතයට අනුව පා තබමින් කාමරය ඇතුළේ වටේට ගමන් කිරීමට පටන් ගත්තා ය.

වරින් වර සිය දිග නිදන ඇඳුමේ පැටලෙමින් ද, ගමන් කිරීම නවත්වා ව්‍යායාම ආරම්භ කරනු සඳහා "ගුරුතුමියගේ" විධානය බලාපොරොත්තු වෙමින් ද, ඈ රවුම් කීපයක් ගමන් කළා ය. එහෙත් එබඳු විධානයක් දීම පිළිබඳ අදහසක් සැළ ලිහිණියාට නො වී ය. ඌ හිටිහැටියේ ම තමාගේ පැන් බඳුනට පැන්නේ ය. එහි වූ වතුර අහකට වැගිරිණ.

මේ දුටු මියෙල්කා ගේ තරහ ඇවිස්සුණේ ය. ඈ සැළ ලිහිණියාට මෙසේ කීවා ය.

"සරඹ ඉවර වෙන තුරු ඔයා මූණ කට සෝදන්න ඕන නැහැ. ඔයා දන්නෙ නැහැ ගුරුතුමිය වෙන්ට. මේ බලන්න මමයි ගුරුතුමිය....... ඔයා........... "

තමා ගුරුතුමියගේ කොටස ඉටු කරනුවාට සැළ ලිහිණියා කැමති කරවා ගනු සඳහා ඌට දෙන්නට සුදුසු කොටසක් ගැන මියෙල්කා කල්පනා කළා ය.

"................ ඔයා තමයි............. නාන කාමරේ සේවකයා"

"හලෝ !" සැළ ලිහිණියා කෑගැසුවේ ය.

තමාගේ යෝජනාවට කැමති වූ සැළ ලිහිණියා මේ දැන් ළදරු පාසලට පැමිණි ළමයකු මෙන් තමාට ආචාර කරති යි මියෙල්කා සිතුවා ය.

"ආයුබෝවන් ළමයිනි" ඈ ගාම්භීර හඬින් කීවා ය; ගුරු තුමියගේ කට හඬ හැකිතාක් දුරට අනුකරණය කරමින් "ළමයිනි, දැන් අපි ඇවිදින්නට යමු" යි කියා හාවුන්ගේ කූඩුව හැර උන්ට පිටතට එන්නට සැලැස්සුවා ය.

හාවෝ කාමරය පුරා පනින්නට වූ හ. උන්ගෙන් එකෙක් ඇඳ යට ද අනෙකා කැතීගේ ලියන මේසය යට ද සැඟවුණාහ.

"ළමයිනි, එක් ව ඉන්න" මියෙල්කා කෑගැසුවා ය. එහෙත් හාවෝ එය ගණන් නො ගත් හ.

ඈ සැළ ලිහිණියාගේ කූඩුව විවෘත කළ විට ඌ පිටතට පියෑඹුවේ නැත.

"මේ ළමයා මෝල් ගස් ගිලල වගේ ඉන්න හැටි !" මියෙල්කා නොසතුටින් කීවා ය. කූඩුවට අත දමා ඌ ඉවතට ගන්නට ඇට සිදු විය. එසේ ගත් විට ඌ නිදහසේ පියාපත් ගසා සීලිම තෙක් ඊයක් මෙන් ඉහළ ගොස් ඒ මේ අත පියාසර කෙළේ ය. මියෙල්කාට ඌ ගැන කළ හැකි කිසිවක් නො වී ය.

හැමට ම වඩා කීකරු ළමයා ඉබ්බා විය. මියෙල්කා දිග ලී පෙට්ටියෙන් ඉවතට ගෙන බිම තැබූ විට ද ඌ හිස කටුව තුළට ඇද ගෙන නිසොල්මන් ව සිටියේ ය.

"අන්න හරි, අන්න හොඳ ළමයා" මියෙල්කා ඌ තවත් දිරි ගන්වන ලෙසින් කීවා ය.

ඇවිදින්ට යන්නට කිසිවකු නොපැමිණි නිසා නිහඬ ව සිටීමේ කාලයක් දීමට මියෙල්කා සිතුවා ය. ඈ තමාගේ ලොකු ම බෝනික්කා නිදි කරවන ඇඳෙහි ඉබ්බා තබා කම්බිලියක් ගෙන ඌට හොඳ හැටි පෙරෙවුවා ය. ඌ පැන නොදිවූ නිසා මියෙල්කා ඌට වඩ වඩා ආදරය කළා ය.

"ඔයා තමයි මගේ දුව !"ඈ ඉබ්බාට කීවා ය. යළි හාවුන් දෙසට හැරී "ඔයාල එක්ක මම තවත් සෙල්ලම් කරන්නෙ නැහැ" කීවා ය.

මියෙල්කා ඉබ්බාගේ කම්බිලිය සකස් කොට උගේ හිස අත ගෑවා ය. "නිදගන්න දුව, නිදගන්න" කී ඈ නැළවිලි ගීයක් ද සිහින් හඬින් ගැයුවා ය.

මියෙල්කා නැළවිලි ගීය ගයමින් ඇගේ "දුව" නිදි කරවන විට හාවෝ දෙන්නා එකා පස්සේ එකා පැන පැන ගොස් සාලයට ඇතුළු වූ හ. මියෙල්කා ඒ බව නොදත්තා ය.

5

කැතීට සිය හාවුන්ට කෑම දෙන්නට තිබුණ නිසා දැරියන්ගේ කඩිමුඩිය ඉතා බලවත් විය. ඔවුන් කැතීගේ නිවස කිට්ටුවට ම ආ පසු තාන්යා වීදිය හරහා යාමට හැරුණා ය.

"ඔය කොහේ යන්න ද ?" කැතී ඇසුවා ය.

"එයා ඉන්නෙ අර පැත්තෙ" තාන්යා පිළිතුරු දුන්නා ය.

"කවුද ?"

"කියන්නත් එකක් ද? ලිලී"

"ඔයා හිතුව ද අපි ලිලීලයි දිහා යනවයි කියල ?"

තාන්යා පාර මැද්දෙ ම නැවතුණා ය.

"ඔයා හිතනව ද ලිලීට මේ ගැන නොකියන එක හරියි කියල ? අර නම ගිය නිළිය එයාගේ අක්කා හමු වෙන්න ආ වෙලාවෙ එයා හනික දුවලා ඇවිත් ආරංචිය අපට කීවේ නැද්ද ? ඉතින් ඔයා හිතුවෙ නැහැ ඔයාගෙ කිඹුලා ගැන එයාට කියන්න ? අනේ කැතී ! ඇයි ඔහොම කරන්නෙ ?"

කැතී අතිශයින් ලජ්ජාවට පත් වූවා ය. ඇත්ත වශයෙන් ම ලිලීට තමාගේ සතුන් ගැන කියන්නටත් ඇට උන් පෙන්නන්නටත් කැතීට ඕනෑ ය. එහෙත් ඒ සඳහා ඉතිරි ව ඇත්තේ ඉතා ටික කාලයකි.

"හරි. හැබැයි, අපි ඉක්මන් කරන්න ඕනෑ. හාවුන්ට කෑම දෙන්න තියනවා."

ලිලී ඉන්නේ තට්ටු නිවාසයෙහි තුන් වැනි තට්ටුවේ ගෙයක ය. ඔවුහු කාලය ඉතුරු කර ගැනීම සඳහා තරප්පු පේළිය නො නැඟ පිටුපස මිදුලට දිවූ හ. එය බොහෝ විශාල වූ ද නා නා විධ ශබ්ද බහුල වූ ද මිදුලක් විය පැත්තක මිනිස්සු දෙදෙනෙක් ලෑලි ඉරූ හ. තව පැත්තක ගැහැණියක් රෙදි ඇපිල්ලුවා ය. මිදුල මැද ළමෝ

වොලි බෝල ගැසූ හ. ඒ මදිවාට ගුවන් විදුලි යන්ත්‍රවල මහ හඬ සෑම කවුළුවකින් ම නික්මිණ.

දැරියෝ දෙදෙනා හිස් ඔසවා ලිලීගේ ගෙදර කවුළුව දෙස බලා එක් වර ම හඬ ගෑ හ.

"ලි..... ල් .... ලී !"

ලිලී ගෙදර ඉන්නා බවට ලකුණකුදු නො වී ය. ඔවුන් යළිත් හඬ ගෑ නමුත් පිළිතුරක් නො ආවේ ය. තුන් වැනි වතාවටත් හඬ ගෑමට සැරසී හුස්ම ඉහළට ඇද්ද ඔවුන්ට පිටුපසින් මහ හඬක් ඇසිණි.

"ලි...... ලී !"

හඬ නැඟුවේ ඔවුන්ට අඩි කීපයක් ඈතින් සිටි මැකරෝනි ළමයා ය.

එකෙණෙහි ම මල් පෝච්චිවලට පිටුපසින් ලිලීගේ මුහුණ මතු විය.

"හනික එන්න ! ලිලී ! මට පුදුම දෙයක් ලැබිල තියනවා !" කැතී බිම සිට හඬ ගා කීවා ය.

"සුදු මදයක් ?" ලිලී උඩ සිට කෑගෑවා ය.

"නෑ, නෑ, කිඹුලෙක් ! කිඹුලෙක් ! කිඹුලෙක් !"

"මොකෙක් ? පිඹුරෙක් ?"

ලිලී සහ තාන්යා බලාපොරොත්තු සුන් වූ බව හඟ වන බැලුම් හුවමාරු කර ගත් හ; අනතුරුව පස්සට හැරී මැකරෝනි ළමයා දෙස බැලූ හ. තමාගෙන් ඔවුන් බලාපොරොත්තු වන දේ වහා තේරුම් ගත් හෙතෙම මැකරෝනි පොදිය අනෙක් අතට මාරු කරමින් පපුව ඉස්සරහට දමා මහ හඬින් කෑගැසුවේ ය.

"විගහට එන්න, එයාගෙ කිඹුලා බලන්න යන්න !"

"එනවා !" යි උත්තර දුන් ලිලී වහා කවුළුව වෙතින් ඉවත් වූවා ය.

6

තාත්තා ඉදිරියෙහි උස කනප්පුවක් තිබුණේ ය. කනප්පුව මත ස්වර සටහන් විය. ඔහු වයලීනය වයමින් සිටියේ ය. ඔහුගේ වමතේ ඇඟිලි තත් මත නැටූ අතර දකුණතින් ගත් බෝව කඩිනමින් ඉස්සරහටත් පස්සටත් ගියේ ය. "හීම ආලාප" වනාහී වාදනයට අමාරු රචනාවකි. තාත්තා යළිත් එහි අමාරු ම තැනට පැමිණ සිටියේ ය.

හරියට ම මේ අවස්ථාවේ දී තාත්තාගේ අඬුවක් කැඩුණු කන්නාඩි කුට්ටම පුරුදු පරිදි නාසයෙන් පහළට ලිස්සන්නට පටන් ගත්තේ ය.

මේ අබලන් කන්නාඩි කුට්ටමත් මීයන් කෑගසන්නාක් මෙන් 'කීස්' හඬ නංවන දොරත් තාත්තා පිස්සු ගන්වන දේවල් ය. සෑම උදයක ම ඔහු නාට්‍ය පුරුදු කිරීම සඳහා යන්නට පෙර - කන්නාඩි කුට්ටම අලුත් වැඩියා කර ගන්නටත් දොරේ සරනේරුවලට දැමීම පිණිස තෙල් මිල දී ගන්නටත් ඉටා ගනී. එහෙත් සෑම සවසක ම ගෙදර ආ විට තමාට ඒවා අමතක වූ බව ඔහුට මතක් වෙයි.

කන්නාඩි කුට්ටම ඉහළට කර ගත් හෙතෙම හීම ආලාපයේ "අන්තරා" කොටස වාදනය කරන්නට සැරසුණේ ය. එය සියුම් තත්වල වැයෙන මෘදුතම ස්වර පන්තිය විය. "අන්තරා" කොටස වාදනය කිරීම සඳහා ඔහු සිය ඇඟිලි පුවරුවේ අගට යවද්දී මීයන්ගේ හඬ වැනි කීස් හඬක් වයලීනයෙන් නැගුණි.

සාලයේ අල්මාරිය උඩට වී නිදි කිරමින් හුන් ආච්චිගේ සුදු බළලා වහා කන් ඔසවා විපරම් කෙළේ ය. තට්ටු නිවාසයේ මීයෝ නුවූ හ. ඒ නිසා බළලා උගේ මුළු ජීවිතයට ම මීයකු දැක නැත. එහෙත් උගේ ප්‍රියතම සිහිනය කොහොම හරි මීයකු අල්ලා

ගැනීම ය. ඒ නිසා ආච්චි ටර්නිප් අල පෙරන්ගාන විටත් කැති තමාගේ අභ්‍යාස පොතෙහි වූ වැරදි මත මකන කැල්ල අතුල්ලන විටත් තාත්තා තීව්‍ර ස්වර වාදනය කරන විටත් මීයකුගේ ඉවක් එති යි සිතූ බළලා ඌ සෙවී ය.

මේ වාරයෙහි ද අමුත්තක් නොවීය. බළලා අල්මාරියෙන් බිමට පැන වල්ගය තර්ජනාත්මක ලෙසින් වනමින් දෙර දෙසට ඇදෙන්නට පටන් ගත්තේ ය.

දෙර කීස් ගානු තාත්තාට ඇසිණ. ඔහුගේ සර්වාංගය කිළි පොලා ගියේ ය. කුරිරු ලෙස රැවුල් ගස් පුම්බා ගත් බළලා කාමරයට එබිකත් කෙළේ ය.

තාත්තා බෝව වනමින් "චිප්........ චිප්......." යැයි කෑගැසීය බළලා සන්සුන් ලෙස ආපසු හැරී ගමන් කෙළේ ය.

තාත්තා යළිත් වාදනය පටන් ගත්තේ ය. එය ඇසුණු බළලා ආපසු හැරුණේ ය. දෙර තව වරක් කීස් ගෑවේ ය.

තාත්තා කේන්තියෙන් කරකැවුණේ ය. ඔහුගේ කන්නාඩි කූට්ටම ඉවතට වීසි විය. දූන් ඔහුට බළලා වෙනුවට පෙනෙන්නේ නොපැහැදිලි සුදු පුල්ලියකි.

"පලයන් යන්න !" කියා කෑ ගසමින් තාත්තා උගෙ කුළල පිටිකරින් අල්ලා ඔසවා සාලයට වීසි කර කෝපයෙන් බිම අඩි හප්පා සැරෙන් දෙර වසා දැම්මේ ය. එහෙත් එය මොහොතකින් ආපසු තල්ලු වී යළිත් ඇරුණේ ය.

තදබල ලෙස නොමනාප වූ බළලා අල්මාරිය යටට රිංගුවේ ය. අල්මාරිය යට පුංචි ළමයින් සෙල්ලම් කිරීමට ගන්නා ලී කැබෙලි කීපයක් ද ඔළුව නැති බෝනික්කෙක් ද විය. ඌ කෝපයට පත් ව වල්ගය දෙපසට වනමින් එහි වාඩි වී හුන්නේ ය.

මිනිහෙකුට මොහොතක් නිස්කාන්සුවේ ගත කරන්නට බැරි තරමට කීස් ගාන දෙරවලින් සහ අබලන් කන්නාඩිවලින් පිරුණු මේ ගෙදරට සාප කරමින් තාත්තා තමාගේ කන්නාඩි කූට්ටම සෙව්වේ ය.

මෙසේ සොයන අතර කන්නාඩි කුට්ටම අහම්බෙන් මෙන් ඔහුගේ පයේ හැපී ඈත මුල්ලකට වීසි විය. එය සොයා ගැනීමේ බලාපොරොත්තු සුන් කර ගත් හෙතෙම දිග සුසුමක් හෙළා. සංගීත සටහන්වල නාසය වදින තරමට නැමී කන්නාඩි නැතිව ම වාදනය කරන්නට පටන් ගත්තේ ය.

සුදු හාවුන්ගෙන් එකෙක් පැන පැන අවුත් සාලයේ හුන් බළලා පසු කර ගමන් කෙළේ ය. බළලා ඌ දැක සූ...... සූ....... හඬින් පිඹිබේ ය. කොයි හැටි වෙතත් ඌ වැඩි පරෙස්සම සඳහා අල්මාරිය යට ම තව ටිකක් පස්සට වුණේ ය. තමා කවර ද වත් නුදුටු විරූ මෙබඳු සතකු ගෙදර සිටින්නේ කුමක් නිසා දැයි ඌ පුදුම විය.

හාවා කන් ඔසවා ගෙන තොල් පොපියවමින් හෙමින් හෙමින් තාත්තාගේ කාමරය දෙසට ආවේ ය.

විනාඩි පහක් පමණ කරදරයක් නැති ව පසු වන්නට ලැබීම නිසා තාත්තා යළිත් සන්සුන් විය.

හදිසියේ ම මෙන්න අර ඇඟ හිරි ගන්වන කීස් නාදය !

තාත්තා කෝපයෙන් වියරු විය. තමා හොඳින් දන්නා අර නොපැහැදිලි සුදු පුල්ලිය යළිත් ඔහු ඉදිරියේ විය.

"මම උඹව මරා දනවා !" කියමින් ඔහු බළලා අල්ලන්නට පැන්නේ ය.

එහෙත් හාවා කව්ච්චිය යටට රිංගා ගත්තේ ය.

7

කැතීගේ ආච්චි වෙළෙඳ පොළෙන් තමාට ඕනෑ කරන හැම දේ ම මිළට ගෙන ගෙදර ආවා ය. ඈ තුන් වැනි තට්ටුවට යාම සඳහා තරප්පු පේළිය නඟිද්දී ඉහළ දෙරක් වසනු ඇසිණ. එය තම නිවසට ඇතුළු වන දෙර යැයි සිතූ ආච්චි ගමන ඉක්මන් කරමින් මෙසේ කෑගැසුවා ය.



"දෙර වහන්න එපා!"

එහෙත් වසන ලද්දේ ආච්චිගේ නිවසේ දෙර නොව ඇගේ අසල්වැසියා වූ නඩෙෂ්ඩා පෙත්‍රොව්නාගේ නිවසේ දෙර ය. අල්ලපු ගෙයි වාසය කරන ඈ බේසමක් පුරා තෙත රෙදි ගෙන ඒවා වනන්නට තට්ටු නිවාසය මුදුනෙහි වූ අට්ටාලයට යන්නී ය.

"ආයුබෝවන්, නඩෙෂ්ඩා පෙත්‍රොව්නා, මම හිතුවා අපේ දෙර ය කියා" ආච්චි සාදරයෙන් කීවා ය.

"ඔබේ බළල කොච්චර වත් මගේ කිරි ටිකට ඉව අල්ලනවා. මම ඔබට කී වතාවක් කියා තිබෙනවා ද ඌට අපේ බිත්තිය මුදුනට නඟින්න දෙන්න එපා කියා ? " නඩෙෂ්ඩා පෙත්‍රොව්නා කඩා පැන්නා ය.

"මට හොඳට ම කණගාටුයි" ආච්චි කීවා ය. "මොන එහෙකට ද මන්ද තට්ටු නිවාසයේ බළල්ලු හැමෝ ම අපේ ජනේලය ළඟ පොදි

කන්නෙ" කියමින් නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තරප්පු පේළිය නැංගා ය. "බළලෙකුට හොඳ සිරිත් පුරුදු කරන්න බැරි කෙනෙක් බළලෙක් ඇති කරන්න කිසි ඕන කමක් නැහැ!"

"හරි තමයි, හරි තමයි" ආච්චි කොඳුළා ය. නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ඇගේ ගෙයි දෙර අඩක් හැර තිබියදී ම යන්නට ගියා ය.

ආච්චි බරට බරේ තුබූ බඩු වට්ටිය බිම තබා යතුර සෙව්වා ය. ඈ එසේ කරද්දී වට්ටිය පෙරළිණ. එහි තුබූ රට ඇනු ගෙඩි තරප්පු පෙළ දිගේ පහළට කොන්ඩැරි ගසන්නට වන.

"අපොයි" කියමින් ඈ ඇනු අහුලන්නට පහළට බැස්සා ය.

එවිටම පැස්ටුෂ්කොව් ගෙදර දෙර හැරිණ. ගෙය තුළින් ඉවතට විසි කරනු ලැබූ සුදු හාවෙක් ලස්සණ අඩ කවයක හැඩයට ඉහළින් අවුත් ආච්චිගේ වට්ටිය තුළට වැටිණ.

දෙර වේගයෙන් වැසිණ. ඉන් පසු යතුරු තහඩුවේ ද දම්වැලේ ද අගුලේ ද සටපටය ඇසිණ. ඊටත් පසු සාලය ඇතුළට ආපසු යන තාත්තාගේ පියවර හඬ ඇසිණ.

යළිත් සියල්ල නිහඬ විය. හාවා තැන් මාරුව ගණන් නොගත් බව පෙනුණි. ඌ වට්ටිය ඇතුළේ හරිබරි ගැහී රසවත් කැරට් අලයක් තෝරා ගෙන ලැටි ගාන්නට පටන් ගත්තේ ය.

ඇනු ගෙඩි ටික අහුලා ගෙන ආපසු ආ ආච්චි තමාගේ වට්ටිය ඇතුළේ ගුලි ගැහී හුන් හාවා දුටුවා ය.

"ඉද ! මේ කවුද බොල !"යනුවෙන් මවිතය පළ කළ ඈ ඌ කොහි සිට එතැනට එන්නට ඇද්දැයි කල්පනා කළා ය. අනුමානයෙන් වත් එය සිතා ගන්නට අසමත් වූ ඕ තොමෝ පාත් වී ඌ කැරට් අලය ලැටි ගාන හුරු බුහුටි ආකාරය ආසාවෙන් බලා සිටියා ය.

"හානේ ! මගෙ කිරි කැටි සුදු"

හදිසියේ ම ඇගේ ඇස් අල්ලපු ගෙයි දෙර කරා යොමු විය. එය බාගෙට ඇරී තිබිණ. සිදු වී ඇති සියල්ල දූන් ඈට පැහැදිලි ය. ඈ හිස වනා මෙසේ කීවා යː

"වීදුරු ගෙවල් ඇතුළෙ ඉන්න අය පිටතට ගල් ගහන්න තරකයි............. එයා රටට බණ කියනවා. බලමු එයාගෙ වැඩවල හැටි !"

ඉන්පසු ඈ හාවා ඇමතුවා ය.

"අනේ හා හාමි ! උඹේ බඩ පිරුණා ද ? මෙහෙ ඉන්නවා හම්බ උනොත් උඹේ සාමිදූ උඹට බනීවි. ඊට ඉස්සෙල්ල උඹ ගෙදර යන එක හොඳයි"

ආච්චි වට්ටියේ සිටි හාවා පරෙස්සමෙන් ඉවතට ගෙන නඩෙෂ්ඩා පෙත්‍රොව්නාගේ නිවස තුළට දැමුවා ය; ගෝවා ගහක් සහ ටර්නිප් අලයක් ද කාමරය තුළට දැම්මා ය; ඌට යළිත් පැන යන්නට බැරි වන ලෙස පරිස්සමින් දොර වැසුවා ය.

ආච්චිට සුප් එක සෑදීමට තරම් එළවලු ඉතිරි නො වී ය. එහෙත් ඈ එය ගණන් ගත්තේ නැත.

"ඒකට කමක් නෑ. මම මිනිත්තුවෙන් තව එළවලු ටිකක් ගේනවා." කියමින් ඈ වට්ටියත් ගෙන තරප්පු පේළිය බැස්සා ය.

සුදු හාවුන්ගෙන් එකකු අතුරුදහන් වූයේ මෙලෙසිනි.

8

හාවුන්ට කෑම දීමට ඉක්මනින් ගෙදර යා යුතු නිසා කැතී කඩිනම් කළා ය. එහෙත් නීනා නැති ව තවත් අඩියක් වත් නොතැබිය හැකි බව ලිලී තරයේ කියා සිටියා ය. කෑම දෙන්නට ටිකක් පමා වූවාට හාවුන් මැරෙන එකක් නැත. එහෙත් තමා කැටුව නොගියහොත් නීනා නම් ඔවුන්ට කිසි සමාවක් නොදෙනු ඇත. මෙතරම් වැදගත් වෙලාවකත් යාළුවා අමතක කරතොත් ඒ යාළු කමේ තේරුම කුමක් ද? නීනා දුන් මාවත අද්දර රැක් සෙවනක හිඳ "හිස නැති අසරුවා" කියවමින් ඇති බවට ඕනෑ ම ඔට්ටුවක් අල්ලන්නට ලිලී සූදනම් ය.

කැතී, තාන්යා සහ ලිලී සුළං රැල්ලක් මෙන් සෙවන මාවත දෙසට දිවූ හ. මැකරෝනි ළමයා තමාගේ තුන් වැනි පාන් වළල්ල හපමින් කතා නැති ව ඔවුන් පසු පස දිව්වේ ය..

හැබෑට ම නීනා මාවත අද්දර වූ බංකුවක් මත, අත දරුවකු වඩා ගත් ආයාවකට සහ කිරා වැටෙන මහල්ලකුට මැදින් වාඩි වී ඔවුන්ට මෙන් රිඩ් ගේ "හිස නැති අසරුවා" කියවමින් උන්නා ය.

"මම මොකද කිව්වෙ ?" ලිලී ජයග්‍රාහක විලාසයෙන් ඇසුවා ය. "නීනා, පොඩ්ඩක් නැවතිලා අහන්න අපි කියන්න ආපු දේ, ඔයාගේ පණ යාවි !"

නීනාගේ පණ ගියේ නැත. එහෙත් අත දරුවා සිය උකුලෙහි එහාට මෙහාට සොලවමින් ආරංචිය ඇසූ ආයාගේ නම් පණ නොගියා පමණි.

දැරියන් තිදෙනා ම කිඹුලා ගැනත් සැළ ලිහිණියා ගැනත් විස්තර කියද්දී ආයා අත දරුවා වඩ වඩා තදින් සොලවමින් ද 'හා! හෝ!' කියමින් ද සිය පුදුමය පළ කළා ය. කථාව තව ටිකක් දික් වී නම්

ඇගේ දඟලීම නිසා අත දරුවා වීසි වී ගොස් ගසක රැඳෙන්නට ඉඩ තුබුණි.

"ඇත්තට ම ඔය කතාව පචයක් නෙමෙයි ද?" ආයා කුහුලින් ඇසුවා ය. "හොඳයි, එහෙනම් එන්න, අපි යමු !" කියමින් අත දරුවා උඩ වීසි කර ඇල්ලූ ඈ බංකුවෙන් ඉවතට පැන්නා ය.

නැවතත් සියල්ලෝ දුවන්නට පටන් ගත් හ. එය හරියට ම හාවුන්ට කෑම දිය යුතු වේලාව විය.

9

බළලා යැයි සිතා ගෙන හාවා ගෙයින් පිටතට වීසි කළ තාත්තා සිය කාමරයට ආපසු විත් සතුටින් යුගත් පිරිමදින්නට විය. අන්තිමේ දී මේ කරදරකාර බළලාගෙන් නිදහස් වීමට ලැබුණි. දැන් ඉතින් ඔහු "හිම ආලාප" වාදනය කරන විට ඔහුට බාධා කරන්නට කිසිවෙක් නැත.

තාත්තා වයලීනය සිය නිකට කරා ඔසවමින් "දැන් ඉතින් උඹට ආයෙත් රිංගන්න ඉඩක් නෑ. පුළුවන් නම් වරෙන්" යි මිමිණුවේ ය. ඔහු ඇස් බාගෙට පියා ගෙන පළමු වැනි ස්වරය වැයුවේ ය. දෙවැන්න වැයීමට පෙර දෙර තියුණු කිස් හඬක් නැඟී ය.

තාත්තා මළානික විය. බළලා ආපසු ඇවිත්!

"වෙන්න බෑ !" තාත්තා දුක් බර ලෙස කීවේ ය. ඔහු අතින් ගිලිහුණු බෝව බිම වැටුණේ ය.

බළලා කුන්දු ගසමින් කාමරය හරහා ගමන් කෙළේ ය. ඌ එසේ කෙළේ යතුරු සහ අගුල්වලට ද කෝපයට පත් හාම් පුතුනට ද අප්‍රසාදය දැක්වීම සඳහා බව තාත්තාට සහතික ය.

බළලා කව්ච්චිය යටට ගියේ ය. තාත්තා කොස්සක් හොයන්නට යන ගමන් "මේ බළලා හින්ද තමයි මම මැරෙන්නෙ කවද හරි"යි කෙඳිරි ගෑවේ ය.

මේ අතර දෙවැනි හාවා කව්ච්චිය යටට වී එහි මෙට්ටයට ඇලී තුබූ පිදුරු ගහක් හපමින් ප්‍රීතියෙන් උන්නේ ය. එහෙත් ඌ එය වැඩි වේලා හපන්නට පෙර තාත්තා කොස්සත් රැගෙන ආපසු ආවේ ය.

"මම උඹට හොඳ පාඩමක් උගන්නනත්නම්" කියමින් තාත්තා කොස්ස කව්ච්චිය යටට යැවී ය. හාවා පොත් රාක්කය යටට පැන්නේ ය.

කැති සහ කිඹුලා

"බෑ, බෑ, ඔහෙ බෑ" කියමින් තාත්තා කොස්ස පොත් රාක්කය යටට යැවී ය. "මට උඹ ඇති වෙලා - ඔව් ඇති වෙලා !" යි ඔහු හාවා කොස්සෙන් තල්ලු කෙළේ ය. ඌ හාන්සි පුටුව යටට යන්නට සැරසුණ නමුත් තාත්තා ඊට පෙර එහි ගියේ ය.

"හිටපන් ! මම උඹ නියම තැනට යවන්නම්, නැහැදිච්ච බළල් තඩියා ! යි තාත්තා කෑගැසී ය. ඔහු හාවා පිටිකරින් ගෙන ඇඳුම් අල්මාරියට වීසි කොට දෙර වේගයෙන් වසා යතුරු දැමුවේ ය.

"දැන් ඉතින් උඹට ඕන පදම් කෑවි ගාන්න පුළුවන්" කී ඔහු දෙරට කන තබා කන් දී ගෙන සිටියේ ය. එහෙත් ඌ කෑවි ගෑවේ නැත.

මේ කරදර සියල්ලෙන් පසු තමාගේ නහර හීන් තීරුවලට ඉරා දැම්මාක් මෙන් තාත්තාට දැනුණේ ය. "හීම ආලාප" වාදනය කිරීමට තරම් ධෛර්යයක් දැන් ඔහුට නැත. එහෙයින් දැන් කළ යුතු හොඳ ම දෙය නහර දුර්වලත්වයට ක්ෂණික ගුණ දෙන ඔසුවක් වූ කුප්පමේනිය සාරය බින්දු ස්වල්පයක් ගැනීම යැයි ඔහුට සිතිණ.

බෙහෙත් රාක්කය වෙත ගිය ඔහු බෝතල රාශියක් ගෙන ඇහැට කිට්ටු කොට ඒවායේ ලේබල කියෙව්වේ ය. තමාට අවශ්‍ය දේ හැර අනික් හැම දෙයක් ම ඔහුට හමු විය. මෝර තෙල්......... අයඩින්.......... එඬරු තෙල්.......... ආදී හැම දෙයක් ම එහි තිබේ. එහෙත් කුප්පමේනිය සාරය එහි නැත.

සොයන්නට සොයන්නට තාත්තා වැඩි වැඩියෙන් විඩාවට පත් විය. සෙවීමේ අදහස අත්හැර දැමීමට ඔන්න මෙන්න කියා තිබියදී උඩ ම තට්ටුවේ ඈත ම මුල්ලේ තිබී බෙහෙත් බෝතලය ඔහුට හමු විය. ඔහු කෝප්පයක් ගෙන වාඩි වී ඉතා පරෙස්සමෙන් බින්දු ගණන් කිරීමට පටන් ගත්තේ ය.

"එකයි.......... දෙකයි........ තුනයි........"

මේ අතරතුර නියම බළලා සාලයේ අල්මාරිය උඩට වී නිදි සුවය වින්දේ ය. ඌ වරින් වර නින්දෙන් ම ඇඟ කිළිපොලා නිය පඳුරු විහිදුවේ ය. ඒ සෑම වරෙක ම තමා මීයකු ඇල්ලූ බව ඌ සීනෙන් දුටුවා විය යුතු ය.

බළලා හිටි හැටියේ ම එක් ඇසක් හැර නාසයෙන් ඉව අල්ලන්නට පටන් ගත්තේ ය. ඌට අති මිහිරි ඉවක් දැනිණ. මේ ලෝකයෙහි ඇති සුවඳ දේ අතුරෙන් බළලුන්ට පැහැර නොහැරිය හැකි අති මධුර සුගන්ධය එය යි. කුප්පමේනිය සාරය !

බළලාත් කුප්පමේනිය පඳුරත් අතර ඇති සබඳ කම ප්‍රසිද්ධ එකකි. කුප්පමේනිය සාරය බින්දුවක් ලැබෙතොත් ඒ සඳහා ලෝකාන්තය තෙක් වුව ද නොයන බළලෙක් නැත.

බළලා තොල කට ලෙව කෑවේ ය; අල්මාරියෙන් බිමට පැන්නේ ය; තාත්තාගේ කාමරය තුළට දිව්වේ ය.

"........ දහයයි.......... එකොළහයි......... දොළහයි."

දහතුනට එනුවාත් සමග ම කන් බිහිරි කරවන සෑව් හඬක් නගා ගෙන බළලා පැන්නේ ය.

තාත්තා අතින් බෝතලය සහ බෙහෙත් කෝප්පය ගිළිහිණ. බළලා ඉහිරුණ බෙහෙත් බින්දුවලට වහ වැටුණේ ය.

"මොනවා ! බළලා !" යි තාත්තා කෙඳිරි ගෑවේ ය. ඔහු ඇඳුම් අල්මාරියේ දොර දෙස බැලී ය. එහි යතුර තවමත් යතුරු කටේ තිබේ. ඔහු නැගිට ගොස් එය පිරික්සී ය. දොර තවමත් අගුළු ලෑ ගමන් ය.

තාත්තා යළිත් බළලා දෙස බැලී ය. තමාගේ ඇහැට පෙනෙන දේ ඔහුට තේරුම් ගත නොහැකි පුදුමයකි. එක ම බළලා එක ම වේලාවේ කාමරයෙන් එළියට වීසි කරනු ලැබුවේත් අල්මාරියට දමා දොර වසනු ලැබුවේත් තමා ඉදිරිපිට සිටින්නේත් කොහොම ද යනු ඔහුට විසඳිය නොහැකි ප්‍රහේළිකාවකි.

බළලා කෑදර ලෙස බිම ලෙව කා ආයාචනාත්මක හඬක් නැඟී ය. එහෙත් ඌට කුප්පමේනිය සාරය තවත් ලැබුණේ නැත. ඌ අරමුණක් නැති ව කාමරයේ එහා මෙහා ඇවිද්දේ ය. හදිසියෙන් ම ඌට කැඩපතෙහි තමාගේ පිළිබිඹුව පෙනිණ. තමාගේ ම පිළිබිඹුව සතුරෙකි යි සිතූ ඌ පිඹගෙන ඒ කරා පැන්නේ ය.

ඔළුව වීදුරුවෙහි හැපී බිම පෙරළුණු බළලා කැඩපත කෙරෙහි නොසතුට පළ කරමින් කාමරයේ අනෙක් මුල්ලට යන ගමන් පියානාව උඩට පැන්නේ ය. හරියට ම පියානාවට ඉහළින් අප්‍රිකාවේ සිතුවමක් එල්ලා තිබුණේ ය. බළලා අප්‍රිකාවට පහර දෙන්නට තීරණය කෙළේ ය.

එක් අතකින් ඔටුවකුට ද අනෙක් අතින් වළාකුළකට ද පහර දීගෙන ඌ පින්තූරයට පැන්නේ ය. බළලා, වලාකුළ, ඔටුවා ඇතුළු සියල්ල ලියන මේසය උඩට ඇද වැටිණ.

තාත්තා වචනයකුත් නොදොඩා බලා සිටියේ ය.

කැතී සහ කිඹුලා

අප්‍රිකාව සම්බන්ධයෙන් සිය හිතුමනාපය පරිදි ක්‍රියා කළ බළලා ජය සෝෂාවක් ද නඟා ඉදිරියට හමු වුණු සියලු දේ පෙරළා දමමින් ලියන මේසයෙන් ජනේලයට ද ජනේලයෙන් පියානාවට ද එතැනින් පොත් අල්මාරියට ද පැන සිය ජයග්‍රහණය ගැන ප්‍රීතිය පළ කෙළේ ය.

"මෙහෙම දෙයක් මම කවදවත් දැකලා නැහැ. මේක හීනයක් !" තාත්තා කෙඳිරි ගෑවේ ය.

මියෙල්කා විසින් කුඩුවෙන් මුද හරිනු ලැබූ සැළලිහිණියා මේ මොහොතෙහි කාමරයට පියාඹා ආවේ ය.

ඌ බළලා දැක භය වී සීලිමතෙක් ඉහළට පියාඹා කලබලයෙන් ඒ මේ අත පියාසර කරන්නට පටන් ගත්තේ ය.

එහෙත් තාත්තා කුරුල්ලා ගැන කිසිවක් නොදත්තේ ය. ඔහු දුටුවේ බළලා පමණි. බළලා අවසාන මල් පෝච්චියත් පෙරළා බිම දමා තාත්තා ඉදිරියෙහි නැවතී ඔහු දෙසට රවා ගෙන සිටියේ ය.

තාත්තා සිය ජීවිතයේ පළමු වරට බළලකු කතා කරනු ඇසුවේ එවේලෙහි ය. ඌ ඉතා පැහැදිලි ලෙස "හලෝ" කියනු ඔහුට ඇසිණ.

තාත්තා අත් දෙකින් නළල දෙපැත්ත තෙරපාගෙන මෙසේ කීවේ ය.

"පළමුවෙනුව මම සුරංගනා කතා විශ්වාස කරන්නෙ නෑ. දෙවනුව හාස්කම් කියල දෙයක් ඇත්තෙත් නෑ. සෑම දේකට ම විද්‍යානුකූල විග්‍රහයක් තියනවා....."

තාත්තාගේ සංගීත කනප්පුව උඩට පැන්න බළලා එය මත තුබූ ස්වර සටහන් සුළඟේ යැව්වේ ය.

"....... මෙතැන පුදුම විය යුතු දෙයක් නැහැ. මෙතැන ඉන්නේ....." තාත්තා මෙසේ කියාගෙන යද්දී සැළලිහිණියා පොකුරු පහනෙහි සිට "හලෝ" යි හඬ නැඟී ය.

කැතී සහ කිඹුලා

"......ඔහේ කතා කරන බළලෙක්..... නිකම් මායාවක්.... නැතිනම් මිරිඟුවක්..... ඒත් මිරිඟුව තියෙන්නෙ කාන්තාරයෙ විතරක් නේද? හොඳයි !..... ඔහෙ ගියාවෙ.... දැන් මට ඕනෑ ඔලුවෙ ඔතාගන්න තෙත තුවායක් විතරයි."

දුබල හඬින් තමාට ම මෙසේ කියාගත් තාත්තා තුවායක් ගැනීම සඳහා නාන කාමරය පැත්තට ගමන් කළේ ය.

"පෙරට යා !" යි සැළ ලිහිණියා කෑගැසුවේ ය.

"පිං සිද්දවෙයි, උඹේ වැඩක් උඹ බලාගනින්" තාත්තා මළානික ලෙසින් කාමරයෙන් පිට වී යන ගමන් බළලාට කීවේ ය.

නාන කාමරයට ගිය තාත්තා තුවායක් ගෙන නාන බාල්දියට ඉහළින් වූ කරාමය කරකවා තුවාය දිය පහරට මඳක් නැමුණේ ය. කිඹුලෙක් ඔහු දෙස බලාගෙන සිටී !

"ආහ්..... !" යි හුස්ම ඉහළට ගත් තාත්තා බංකු පුටුවක් මත ඇද වැටුණේ ය. ඔහු ඇස් පියාගෙන මඳ වේලාවක් එහි වාඩි වී හුන්නේ ය. අනතුරුව නැඟිට පා ඇඟිලි තුඩු පමණක් බිම තබමින් කාමරයෙන් පිටතට පා නැඟී ය.

සාලයේ කීප වරක් එහාට මෙහාට ගමන් කළ තාත්තා යළි නාන කාමරයෙහි දෙර ළඟට අවුත් මඳ වේලාවක් සිට එක පාරට දෙර හැර කර පොවා බැලුවේ ය.

කිඹුලා තවමත් එහි සිටී. ඌ වල්ගය දෙ පසට වනමින් දත් සියල්ල පෙනෙන සේ කට හැරියේ ය.

තාත්තා තුවාය කරට දමාගෙන සිය කාමරය දෙසට සෙමෙන් ගමන් කෙළේ ය. අලුත් වාතය ටිකක් ගැනීමට එළිමහනේ ඇවිදින්ට යාම මේ වේලාවේ හැටියට කළ යුතු හොඳ ම දෙය යැයි සිතූ ඔහු තොප්පිය ගැනීම සඳහා ඇඳුම් අල්මාරියේ දෙර හැරියේ ය. පළමුවෙන් ම ඔහු දුටු දේ නම් තමාගේ තොප්පිය තුළ ගුළි ගැහී නිදන සුදු හාවෙකි.

තාත්තා දැන් මෙබඳු දේ එතරම් ගණන් නො ගනී. ඔහු තොප්පිය නො ගෙන ම දෙර වසා සාළුව කරේ දමා ගත් වන ම ඇවිදින්නට ගියේ ය.

සැළ ලිහිණියා කාමරය තුළ කීප වරක් රවුම් ගසා කවුළුවෙන් පිට වී පියාසර කෙළේ ය.

10

අපි ඔබට කැතී-කුප්පමේතිය සාරය-ආච්චි-ශාස්ත්‍රීය සංගීතය-බළලා-මියෙල්කා-හාවුන් සහ සැළඹියා ගැන තොරතුරු කීවෙමු. ඇත්තෙන් ම මේ කාලය තුළ මිත්‍යා කුමක් කෙළේ දැයි දැන ගැනීමට දැන් ඔබ ආසා කරනු නිසැක ය.

ඔව්, මේ වන විට මිත්‍යා සිය මිතුරා වන අන්ද්‍රි වාසය කරන පිටිසර ගමට යන දුම්රිය තුළ හුන්නේ ය. තමාගේ සතුන් බාර දීමට සුදුසු තැනැත්තා අන්ද්‍රි යැයි ඔහු සිතුවේ ය.

දුම්රියේ කවුළුවෙන් ඉවත බැලූ මිත්‍යාට විදුලිය පණිවුඩ කම්බි ඉහළ-පහළ, ඉහළ-පහළ යනු පෙනිණ.

ඔහු සාක්කුවෙන් කුවිතාන්සිය ගෙන තව වරක් කියෙව්වේ ය. ලැයිස්තුවේ කිසි අඩු පාඩුවක් නැත. කිසි ම සතකු මඟ හැරී නැත. ඔහු හිත හද ගෙන අසුනෙහි හොඳ හැටි තැන්පත් වී කවුළුවෙන් පිටතට ඇස් යොමු කර ගෙන සිටියේ ය. විදුලිය කම්බි නොනැවත ඉහළ-පහළ යයි. තමාත් ඉහළ-පහළ යන්නාක් මෙන් මිත්‍යාට දැනිණ. ඔහුට කෙමෙන් නින්ද ගියේ ය.

තමාත් තමාගේ සතුනුත් පඩව්වක පාවෙන බව මිත්‍යා සිහිනෙන් දුටුවේ ය. සත්තු ඔහු වටේ රවුමක වාඩි වී උන් හ. මිත්‍යා කුඩා දුර දක්නයකින් අවට පැතිර සිටි අති මහත් ජල තලය පිරික්සා බැලී ය. පඩව්ව රළ ගෙඩි මත පාවෙයි. රළ ගෙඩි ඉහළ-පහළ, ඉහළ-පහළ යයි.

අන්ද්‍රි ද ඔහුගේ අම්මා සහ නැන්ද ද මිත්‍යා පිළිගැනීමට වෙරළට ඇවිත් සිටියෝ ය. මිත්‍යා පඩව්ව වැල්ලට ම පදවා ගහක බැන්දේ ය. අන්ද්‍රිගේ අම්මා කිඹුලා දෙස බලා කරුණාවන්ත ලෙස සිනා සී උගේ හිසට අතින් තට්ටු කර කම්මුල කෙනිත්තුවේ ය. නැන්ද උගේ බෙල්ල වටේ පීත්ත පටියක් බඳින්නට තැත් කළා ය.

මිත්‍යා නින්දෙන් ම සිනාසුණේ ය. එවිට ම වෙන දුම්රියක් මහ හඬ නගමින් ඔහුගේ දුම්රියට මාරු වී අනික් අතට ගියේ ය. ඉර එලිය සහ සෙවන තීරු මාරුවෙන් මාරුවට ඔහුගේ මුහුණට වැටිණ. මිත්‍යාගේ සිනාව අතුරුදන් විය. ඔහු වෙන සිහිනයක් දකින්නට පටන් ගත්තේ ය.

බළලා සැළ ලිහිණියා වෙතට පැන ඌ අල්වා ගිල දමනු මිත්‍යා සිහිනෙන් දුටුවේ ය. එවිට එක් හාවෙක් බළලා පිටට පැන ඌ ගිල



දැම්මේ ය. අන්ද්‍රිගේ නැන්ද තුවක්කුවක් රැගෙන අවුත් කිඹුලාට වෙඩි තිබ්බා ය. එවිට මකරකුට මෙන් අත්තටු මැවුණු කිඹුලා පියැඹී ය. උගේ නිය පඳුරු අතර ඉබ්බා විය. කිඹුල් මකරා ගොරෝසු සිනා හඬක් නගා නිය පඳුරු දිග හැරිය විට ඉබ්බා බිම වැටී ගලක වැදී කැබලි බොහෝ ගණනකට කැඩී බිම විසිරිණ. ඒ කැබලි සියල්ල ම ලොකු හතු බවට පෙරළිණ. හාවෝ දුව ඇවිත් හතු ගිජු ලෙස කා දැමූ සැණෙකින් මැරී වැටුණා හ.

"එක්කො උන්-නැත්නම් මම, එක්කො උන්-නැත්නම් මම" කියමින් අන්ද්‍රිගේ අම්මා ගිරිය පුප්පා කෑගැසුවා ය. පිටිසර ගෙයි සෑම කවුළුවකින් ම හාවෝ, ඉබ්බෝ, බළල්ලු සහ කිඹුල්ලු පියාඹා ගිය හ. දෙර වේගයෙන් වැසිණ. කවුළු ද වැට ද රෙදි වැනූ වැල ද අතුරුදන් විය. අන්තිමේ දී මුළු ගෙය ම නො පෙනී ගියේ ය. ගෙය තුබුණු තැන සිටි කළු පාට දැවැන්ත කපුටෙක් උගේ විශාල හොට විවෘත කර කාක රාවය නැඟී ය.

"මාතිශ්කිනෝ දුම්රිය පොළ !"

පෝටරගේ හඬින් මිත්‍යා තිගැස්සී අවදි විය. දුම්රිය නවතා තුබුණි. මිත්‍යා අසුනින් පැන දෙම්නසින් යුතු ව මෙසේ තොල් මතුරමින් රිය පොළෙන් පිට විය.

"සත්තකින් ම මේක තමයි සිද්ද වෙන්නෙ - මීටත් නරක දෙයක් සිදු නූනොත්-"

11

කිඹුල් මකරා උගේ කටින් ඉබ්බා ඩැහැගෙන පියාසර කරනු මිත්‍යා සිහිනෙන් දකිද්දී මියෙල්කා සිය බෝනික්කාගේ සෙල්ලම් කරත්තය තුළ ඉබ්බා තබා මිදුලේ තල්ලු කළා ය.

"කම්බිලිය අහක් කරන්න එපා. උඹට හෙම්බිරිස්සාව හැදේවි" ඈ ඉබ්බාට අවවාද කළා ය. එහෙත් ඌ ඇගේ අවවාදය නො තකා කොට්ටය උඩට නැංගේ ය. "උඹ හරි නරකයි, දඟ කෙල්ල !" කියමින් ඈ ඌ යළි තැන්පත් කොට කම්බිලිය පෙරෙව්වා ය.

ඉබ්බා මියෙල්කාගේ ඇඟිල්ල හැපුවේ ය. ඈ කෑ ගසා ඇඟිල්ල ඉවතට ඇද ගත්තා ය. ඈට තදින් කේන්ති ගියේ ය.

"උඹ හරි නපුරුයි !" ඈ තොල් සපමින් කීවා ය.

එවිට ම ඇගේ යහළුවකු වන ලියෝ නමැති පුංචි පිරිමි ළමයා ආවේ ය. ඔහු සෙල්ලම් කරත්තය තුළට එබී මෙසේ ඇසුවේ ය.

"මොනව ද ඇතුළෙ ?"

"තිකං පොඩි සතෙක්" මියෙල්කා ඇඟිල්ලේ වේදනාව නිසා අඬමින් කීවා ය.

"ඔයාට කොහෙන් ද ඌ ලැබුණෙ ?"

"කොහෙන් වත් නොවෙයි. ඌ ම ආවා." කී මියෙල්කා ඉබ්බා දෙසට හැරී "උඹ ඔහොම වැඩ කරතොත් උඹට බෑ මගෙ දුව වෙන්න" කීවා ය.

"ඌ කාන්දම් කැල්ලකට මාරු කරමු ද ?" ලියෝ ඇසී ය.

"බෑ බෑ"

"කතුරු තලයකට ? අගේට කැපෙනවා"

"බෑ"

"එහෙනම් මොනවට ද ?" කියමින් ලියෝ තමාගේ මුළු සේසත ම බිම විසිරෙන සේ සාක්කුව කණපිට පෙරළුවේ ය.

දෙදෙනා ම වාඩි වී බඩු තොගය පිරික්සන්නට වූ හ. ලියෝ බඩු එකින් එක ගෙන පෙන්නමින් පාරට්ටු කෙළේ ය.

"එහෙනම් බලන්න....... ඇණයක්...... අගේ ඇති ඇණේ, තාත්ත කැමරාව එල්ලුවෙත් මේකෙයි.

"බෑ"

"එහෙනම් මේ ඔර්ලෝසු බට්ටා ගන්න" පසුබට නො වූ ලියෝ කීවේ ය. "හරියට රත්තරන් වගෙයි, පේනව ද දිලිසෙන හැටි !"

"බෑ"

"ලස්සණයි නේද ? ඕනද ?"

"උහ්ම්" කියමින් හිස වැනූ මියෙල්කා "මොනවද ඔය පෙට්ටියෙ ?" ඇසුවා ය.

"ආ-මේවද ? මේ නිකං ටොෆි කොළ වගයක්"

"කෝ බලන්න"

ලියෝ පෙට්ටියේ පියන හැර දිලිසෙන රූප සහිත රස කැවිලි දවටුම් පත් පෙන්නුවේ ය.

"මට ඕනෑ ටොෆි කොළ !" මියෙල්කා පෙට්ටිය ගැනීමට අත දිගු කරමින් කීවා ය.

ලියෝට තමාගේ කනට ඇසෙන දේ විශ්වාස කරන්නට අමාරු ය. කුමන වාසනාවක් ද ? නොවටිනා රස කැවිලි දවටුම් පත් ටිකක් වෙනුවට හැබෑ ඉබ්බෙක් ! ඔහු ඒවා ඉතා කැමැත්තෙන් ඇට දී තමාගේ කෘතඥතාව පළ කිරීම සඳහා ඉස්කුරුප්පු ඇණයක් සහ ලාකඩ කෑල්ලක් වැඩිපුරත් දී ඉබ්බා ලබා ගත්තේ ය.

මියෙල්කා අතිශය සන්තෝෂයට පත් වූවා. බංකුවක් මතට වී රස කැවිලි දවටුම් පත් තෝරන්නට විය.

ඉබ්බා නැති වූයේ මේ අන්දමිනි.

12

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තෙත රෙදි අට්ටාලයේ වනා හිස් කුඩයත් රැගෙන පහළට බැස්සා ය. ඈ දෙර වසා ගෙට වත් විට වටකුරු කිසිවක් පැගී බිම ඇද වැටුණා ය. හේතුවකට මෙන් කිසි තුවාලයක් සිදු නො වී ය. ඈ නැගිට විදුලි පහන දල්වා බැලුවා ය.

තමාට පැගුණේ ටර්නිප් අලයක් බව ඈ දුටුවා ය. පසෙකින් ගෝවා කරටියක් ද විය. මේවා එතැනට ආවේ කෙසේ ද ? ඈ එදින කිසි එළවළුවක් මිළට ගත්තේ නැත. ඒ නිසා ඇට ඒ පිළිබඳව කිසිවක් සිතා ගන්නට බැරි විය. කොයි හැටි වෙතත් ඇට මේවා ගැන සිත සිතා ඉන්නට වේලාවක් නැත.

"හත් වළාමයි !" යනුවෙන් සිය උදහස පළ කළ ඈ නිදන කාමරයට ගමන් කළා ය.

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ග්‍රීෂ්ම කාලය ගත කිරීම සඳහා පිටිසරට යන්නට සූදනම් වෙමින් සිටියා ය. මේ නිසා ඈ විසින් කළ යුතු වූ වැඩ රාශියක් විය. ඈ පරණ මේස රෙද්දක් ගෙන කාමරය මැද බිම අතුරා ඒ මත ලොම් කබා දෙකක්, සිවල් ලොමින් කළ රතු කර වැස්මක්, සුදු ලෝම අත් වැස්මක් සහ ලෝම හිස් වැස්මක් ද දැමුවා ය.

"අද කළ යුතු වැඩ" යන්න උඩින් ද වැඩ ලැයිස්තුව යටින් ද ලියන ලද කඩදසි කැබැල්ලක් බිත්තියේ ගසා තිබුණේ ය. මුලින් ඇති වැඩ කැපෙන සේ ඉරි ඇඳ තිබිණ. ඉතිරි වැඩ මෙසේ ය.

19 රෙදි සේදීම

20 ක්ලිමොව් ගැණි එක්ක ඇගේ බල්ලා ගැන කතා කිරීම

21 ලොම් ඇඳුම් සීත ගබඩාවට ගෙන යාම

22 මී පාසානම් මිළට ගැනීම
23 ජනේලය සේදීම

ඈ කොළය ගෙන පැන්සල් ඉරකින් අංක 19 කපා දැමුවේ ය. ඉන් පසු ටැලිපෝනය වෙතට ගොස් රිසිවරය ගෙන එම නිවාසයේ ම පහළ තට්ටුවේ ගෙයක වසන ක්ලිමොව් නෝනා ඇමතුවා ය.

මින් පසු කවදවත් ක්ලිමොව්ගේ බල්ලා තමාගේ ජනේලය යටින් ඇවිදින්නට නොයා යුතු බව ඈ කීවා ය. එසේ ගියොත් නඩෙෂ්ඩා පෙත්‍රොව්නා වන තමා උතුරන වතුර බාල්දියක් බල්ලාගේ ඇඟට වත් කර ඌ ගැන පොලීසියට ද පැමිණිලි කරන බව ඈ කල් තියා දැනුම් දුන්නා ය.

රිසිවරය ඉවත තැබූ ඈ අංක 20 පරෙස්සමෙන් කපා දැම්මා ය. අනතුරුව තොප්පිය හිසේ දමා ගෙන, ලෝම ඇඳුම් දැමූ මේස රෙද්දේ කොන් එකට ගැට ගසා ගෙන, ඒවා ග්‍රීෂ්ම කාලයට තැන්පත් කර තැබීම සඳහා භාර දීමට ශීත ගබඩාව කරා ගෙන ගියා ය.

නිඩෙෂ්ඩා පෙත්‍රොව්නා ලෝම ඇඳුම් පොට්ටනිය හිස තබා ගෙන සෙවන මාවත දිගේ ගමන් කළාය. සෙල්ලම් කරන ළමෝ, අයිස් ක්‍රීම් විකුණන්නෝ සහ තමන්ගේ වෙළඳම් බඩු වර්ණනා කරමින් කෑගසන සංචාරක වෙළෙන්දෝ මාවතේ සෑම අතින් ම වූ හ. ගස්වල කොළ සර සර හඬින් හඬවමින් සුළඟ හැමී ය. එක් මිනිසකු විකුණමින් සිටි බැලුන් බෝල රැසක් සුළඟින් සී සී කඩ විසිර ගියේ ය.

නිඩෙෂ්ඩා පෙත්‍රොව්නා මේ කිසිවක් නෑසූ-නුදුටුවන් ව ගමන් කළා ය. තරබාරු මිනිහෙක් ඈට ඉදිරියෙන් ගමන් කෙළේ ය. ඔහු ඇගේ ඉක්මන් ගමනට බාධාවක් වූ නිසා නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තරහෙන් සිටියා ය. තර මිනිහාගේ හිස මත ලොකු කාඩ් බෝඩ් පෙට්ටි තුනක් විය. ඔහු ළමයින්ගේ ඇඟේ නොහැපෙන ලෙස පරෙස්සෙමින් ඔවුන් මග හැර ගමන් කෙළේ ය. මේ නිසා නඩෙෂ්ඩා පෙත්‍රොව්නාට ද පමා වෙන්නට සිදු විය.

වැල නො කැඩී තමන් දෙසට වේගයෙන් දුව එන ළමා රංචුවක් ඔවුන්ට හමු විය. ඉදිරියෙන් ම ඕට් පිටි පාර්සලය රැගත් කැතී විය. ඈ පස්සෙන් තාන්යා, ලිලී සහ නීනා ද අත දරුවා වඩා ගත් ආයා ද පුංචි දැරියන් දෙදෙනෙක් ද තමාගේ හත් වැනි පාන් වළල්ල

හපමින් යන මැකරෝනි ළමයා ද වූ හ. හාවුන්ට කෑම දිය යුතු වේලාව පසු වී හුඟක් කල් ය. ඔවුන් හාමතේ මිය යන්නටත් පුළුවන. ඒ නිසා කැතීගේ කලබලය ඉතා බලවත් විය.

ඈ වේගයෙන් දුව ආ ගමන් පෙට්ටි හිස මත තබා ගෙන ආ තර මිනිහාගේ ඇඟේ හැපුණා ය.

"හ්ම්හ්........" කියැවුණු තර මිනිහා එහෙම ම හිඳ ගත්තේ ය. පෙට්ටි ඒ අතට මේ අතට වීසි විය. දූරියෝ අත් වනමින් යටි ගිරියෙන් කෑගැසූ හ. පෙට්ටි තුළින් නොයෙක් පාට නොයෙක් මහත ඇති රබර් බෝල රාශියක් පිට වී සී සී කඩ විසිරී ගියේ ය.

"අනේ ! මට බොහොම කණගාටුයි" බෝල පෙරළී යනු දුටු කැතී සංවේගයෙන් කීවා ය.

ලොකු ම බෝලය වීසි වී ගොස් නඩෙෂ්ඩා පෙත්‍රොව්නාගේ ඇඟේ හැපුණි. ඈ හැපිත්තක් මෙන් කිපුණා ය.

"හත් වළාමයි ! මෙහෙමත් නැහැදිච්ච කමක් !" ඈ කෑගැසුවා ය.

"යස වැඩේ ! ඔක්කෝට ම පාර ඉඩ දෙන්න මම මෙච්චර මහන්සි වෙලත් මාව පෙරළගෙන දුවනවා" තර මිනිහා ගොත ගසමින් කීවා ය.

ළමෝ තරබාරු මිනිහා නැගිටුවා ඔහුගේ ඇඳුම්වල දූවිලි පිස දමන්නට වූ හ. එහෙත් ඔහු ඔවුන් ඉවතට පන්නා හැර ගොත ගසමින් මෙසේ කීවේ ය.

"හරියට බෝල එකසිය විසි පහක් ඇති ! කෝ දැන් ඒවා ඉවරයි..... ඉවරයි....... ඔක්කෝම ඉවරයි...... !"

ඔහු වට පිට බැලුවේ ය. බෝල හැම තැන ම විසිරී තිබිණ. සෙවන මාවතේ සෙල්ලම් කරමින් සිටි ළමෝ ඒවා රැගෙන බිම ගසා අල්ලන්නටත් ඔවුනොවුන් වෙත දමා ගසන්නටත් වූ හ.

පිරිමි ළමෝ බෝලවලින් පා පන්දු ගැසූ හ. ගැහැණු ළමෝ බිම ගසා ඇල්ලීමේ තරග පැවැත් වූ හ. ළඳරු පාසැල ඇරී සත්සුන් ලෙස දෙ පේළියට ආ පොඩිත්තෝ කුරුල්ලන් මෙන් කෑගසමින් විසිර ගොස් බෝල අල්ලන්නට දිවූ හ. ලොකු ළමයි සහ වැඩිහිටියෝ පවා සිනා සෙමින් බෝල අවුලන්නට වූ හ.

තරහ මුහුණින් සිටියේ නඩෙෂ්ඩා පෙත්‍රොව්නා පමණකි. ඈ ගිරිය පුප්පා මෙසේ කීවා ය.

"හත් වළාමයි ! මෙහෙමත් අපරාද ! දන්වන්න පොලීසියට"

තර මිනිහා හිටි හැටියේ ම නිහඬ වූයේ ය. ඔහු හිස ඇලයට ඔසවා ප්‍රීතියෙන් පොදි කන ළමයින් දෙස බැලී ය.

"එන්න එන්න ඔක්කොම, එකතු කරමු !" කියමින් ඔහු ද ළමයින්ගේ ක්‍රීඩා පිළිබඳ උනන්දුවට හවුල් විය. නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ඔහුට බැණ වැදුණා ය. එහෙත් ඔහු ඈ කියන්නක් ගණන් නො ගෙන බෝලයක් පසු පස දිව්වේ ය.

කැතී සහ ඇගේ යහළුවන් ඔහුගේ උදව්වට පැමිණි බව කිව යුතු නොවේ.

"බෝල කීයක් තිබුණ ද ?" කැතී ඇසුවා ය.

"එක සිය විසි පහයි" තර මිනිහා කීවේ ය.

දැරියක් ඇඳ ඇතිරිල්ලක කිසිවක් ඔතාගෙන යනු නඩෙෂ්ඩා පෙත්‍රොව්නා දුටුවා ය. දැරිය ශීත ගබඩාවට ඇඳුම් ගෙන යති යි ද ශීත ගබඩාවේ දිග පෝළිමක් ඇතැයි ද ඈ සිතුවා ය. ඒ නිසා දැරියට ඉස්සර වීමට සිතා ඈ යුහුව ගමන් කළා ය. දැරිය එතැන පසු කර නොයන්නට නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තමාගේ ඇඟට බෝලයකින් ගැසීම ගැන වන්දියක් ඉල්ලා සිටිනු සිකුරු ය.

ශීත ගබඩාවේ පෝළිමක් නො වී ය. ගබඩාවේ ලිපිකරු කුවිතාන්සියක් පිළියෙල කරන අතර තුර ඈ තමාගේ ලැයිස්තුව ගෙන එහි අංක 21 හරහා ඉරක් ඇන්ද ය.

"මුගටි ලොම්වලින් පෝරු දැමූ පිරිමි කබා එකයි" යනුවෙන් තොල් මතුරා එය සටහන් කර ගත් ලිපිකරු දෙවැනි කබාය අතට ගෙන ගසා දැමුවේ ය. එයින් යම් කිසිවක් ඉවතට වැටුණේ ය.

"අපි හාවුන් බාර ගන්නේ නැහැ" ලිපිකරු කීය.

"හාවුන් ! ඔබට කියා දෙන්නම්, ඔය කබාය ඔස්ත්‍රෙලියන් කැන්ගරු"

"කැන්ගරු ? මේ කැන්ගරුද ?" සුදු හාවාගේ දෙකනින් අල්ලා ඔසවමින් ලිපිකරු ඇසුවේ ය.

නඩෙෂ්ඩා පෙත්‍රොව්නාගේ ඇස් ඔලු ගෙඩියෙන් පිටතට නොපැන්නා පමණි.

"ඔබ...... මා එක්ක විහිලු කරන්න හදනව ද ?" ඈ දත් මිටි කමින් ඇසුවා ය.

ලිපිකරු පැන්සලෙන් කවුන්ටරයට තට්ටු කරමින් ගරු සරු ලෙස කථා කෙළේ ය.

"මැතිණිය ! අපි මේ ගැන වාද කරන්න උවමනා නැහැ. ඔබේ සුරතලා ඔබ ගෙදර ගෙනියන්න."

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ගල් ගැහී බලා සිටියා ය.

"මට බළලුන්ගෙන් ගෙදර ඇති කරදර මදිවාට තවත් සතෙක් මගෙ ඇඟේ ගහන්න හදනව ! මට මොටද ඔබේ ඔය නාකි හාවා ?" ඈ බැණ වැදුනා ය.

"පළමු කොට ම මැතිණිය ! මූ නාකි හාවෙක් නොවෙයි, මූ තරුණ එකෙක්. දෙවනු ව ඔබේ කබායෙන් වැටුණ නිසා ඌ ඔබේ හාවා විය යුතු යි. අන්න ඌ වැටුණේ මගේ කබායෙන් නම් ඌ මගේ හාවා විය යුතු තමයි. ඔහු ඇය සන්සුන් කරන ලෙසින් කීවේ ය.

එහෙත් නඩෙෂ්ඩා පෙත්‍රොව්නා සන්සුන් නුවූවා ය.

"මම අහල තියනවා කබාවල කාවුන් හෙම ඉන්න බව. ඒත් හාවුන්........?" ඈ හදිසියේ ම කතාව නැවැත්තුවා ය. ඇගේ මුහුණ රතු විය. තමා අට්ටාලයට යද්දී දෙර හැර තිබියදී ම ගිය බව හදිසියේ ම ඈට මතක් විය.

".......ඔව්, ඔය මගෙ අසල් වැසියන්ගෙන් මට ලැබෙන තෑගි තමයි ! මම දන්නව ඔය වැඩේ කළේ කවුද කියල..... අර ක්ලිමොව් මහගෙ තමයි..... ඕකි කරන්නෙ ම ඔහොම වැඩ."

"නඩෙෂ්ඩා පෙත්‍රොව්නා හාවා උදුරා ගෙන මේස රෙද්දේ ඔතා ගත්තා ය."

ඈ ශීත ගබඩාවේ සිට කෙළින් ම ගෙදර ගියා ය. සිතේ පැවැති කැළඹීම නිසා මිළට ගන්නට සිටි මී පාසානම් ගැන ඈට සම්පූර්ණයෙන් අමතක විය.

13

තරබාරු මිනිහා හති ලමින් බංකුවක වාඩි වී සිටියේ ය. ඔහුගේ උකුල මත පලුදු වූ පෙට්ටි දෙකක් විය. මුළුමනින් කැඩුණු තුන් වැනි පෙට්ටිය ඔහුගේ පා මුල දමා තිබුණේ ය.

කැතී සහ ඇගේ යාළුවෝ බෝල රැගෙන හැම පැත්තෙන් ම ඔහු වෙත දුව ආ හ. ළදරු පාසල ඇරී එමින් සිටි පොඩිත්තෝ ද එසේ කළ හ. සෙවන මාවතේ සිටි සෑම මාදිළියක ම මිනිස්සු ද එසේ කළ හ. ඔවුන් බෝල පෙට්ටිවලට දමත් ම තරබාරු මිනිහා ගොත ගසමින් ගණන් කෙළේ ය.

"....... අනූ හතරයි, ඔබට ස්තුතියි. අනූ පහයි, ඔබ බොහොම කාරුණික යි. අනූ හයයි, බොහොම ස්තුතියි. අනූ හතයි, දැන් ඉඩ නෑ ! අනූ අටයි, පොඩ්ඩක් අල්ලගෙන ඉන්න අනූ නවයයි, තව එකකට වත් ඉඩ නෑ !" ඔහු විළාප නගන්නට විය.

මේ මොහොතේ දී තාන්යා ඉදිරිපත් ව කාරණය තමා අතට ගත්තා ය. ගෙනෙන බෝල ඈ බාර ගෙන කැතී, ලිලී මඟ දී හමු වූ දැරියන් දෙදෙනා සහ මැකරෝනි ළමයාට බෙදා දුන් හ. ආයා අත දරුවාගේ කම්බිලිය අස්සේ බෝල කීපයක් සඟවා ගත්තා ය. තර මිනිහා කට කන් දෙක ළඟට යන තුරු විරිත්තා ගැණගෙන ගියේ ය.

"....... එක සිය විසි හතරයි, එක සිය විසි පහයි, එච්චරයි, මොනවා ? එක සිය විසි හයක් !" ඔහු පුදුමයෙන් කෑගැසුවේ ය.

"බෝල කීයක් තිබුණා ද?"

"එක සිය විසි පහයි"

හැම දෙන පුදුමයට පත් ව බෝල සියල්ල නැවත ගැන බැලූ හ. ඇත්තට ම එහි එක සිය විසි හයක් විය. මේ වැඩිමනක් බෝලය කෙසේ ලැබිණි දැයි කිසිවෙක් නො දත් හ.

තරබාරු මිනිහා පෙට්ටි දෙක වසා ඔසවා හිස උඩ තබා ගත්තේ ය. එහෙත් පෙට්ටිවලට නොදැමිය හැකි වූ බෝල ගෙන යන්නේ කෙසේ ද ?

"ඔයාට හුඟක් දුර යන්න තියෙනව ද ?" කම්බිලියෙන් පිටට එන්නට දඟලන බෝලයක් ඇතුළට තල්ලු කරමින් සිටි ආයා ඇසුවා ය.

"වැඩි දුරක් නෑ. හන්දිය ළඟ ම තියන සෙල්ලම් බඩු සාප්පුවට" තර මිනිහා බලාපොරොත්තු සහගත ව කීවේ ය.

මෙසේ හන්දිය ළඟ පිහිටි සෙල්ලම් බඩු සාප්පුව කරා යන බෝල පෙරහර ඇරඹිණ. එහෙත් එය පළමු වැනි හන්දිය නොව හත් වැනි හන්දිය විය.

කැතී ඇගේ ඕට් පිටි පාර්සලය ද ලොකු බෝලයක් ද පුංචි බෝල තුනක් ද රැගෙන ගියා ය. බඩ ගින්නේ සිටින හාවුන් ගැන ද දූනට නොඅනුමානයෙන් අවදි වී ඇති මියෙල්කා ගැන ද සිහි වූ ඈ ගැඹුරු සුසුමක් හෙළුවා ය. මේ වේලාවේ ඇගේ හාවුන්ගෙන් එකකු පරණ මේස රෙද්දක ඔතා ඈ ඉදිරියට ම ගෙනෙන බව ඈ දැන සිටියා නම් ඇට කුමක් සිතෙනු ඇද්ද ?

"මම දන්නවා...... මේ වැඩේ කළේ ක්ලිමොව් ගෑණි තමයි. අහල පහළ සේරම මා එක්ක තරහයි. උන් දන්නවා මට සිවුපාවුන් රුස්සන්නෙ නැති වග. ඒ හින්ද උන්ගෙ බළල්ලුයි, බල්ලොයි, හාවොයි ඔක්කොම මට විරුද්ධ ව එවනවා. හොඳයි, හිටපල්ලා ! මේ සැරේ මම ක්ලිමොව් ගෑණිට හොඳ පාඩමක් උගන්වන්නම්. ඔව්, මම ඒකිට උගන්වන්නම්."

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තට්ටු නිවාසයේ මිදුල හරහා ගමන් කළා ය. ක්ලිමොව් පවුලේ උදවිය තමා ගැන කතා කරමිනුත් තමාට දෙස් පවරමිනුත් කාලය ගෙවනු ඇතැයි හදිසියේ ම ඇට සිතිණ. ඒ නිසා ඈ හොරෙන් ම ක්ලිමොව් ගෙදර ජනේලය වෙත රහසින් කන් දී ගෙන සිටියා ය.

එහෙත් ක්ලිමොව් පවුලේ උදවිය කතා කරමින් සිටියේ ඈ ගැන නොවේ.

"මම හිතනවා හොඳ ලොකු කේක් ගෙඩියක් සුදුසුයි කියලා" ක්ලිමොව් මාතාව කීවා ය.

"අගෙයි ! චොකලට් වලින් වැඩ දමාපු එකක්" ඇගේ පුතා වන තරුණ සාශා කීවේ ය. ඔහු සංගීත පාසලට ඇතුළු වීමේ විභාගයෙන් සමත් වීම නිසා ප්‍රීතියෙන් සිටියේ ය.

"බොහොම හොඳයි. මගෙ විරුද්දයක් නැහැ" පියා කී ය.

"එහෙනම් ඔයා ඒක ගේන්න !" මව කීවා ය.

පියා කේක් ගෙඩිය මිළට ගන්නට ද ඔහුට එය ගේන්ට වේලාවක් නො ලැබෙන නිසා කන්තෝරුවේ කෙනකු අත ගෙදරට එවන්නට ද පොරොන්දු වූයේ ය.

ක්ලිමොව් ගෙදර කතා බහ ඉන් අවසන් විය. එහෙත් නඩෙෂ්ඩා පෙත්‍රොව්නාගේ සැකය දුරු නො වී ය.

අනෙක් අතට කිසියම් හේතුවක් නිසා හාවා තමාගේ ගෙට දමන ලද්දේ ක්ලිමොව් නෝනා විසින් ම යැයි ඈ තදින් සිතා ගත්තා ය. ඇගෙන් පළි ගත යුතු අන්දම ගැන අපූරු අදහසක් සිය හිතට නැගුනු නිසා එය ක්‍රියාවෙහි යෙදීමට සිතූ නඩෙෂ්ඩා පෙත්‍රොව්නා වහා ගෙදර ගියා ය.

අල්මාරිය විවෘත කළ ඈ තමා පීත්ත පටි, පරණ අත් මේස්, රේන්ද පටි කෑලි ආදිය දැමීමට පාවිච්චි කළ ලොකු කේක් පෙට්ටියක් ගෙන එය හිස් කළා ය. ඊට පසු හාවා පෙට්ටිය ඇතුළට දමා ඌට හෙල්ලෙන්නට බැරි වන ලෙස ඉඩ ඇති තැන්වල කපු පුළුන් අසුරා පෙට්ටියේ පැතිවල සිදුරු කීපයක් ද කපා එය අලුත් පීත්ත පටියකින් බැන්ද ය.

"කදිම කේක් ගෙඩිය ! චොකලට් වැඩ දාපු එකක් !" ඈ තමාට ම ප්‍රීතියෙන් කියා ගත්තා ය.

ක්ලිමොව් පියාට කේක් ගෙඩිය මිළ දී ගෙන ගෙදර එවීමට ගත වෙති යි සිතෙන තරම් වෙලා බලා සිටි ඈ ලේන්සුවක් හිසේ බැඳගෙන තරප්පුවෙන් බැස ගොස් ක්ලිමොව් නිවසේ සීනුව ගැසුවා ය. දෙර ඇරුණු පසු ඈ සිය මුහුණ සඟවාගෙන "ක්ලිමොව් මහතාගෙන්" කියමින් කේක් පෙට්ටිය දික් කළා ය.

14

මිත්‍යාට ලොකු මඩුවක දී අන්ද්‍රි හමු විය. ඔහු සිය බයිසිකලයට හුළං ගසමින් සිටියේ ය. පරණ බයිසිකල් රෝදය ද දුන්නක් සහ ඊ තලයක් ද සෙල්ලම් තුවක්කුවක් ද බිත්තියේ සවි කර තුබුණේ ය.

බිත්තියෙහි වූ කුඩා සිදුරු තුළින් මඩුවට හිරු රැස් වැටී බැබලිණ. එක් හිරු රැසක් කුණු වතුර පිරී තුබූ පීප්පයක් තුළට වැටී ලෙලදිණ. පීප්පය ඇතුළේ අඩක් වතුරෙන් ඉහළට නෙරා සිටි පරණ පට්ටමක් විය. දිය මකුණෝ හිම සපත්තු ලා ගත් තවුන් මෙන් ඒ පිට ලිස්සා ගියහ. පසෙක ස්කූටරයක් සහ බිලී පිත්තක් ද අනෙක් පස පිදුරු ගොඩක් ද විය. ගේ කුරුල්ලෝ මඩුව තුළ තැන තැන පනිමින් කිචි බිචි ගෑ හ.

"ආ ඔයා ද ? මිත්‍යා දුටු අන්ද්‍රි විස්මය සහ ප්‍රීතිය පළ කරමින් කීය. "මේක තමයි මගෙ වැඩ පොළ, නරක නෑ නේද ?" ඔහු තව දුරටත් ඇසී ය.

මිත්‍යා සැනසුම් සුසුමක් හෙළී ය. මෙහි තමාගේ සතුන් හැමට ඉඩ කඩ තිබේ. ඔහු ඉක්මනින් අන්ද්‍රිට මුළු කතාන්තරය කී ය. අන්ද්‍රි බැම හකුළුවමින් අසා සිටියේ ය.

මිත්‍යා කතාව අවසාන කොට "හොඳයි, ඔයා උන් බාර ගන්නවද ?" ඇසී ය.

"ඔයා මහ බූරුවෙක්" අන්ද්‍රි කී ය.

"ඒ මොකද ?"

"ඒක තමයි"

මොහොතකට දෙදෙනා ම නිශ්ශබ්ද වූ හ.

"එහෙනම් ඔයා උන් බාර ගන්නෙ නෑ ?" මිත්‍යා දුබල හඬින් ඇසී ය.

"මොක්කුන් ද බාර ගන්නෙ ?"

"සතුන්"

අන්ද්‍රි ඔහු දෙස රවා බැලී ය.

"සතුන් ? හරියට බාර ගන්න සතුන් තවත් ඉතුරු වෙලා ඉන්නවා වගේ !

ඉස්සෙල්ල ම ඇහැ ගැහුණු එක්කෙනාට උන් දීල ! ඔයිට හොඳයි...... උන් ඔක්කොම එක පාරට දියේ ගිල්වල මරා දැම්ම නම්"

"මම එයගෙන් කුවිතාන්සියක් ගත්තා" කඩදසිය පෙන්වමින් මිත්‍යා දුබල ලෙස මිමිණුවේ ය.

"......... ඒකෙන් ඇති වැඩේ මොකද ?"

මිත්‍යා සුදුමැලි විය.

ළමෝ දෙදෙනා මුහුණින් පමණක් අදහස් හුවමාරු කරගෙන තවත් කතා නැති ව දුම්රිය පොළ කරා දිවූ හ.



15

එළිමහනේ ඇවිදින්නට යාමට අදහස් කළ තාත්තා වීදියට බැස්සේ ය. එහෙත් ඔහුට නාන බාල්දියේ කරාමය වසා යන්නට අමතක විය. තමාගේ ම ගේ ඇතුළේ මේ තරම් අරුම පුදුම දේවල් සිදු වෙද්දී ඔය කරාම ගැන මතක් වෙන්නේ කාට ද?

නාන බාල්දියේ ජල මට්ටම වඩ වඩා ඉහළ නගිත් ම කිඹුලා ද දිය මතු පිට පා වෙමින් ඉහළ නැංගේ ය. ඌ රාක්කයට ළං වීමට තරම් ඉහළට ගිය පසු එහි තුබූ ඉස්තරම් සබන් කැල්ල ගිල දැම්මේ ය. හරියට ම මේ වේලාවේ ජනේල පඩිය වෙතට පැමිණි කළු පාට කුඩා කුරුල්ලකු නිසා නො වේ නම් ඌ සබන් කැල්ල පස්සේ දත් බුරුසුවකුත් යවන්නට තිබුණි.

කිඹුලා කුරුල්ලා දෙස බලා ගෙන ඒ පැත්තට පිහිනුවේ ය. කුරුල්ලා බිය සැක නැති ව එහා මෙහා පැන්නේ ය.

මේ වන විට බාල්දියේ ජලය කොතරම් ඉහළට නැංගේ දැයි කිව හොත් කිඹුලාට බාල්දි ගැට්ට ඔස්සේ ගොස් ජනේල පඩියට නගින්නට වැඩි අපහසුවක් නො වී ය. කුරුල්ලා උගේ හිස ඔසවා කිඹුලා දෙස බැලී ය. කිඹුලා ජනේල පඩිය දිගේ ඉදිරියට ම ගියේ ය.

"පෙරට යා !" යි සැළ ලිහිණියා කෑගැසී ය. ඊට පසු ඌ අහසට නැග පියාඹා ගියේ ය. කිඹුලා ජනේල පඩිය අත් හැර වීදියට ඉහළින් වූ බිත්ති මුදුන දිගේ බඩ ගෑවේ ය.

අල්ලපු ගෙදර නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ජනේලය සෝදමින් සිටියා ය. ජනේලය සේදීම ඇගේ ලැයිස්තුවේ 23 වැනි වැඩය විය. ජනේල පඩිය උඩ පිරිසිදු වතුර බේසමක් ද පසෙකින් කුණු වතුර බාල්දියක් ද විය.

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා දෑඩි උනන්දුවෙන් සිටියා ය. වීදුරු මදින ගමන් ඈ ගියක් ගැයුවා ය.

"රැය අඳුරු ය, රැල්ල නැඟුණි
නැඟුණි නැඟුණි අහස උසට

විදුලි කෙටුණි අහස පුරා
ගිගිරුණි හෙණ හඬ පිට පිට......"

ඈ..... බය නැති එඩිතර නැවියා-සුක්කානම රැගෙන අතට, යන තැනට එත් ම ජනේලයට ඉහළින් බිත්ති මුදුන දිගේ බඩ ගාන කිඹුලා වෙත ඇගේ ඇස් යොමු විය.

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා මහ හඬින් කෑ ගසා වතුර බාල්දියත් පෙරළා ගෙන බිම ඇද වැටුණා ය. වීදුරුව මැදීම සඳහා පාවිච්චි කළ තෙත රෙදි කඩ මාල්ල ඈ අතින් වීසි වී බිත්තියට ඉහළින් ගොස් වීදියට වැටිණ.

හරියට මේ මොහොතේ කැතීගේ තාත්තා - සිදු වූ කාරණා ගැන තෝන්තුවාවෙන් යුතු ව ජනේලයට පහළින් වීදිය දිගේ ගමන් කෙළේ ය.

හදිසියෙන් ම තෙත් වූ කිසිවක් ඉහළින් අවුත් ඔහුගේ කම්මුලේ වැදුණේ ය. ඉබේ එසවුණ ඔහුගේ අතට තෙත කඩ මාල්ල අසු විය. ඔහු එය අතට ගෙන ඒ දෙස දුක් මුසු බැල්මක් හෙළා එයත් රැගෙන අරමුණක් නැති ව ගමන් කෙළේ ය.

ඔහු වංගුව ළඟ නැවතී සිගරැට්ටුවක් ගැනීම සඳහා සාක්කුවට අත යැවී ය. ඔහුගේ පුදුමයට මෙන් කන්නාඩි කොපුවක් අතට අසු විය. ඒ ඔහු ඇවිදින්නට යන විට ඇහේ දමන කන්නාඩි කුට්ටම ය. ඔහු එය ඇහේ ලා ගත්තේ ය.

හිරු බැබලිණ. ගස් වැල් කොළ පාටින් ද අහස නිල් පාටින් ද දිස් විය. කුරුල්ලෝ ගී ගැයූ හ. සෙල්ලම් කරන ළමෝ "ඔට්ටුයි" කියමින් කෑගැසූ හ.

ලෝකය යම්තමින් වත් වෙනස් වී නැති බව දුටු තාත්තා සොම්නසින් උතුරා ගියේ ය.

"අනේ පව් ! මේ ඔක්කොම මගෙ කන්නාඩිය නොතිබුණ හින්ද නොවැ !" ඔහු කීවේ ය. ඔහු ගිනි කූරක් ගසා සිගරැට්ටුවක් දල්වා ගත්තේ ය.

තාත්තා සිටියේ වහලෙන් වැහි වතුර බැස යන බෙලෙක් පයිප්පය ළඟ ය. හදිසියෙන් ම පයිප්පය තුළ සට සට ගාන ශබ්දයක් ඇසිණ. ඔහු තිගැස්සුණේ ය.

සෝෂාව ක්‍රමයෙන් වැඩි විය. මොහොතකින් පයිප්පය තුළින් කිඹුලකුගේ ඔළුව මැත් විය.

16

හාවුන්ට කෑම දිය යුතු වේලාව ඉක් මී ඇති නිසා කෙළි බඩු සාප්පුවෙන් පිට වූ කැතී කෙළින් ම ගෙදර දිව්වා ය. ඈ පසු පස ලීලී, තාන්යා, තීනා, නාඳුනන ගෑණු ළමයි දෙදෙනෙක්, නාඳුනන පිරිමි ළමයි දෙදෙනෙක්, අත දරුවා වඩා ගත් ආයා සහ තමාගේ අට වැනි පාන් වළල්ල හපමින් යන මැකරෝනි ළමයා ද වූ හ. ඔවුහු තට්ටු නිවාසයේ මිදුලට දිවූ හ.

මිදුලේ පුංචි දැරියෝ දෙදෙනෙක් කඹයක් කරකැවූ හ. ඕල්ගා ස්මිර්නෝවා කඹය පැන්නා ය. ඔවුහු කඹය උස් කොට කරකැවූ හ; පහත් කොට කරකැවූ හ; වේගයෙන් කරකැවූ හ; සෙමින් කරකැවූ හ; ඇට වරද්දන්නට හැකි සෑම තැනක් ම යෙදූ හ. ඒත් බැරි විය. ඕල්ගාට ඇත්තේ කඹ පැනීමෙහි පුදුම දක්ෂකමකි.

"එයා හරි ආඩම්බරයි" එක් දැරියක් කළකිරුණු හඬින් කීවා ය. "කැතී, ඇවිත් එයාට පෙන්නන්න ඔයාගෙ හපන් කම්."

එහෙත් කැතී නැවතුණේ වත් නැත. වෙන ඕනෑම වේලාවක නම් නියම කඹ පැනීම කුමක් ද කියා ඈ ඕල්ගාට පෙන්නා දෙනු නියත ය. එහෙත් දැන්......?

"වෙලාවක් නෑ," කැතී කීවා ය.

"ඔය ගොල්ලො කොහෙද යන්නෙ ?" දැරියෝ ඇසූ හ.

"කිඹුලෙක් බලන්න" මැකරෝනි ළමයා ගැඹුරු හඬින් උත්තර දුන්නේ ය.

බාලිකාවෝ විස්මයෙන් මුව අයාගෙන කඹය අත් හැර ඔවුන්ට එකතු වූ හ.

ආයාගේ අත දරුවා අඬන්නට පටන් ගත්තේ ය. "තව හුඟක් දුරද ?" ආයා ඇසුවා ය.

කැතී සහ කිඹුලා

"මෙහෙ තමයි, මේ අපේ ගෙදර" කැතී කීවා ය.

මේ අතර උස ගසක මුදුනින් හඬක් ඇසුණේ ය.

"හලෝ !"

කැතී භ්‍රාන්ත වූවා ය. ඈට නිකම් ම උඩ බැලුණේ ය. සැළ ලිහිණියා මැපල් ගහක වසා සිටිනු දුටු ඈට කෙඳිරි ගෑවුණේ ය.

"රජයේ දේපල !" ඈ බලාපොරොත්තු සුන් වූ හඬින් මිමිණුවා ය.

අත දරුවාගේ මොර දීමට හය වූ කුරුල්ලා ඉගිලී ගියේ ය. කැතී මහ හඬින් හඬමින් ගෙදර දිව්වා ය.

17

මියෙල්කා බංකුව ඉදිරියේ ඇන තියාගෙන උන්නා ය. ඈ ළඟ බෝනික්කාගේ හිස් සෙල්ලම් කරත්තය විය. ඈ රස කැවිලි දවටුම් පත් නවා ඒවායේ රූප කෙළින් අතට සිටින සේ බංකුවේ හිදැස්වල ගැසුවා ය.

රූප ඇගේ සාදයට පැමිණි අමුත්තෝ වූ හ. ඈ අමුත්තන්ට සංග්‍රහ කළා ය. පළමුවෙන් පැමිණි අමුත්තෝ නම් "චොකලට් රස" "වැල් මී පෙති" "පෙපර්මින්ට්" සහ "පැණි පෙති" වූ හ.

"ආ, මෙන්න එනවා ස්කොච් කාරයා!" කියමින් ඈ "ස්කොච් ටොෆි" යන්න මුද්‍රිත දවටනයක් හිදැසක ගැසුවා ය.

"වාඩිවෙන්න, කොහොම ද සැප සනීප ? මට නම් හරි හොඳයි. කන්න කේක් කෑල්ලක් !" කියමින් ඉස්කුරුප්පු ඇණය ස්කොච් කාරයාට පිළිගැන් වූ ඈ පෙරැත්ත කළා ය. සිය ප්‍රියතම අමුත්තා වූ පැණි පෙති අමතා "එහෙනම් ඔයා චොකලට් කෑල්ලක් ගන්නෙ නෑ !" කියමින් ලාකඩ කෑල්ල පිළිගැන්නුවා ය.

"ඉතින් අපි සෙල්ලම් කරමු. මම ගණින්නම්" කී ඈ රූපවලට ඇඟිල්ල තබමින් මේ ගීය කීවා ය.

"රන් ඕවිල්ලක් මත්තේ
රජුන් මැතින් හිඳ ගත්තේ

මැහුම් කරුත් කෝකි අප්පු
රෙදි මාමා නැති කුලප්පු

වහන් කරුයි සපත් තුවයි
අන්තිමට ම ඉන්නෙ ඔයයි"

"ඔයා" වුයේ පැණී පෙති ය.

එවිට ම කැතී ඉකි ගසමින් එතැන පසු කර ගෙන දිව්වා ය. ඈ පස්සේ දැරියෝ රංචුවක් දිවූ හ. පස්සෙන් ම අත දරුවකු උකුලට තෙරපමින් තරුණියක් දිව්වා ය.

ඔවුහු පරණ පීප්පයක් උඩ වාඩි වී-බිත්තියට හේත්තු වී සිටි තාත්තා පසු කර ගෙන දිවූ හ.

ගාලගෝට්ටිය ඇසී හිස ඔසවා බැලූ තාත්තා විලාප නගමින් තමා පසු කර දුවන සිය සිඟිති දූවරුන් දෙදෙනා ද ඔවුන් අනුව දුවන මේ අපූරු කට්ටිය ද දුටුවේ ය.

"මේක හීනයක්ද ?" ඔහු කොඳුළේ ය.

රංචුවේ අන්තිමයාත් තමා පසු කර යන තෙක් බලා හුන් තාත්තා හිටි හැටියේ ම මහත් කැළඹීමකට පත් වුණේ ය. ඔහු වහා නැගිට තුවාය අතට ගෙන වනමින් ඔවුන් පස්සේ දුවන ගමන් මෙසේ කෑගැසුවේ ය.

"ගේ ඇතුළට යන්ට එපා !"

සමූහයාගේ ඝෝෂාව සහ අඩි ශබ්දය නිසා තරප්පු දෙවනත් විය. තරප්පු පේළියේ මැද සිටි ආච්චි ඔවුන්ගේ ඇඟේ නො හැපී යන්තම් බේරුණේ බිත්තියට හේත්තු වීමෙනි. ඈ දෙ වැනි වතාවටත් එළවලු රැගෙන එමින් සිටියා ය.

බියෙන් තැති ගෙන ඇස් ඔරවා ගත් කැතී ඉදිරියෙන් ම දුවනු ආච්චි දුටුවා ය. ඒ ළඟට සෙල්ලම් කරත්තය ඇදගෙන පඩිවල හප්පමින් මියෙල්කා දිව්වා ය. තමාගේ ම පුතා තුවායක් වනමින් ඔවුන් පසුසේ එළෙව්වේ ය. පස්සෙන් ම තමා කවදාවත් දැක පුරුදු නැති ළමයි පේළියක් දිවූ හ.

ඕනෑ ම හදිසියක දී ආච්චිගේ සිහි බුද්ධිය අවුල් නොවේ. "බින්දුවයි එකට ටැලිපෝන් කරන්න. ගිනි නිවන හමුදාවට" කියා කෑගසමින් ඈ ද ඔවුන් පසු පස දුවන්නට පටන් ගත්තා ය.

ගෙට ඇතුළු වූ පළමු වැන්නා කැතී ය. හිස් සපත්තු පෙට්ටිය සහ ලී පෙට්ටිය ගේ මැද මුතින් අතට දමා තිබිණි.

"කිඹුලා ගිහින් !" කැතී කෑගැසුවා ය. ඇගේ ස්වරය සංවේග දයක විය. සියල්ලෝ තිහඬ ව බලා උන් හ.

"හරි වැඩේ නේද ?" නිහැඬියාව කඩමින් ලිලී තොල් මතුළා ය.

"හරි බොරු මල්ල ! අපිව රැවැට්ටුවා !" යි ආයා කෝපයෙන් කෑගැසුවා ය. ඈ යටි ගිරියෙන් මොර දෙන අතර දරුවාට ද අතුල් පහරක් ගසා දෙර තදින් වසා ගෙන පිට වී ගියා ය.

18

මාතිශ්කිනෝ දුම්රිය පොළින් ඈතට යත් ම දුම්රියේ වේගය කෙමෙන් වැඩි විය. යළිත් විදුලිය කම්බි ඉහළ-පහළ යනු රිය මැදිරියේ අනෙක් පස කවුළුවෙන් පෙනිණ. මිත්‍යා සහ අන්ද්‍රි කතා නැති ව හිඳ ගෙන හුන් හ.

දුම්රිය පොළට එන තුරු මඟ දී ද දුම්රිය එනතෙක් රිය පොළේ දී ද අන්ද්‍රි මිත්‍යාට බැණ වැදුණේ ය. තමාට බාර දෙන ලද පාසලට අයිති සතුන් තමා විසින් ම මරා දමනු ලද්දක් මෙන් අසරණ මිත්‍යාට හැඟිණ.

"ඇත්තට ම මම වගේ බූරුවෙක් !" ඔහු තමා ගැන ම පිළිකුලින් සිතුවේ ය.

අන්ද්‍රි ඔහු දෙස යටැ'සින් බැලුවේ ය. දුම්රිය පහසුවෙන් පීලි දිගේ ඉදිරියට ඇදෙයි. අන්ද්‍රිගේ කෝපය ක්‍රමයෙන් නිවී ගියේ ය. ඇතැම් විට තමා මිත්‍යා කෙරෙහි ඕනෑවට වඩා දැඩි වී දැයි ඔහුට සිතිණ. කලින් නොහඳුනන දැරියෝ හැම දෙනා ම විශ්වාසය නොතැබිය හැකි අය නොවෙති. කොයි හැටි වෙතත් මෙතරම් කෙටි කාලයක් තුළ දී සතුන්ට කිසි යම් උවදුරක් සිදු විය හැකි ද ?

අන්ද්‍රි මිත්‍යා ගැන දුක් විය. ඔහු අන්තිමේ දී නිහැඬියාව බින්දේ ය.

"දන්නවද ? වෙලේ පහළ දිය කඩිත්තක් තියනවා - වේල්ලක් දමා ගත්තොත් අගෙයි කිඹුලාට ඉන්න......මොකද ඔයා කියන්නෙ ?"

එහෙනම් තවත් බලාපොරොත්තු තියනවා ! කියන්නාක් මෙන් මිත්‍යා හිස එසවී ය.

"ඒක අපූරුයි" මිත්‍යා කීවේ ය. ඔහුගේ මුහුණ දීප්තිමත් විය. හාවුන් ගැන අන්ද්‍රිගේ අදහස දැන ගැනීමට සිතූ ඔහු මෙසේ ඇසී ය.

"හාවුන් ගැන කොහොමද ? ඔයාට උන් තියාගන්න තැනක් නැද්ද ?"

"ඇයි නැත්තෙ ? මට තියෙන්නෙ එළුවා වෙන තැනකට දන එක විතරයි"

ළමෝ දෙදෙනා සුහද හැඟීම් ඇත්තාහු කිඹුලා, සැළ ලිහිණියා සහ හාවුන් රැක බලා ගන්නා ආකාරය ගැන සාකච්ඡා කළ හ.

19

හිස් කුඩු දුටු කැතී මහ හඬින් වැළපෙන්නට වූවා ය.

ලිලී, තාන්යා සහ නීනා මුල්ලකට වී කසුකුසු ගාන්නට වූ හ. මියෙල්කා කැතී සනසන්නට තැත් කළා ය. ඒත් ඇට කළ හැකි දේ කුමක් ද? ආච්චි සුසුම් ලෑවා ය.

තාත්තා පමණක් ප්‍රීතියෙන් ද ධෛර්යමත් ව ද සිටියේ ය. හාවුන්, සැළ ලිහිණියා සහ කිඹුලා ගැන කැතී ඔහුට විස්තර කළ වේලේ සිට ඔහු නැවතත් ප්‍රකෘති ස්වභාවයට ම පත් විය. දැන් ඔහුට සෑම දෙයක් ම පැහැදිලි ය.

"නවත්වනව ඇඬිල්ල, අපි හරියට හෙව්වොත් උන් ඔක්කොම ඉක්මණින් සොයා ගන්න බැරි වෙන්නෙ නෑ. හොඳයි, ඉස්සෙල්ලා ම අපි හිතා බලමු. හාවුන් කොහාට යන්න ඇද්ද කියා."

ආච්චි විස්මයෙන් මුව අයා ඔළුවේ අත් ගසා ගත්තේ ය.

"අනේ දෙයියනේ ! මම දන්නවා එකෙක් ඉන්න දිහා. මමයි ඌ එහාට දැම්මෙ ! පොඩ්ඩක් ඉන්න" කියමින් ඈ තරප්පුව දෙසට දිව්වා ය.

"හොඳයි, එක හාවෙක් හම්බ උනා. දැන් කල්පනා කරමු, ඉබ්බාට කුමක් සිදු විය හැකි ද කියා"

මියෙල්කා විලාප නඟන්නට පටන් ගත්තා ය.

"මම දන්නෙ නෑ........ ඌ මගෙ ඇඟිල්ල හැපුවා..... ඉතින් මම ඌ වික්කා"

"ඌ වික්කා !" තාත්තා ඇසී ය.

"ඔව්.... ටොෆි කොළවලට මාරු කළා" මියෙල්කා පාපෝච්චාරණය කළා ය. "අගේ ඇති කොළ....... බලන්න

ලස්සණ !" කියමින් රස කැවිලි දවටුම් පත් ද ඉස්කුරුප්පු ඇණය සහ ලාකඩ කෑල්ල ද සෙල්ලම් කරත්තයෙන් ඉවතට ගත්තා ය.

"චා...... චා...... චා !" බලාපොරොත්තු කඩ වුණු ස්වරයෙන් තාත්තා කීය.

"විගහට ගිහින් ඌ ආපහු මාරු කර ගන්න !" දූරියෝ කෑගැසූ හ.

මියෙල්කා රස කැවිලි දවටුම් පත් ටික එක් අතකින් ගෙන-ඉස්කුරුප්පු ඇණය සහ ලාකඩ කෑල්ල අනෙක් අතේ මිට මොලවා ගෙන දිව්වා ය.

"එහෙනම් ඉබ්බත් හරි" තාත්තා කීවේ ය.

"කිඹුලා?...... ඔව් ඒකට මම යන්න ඕනෑ" යි ඔහු දිග මිටක් ඇති ගේ අමදින කොස්ස ද රැගෙන පිටත් විය. යන ගමන්-

"කිඹුලා කිඹුලා
පියකරු කිඹුලා
හිනැහෙණ ලස්සණ
දත් ටික මැදලා!"

යන කවිය සිහින් හඬින් ගැයුවේ ය.

දූරියෝ කැතී වට කර ගත් හ. මේ වන විටත් ඔවුන් සැළ ලිහිණියා අල්ලා ගත හැකි උපාය රාශියක් ගැන සිතා හමාර ය. තාන්යා ලණු කෑල්ලකින් තොන්ඩුවක් සැදුවා ය. ලිලී මියෙල්කාගේ සමනළයින් අල්ලන අතංගුව සොයා ගත්තා ය. තීනා රබර් බෝල දමා විකුණන දැලක් සොයා ගෙන එන්නට කැතීට කීවා ය.

බළලා ගැන කවුරුත් සැලකිල්ලක් දක්වූයේ නැත. ඌ මුහුණ සෝද ගෙන ජනේල පඩියෙන් උඩට නැග බිත්ති මුදුන දිගේ හෙමින් හෙමින් ගමන් කෙළේ ය.

20

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තමාගේ කකියන හිස තුවායකින් වෙලා ගෙන ක්‍රෝධයෙන් වෙව්ලමින් සිය තිවසේ වාඩි වී සිටියා ය.

දෙරේ සීනුව වැදුණි. ඈ දෙර ළඟට ගොස් යතුරු සිදුරෙන් එබිකන් කර බැලුවා ය. කැතීගේ ආච්චි එළියේ සිටී. නඩෙෂ්ඩා පෙත්‍රොව්නා දෙර හැරියා ය.

"සමා වෙන්න" ආච්චි අවුල් සිතින් කීවා ය. "පොඩි වැරදීමක් සිදු වෙලා තියනවා........ මම......."

"ඔයා හරි වෙලාවටමයි ආවෙ. ඔන්න ඔයා සාක්කියි....." නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ආච්චි සාලයට ඇද ගෙන යමින් කීවා ය. "මේ ක්ලිමොව් ගෑණිට ඕනෑ මාව මරා දන්නයි. බලන්න." කියමින් ඈ කුඩ රාක්කය යටින් ටර්නිප් අලය සහ ගෝවා ඉහටිය ගෙන ආච්චිට පෙන්නුවා ය.

"පේනවද ? මේවා මෙහෙ දැම්මෙ මගෙ මොළේ අවුල් කරල දන්න බව පැහැදිලි නේද ?"

"අනේ එයා නෙමෙයි, මමයි ඕව දැම්මෙ" ආච්චි පසුතැවිල්ලෙන් කීවා ය.

"ඔයා ! වෙන්න බෑ. ක්ලිමොව් සුද්ද කරන්න හදන්න එපා !" නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ආච්චි දෙස සැක මුසු ව බලමින් කීවා ය.

"එහෙනම් ඔයාද හාවත් ගෙට දැම්මෙ ?"

"ඔව් මම තමයි"

නඩෙෂ්ඩා පෙත්‍රොව්නා කෝපයෙන් දැවෙන්නට වූවා ය.

"ඉතින් කාගෙ ද මේ කිඹුල් තඩියා ?"

"ඌ කැතී ගෙ"

කැතී සහ කිඹුලා

"වහා ම මගේ ගෙයින් පිට වෙයන් !"යි නඩෙෂ්ඩා පෙත්‍රොව්නා කඩා පැන්නා ය. ඈ ටර්නිප් අලය සහ ගෝවා ඉහටිය වැරෙන් ආච්චි දෙසට වීසි කරමින් මෙසේ ද කීවා ය.

"මම හාවට කළෙත් ඔය ටිකයි. මගේ ඇඟේ හැපෙන්න එන කාට උනත් කරන්නෙත් ඔය ටිකයි. ගිහින් කියපන් උන්ට !"

ඈ හඬ නැඟෙන සේ වේගයෙන් දෙර වැසුවා ය.

ආච්චි දුක් බර බැල්මෙන් මඳ වේලාවක් බලා සිට, නැමී ගෝවා ඉහටිය අවුලා ගත්තා ය. අසරණ කැතීගේ කඳුලු ගැන ඈට සිහි විය. ඇගේ ඇස්වලින් ද කඳුලු කඩා වැටිණ. කෝපයට පත් ඈ ට දෙස් දෙවොල් තබමින් අතින් දෙරට ගසන්නට පටන් ගත්තා ය.

එහෙත් දෙර හැරුණේ නැත.

"අහල පහළ කිසි ම කෙනෙකුට මොහොතක් නිස්කාන්සුවේ ඉන්න බෑ, මේ ගෑණිගෙ වැඩ හින්ද !" කියමින් සාමාන්‍යයෙන් මොලොක් ගුණ ඇති කැතීගේ ආච්චි දෙරට ගැසුවා ය.

"දියන් මගෙ හාවා. ඔන්න මං කීවා, නුඹුන්නොත් වැඩිය හොඳ වෙන්නෙ නෑ ! මගෙ කැතීට හිංසා කරන්න මම උඹට ඉඩ දෙන්නෙ නෑ."

ගේ තුළින් කිසි ශබ්දයක් නො ආවේ ය. ආච්චි කෑගැසීම නවතා යන්නට ගියා ය.

"එකත් එකට ම මේ ගෑණි හාවා රෝස් කරලා කන්නත් ඇති ! ලැජ්ජ නැති හෙර" ඈ කඳුලු පිස දමමින් තොල් මතුළා ය.

21

මියෙල්කා ලියෝ සොයා සෙවන මාවත දිගේ දිව්වා ය. ඔහු කිසි තැනක දකින්නට නොවී ය. එහෙත් මිදුල් තුනක් ඇති ගෙදර ඔහු වාසය කරන බව දන්නා ඈ එහි ගියා ය.

ඔහු පළමු වැනි මිදුලෙහි නො සිටියේ ය. දෙවැනි මිදුලෙහි ද නො සිටියේ ය. තුන් වැනි මිදුල දෙසින් ආ ගොරහැඩි ශබ්ද නිසා මියෙල්කා එහි යාමට පවා බිය වූවා ය. එහෙත් වාසනාවකට මෙන් ඒ මොහොතේ ම තැපැල් කාරිය පැමිණි බැවින් මියෙල්කා පරීක්ෂා කාරී ව ඈ පසු පස ගියා ය.

ලියෝ තුන් වැනි මිදුලෙහි වූ දර කොට ගොඩක් මත වාඩි වී "මවුත් ඕගනයක්" පිඹිමින් හුන්නේ ය. මියෙල්කා ඔහු වෙතට දිව්වා ය.

"ඔයාගෙ ටොෆි කොළ ටික අරන් මගෙ ඉබ්බා ආපහු දෙන්න!" ඈ කෑගැසුවා ය.

ලියෝ එය ගණනකට නො ගෙන නළාව පිම්බේ ය.

"....... මගෙ ඉබ්බා ආපසු දෙන්න !" ඈ වඩාත් හයියෙන් කෑගැසුවා ය.

"ඔයාට ඉබ්බා මතක් වුණ වෙලාව අගෙයි, මම ඌ මේ නළාවට මාරු කළා !" ලියෝ මොහොතක් නැවතී කී ය.

"ඔයාට එහෙම කරන්න කිසි බලයක් නෑ. ඌ පාසලටයි අයිති" මියෙල්කා කීවා ය.

"ඒක හරි වැඩක් නොවැ ! එහෙනම් ඔයා කොහොම ද ඌ මට මාරු කෙරුවෙ ?"

"ඌ මාව හැපුවා !" කී මියෙල්කා සිය සොහොයුරිය ආරක්ෂා කිරීමට භාරගත් සතුන්ගේ වගතුගත් උන් ඔක්කොම නැති වූ හැටිත් විස්තර කළා ය.

"දැන් ඔය ගොල්ලො අහුවෙලා ! ඔයා දන්නවද රජයේ දේපල නාස්ති කළොත් වන දේ ?" ලියෝ ඇසී ය.

"නැහැ"

"හිරේ දනවා"

මියෙල්කා ගේ මුහුණ හැකුළුණේ ය.

"චිකේයි ! අඬන්න එපා. මම හිතනවා මට පුළුවනි ඔය ගොල්ලන්ට උදව් කරන්න" ලියෝ බැරෑරුම් ලෙස කී ය.

"ඔයාට ස්තුතියි" මියෙල්කා කඳුලු මැඩ ගනිමින් කීවා ය.

"එන්න ! ඉස්සර වෙලා පීතර හමුවෙන්න ඕනෑ" ලියෝ කී ය.

ඔවුහු දෙදෙනා ම ඊළඟට ගෙයි මිදුලට දිවූ හ.

පීතර සැඳැල්ලේ වාඩි වී හුන්නේ ය. ඔහුගේ උකුල උඩ පොතක් විය. පොත කියවීම වෙනුවට ඔහු කෙළේ සිනා සීම ය.

"පීතර, අපට ඉබ්බා දෙන්න !" ලියෝ මිදුලේ සිට කෑගැසී ය.

පීතර සැඳැල්ලේ ගරාදි වැටට හේත්තු වී පහත බැලී ය. ඔහුට සිනාව නිසා කතා කර ගන්නට අමාරු ය.

"ඉබ්බා-අපට ඉබ්බා දෙන්න" ලියෝ යළිත් මහ හඬින් කෑගැසී ය.

"මට මොටද ඉබ්බෙක් ? ඔයාගෙ තුට්ටුවක් නො වටින නාකි ඉබ්බා වෙනුවට වාල්යා මට මේ කතන්දර පොත දුන්නා !"

පිතර නැවතත් සිනා සෙන්නට පටන් ගත් විට මියෙල්කා හඬන්නට වූවා ය.

"නවත්වන්න හිනාව ! අපට ඉබ්බා ආපහු ලබාගන්න ඕනෑ" ලියෝ කෝපයෙන් කෑගැසුවේ ය. ඔහු සිදු වූ සියල්ල විස්තර කර මවුත් ඕගනය පීතර වෙතට වීසි කෙළේ ය.

"ඩිංගක් ඉන්න. මේ පිටු හත කියෝල එන්නම්"

"බෑ !" ටිකක් වත් පරක්කු වනවාට ලියෝ තරයේ විරුද්ධ විය. ඔවුහු සියල්ලෝ ම වාල්යාගේ ගෙදරට දිවූ හ.

22

වංගුවේ ලොකු සෙනඟක් රැස් වී සිටිය හ. ඔවුහු වැහි වතුර පයිප්පය තුළ හිර වී හිස පමණක් නළයෙන් එළියට දමා සිටින කිඹුලා දෙස මවිතයෙන් බැලූ හ.

ඌ සත්තු වත්තෙන් පැන අවුත් සැඟ වී සිටින කිඹුලෙකැ යි එක් මිනිහෙක් කීවේ ය. අහස් යානාවකින් ගෙන යද්දී ඌ බිම වැටෙන්නට ඇතැයි තවෙකෙක් කී ය. ඌ චිත්‍ර පටියක් තිපදවනු සඳහා ගෙනෙනු ලැබුවෙකැ යි ද පයිප්පයක් තුළ සැඟ වී සිටීම පුරුදු වීමට ඌ එහි දමා ඇතැයි ද සෙස්සෝ කී හ.

මුර කාරයා ඔවුන් හැම දෙනාට සිනාසී ඌ කිඹුලකු නොව නිකම් ඇස්බැන්දුමකැ යි කීවේ ය.

පුංචි ළමයි කිඹුලාට කෝටුවලින් සහ කම්බි කැබලිවලින් ඇන්නෝ ය. ඌ ඒවා කටින් අල්වා ගන්නා විට ඔවුහු කොක් හඬ ලා සිනා සුණෝ ය.

මැකරෝනි ළමයා පමණක් කිසි ගානක් නැති ව බලා ගෙන සිටියේ ය.

තාත්තා කොස්ස වනමින් සෙනඟ දෙපසට කර මඟ පාදගෙන එතැනට පැමිණියේ ය. ඔහු කොහු මිට කිඹුලා ඉදිරියේ දෙපසට වනමින් "වරෙන් ඔතනින් එළියට වරෙන්" යි කී ය.

එහෙත් කිඹුලා හෙල්ලුණේ නැත. ඌ දත් මිටි කෑවේ ය.

තාත්තා කොහු මිටට හේත්තු වී කුමක් කළ යුතු දැයි කල්පනා කෙළේ ය.

"ඌට හොඹු රැනක් දන්න ඕනෑ" එක් අයෙක් යෝජනා කෙළේ ය.

"ඉතින් ඇවිත් දන්නකො !" තවකෙක් යෝජකයාට සමච්චල් කෙළේ ය.

"මම වහලට නැගලා ලනුවක අග බරක් බැඳල ඒකෙන් උෟට තල්ලුවක් දෙන්නම් !" උස ගැටයෙක් අදහසක් ඉදිරි පත් කෙළේ ය.

"මම දෙනවා උඹට තල්ලුවක් ඒ වෙනුවට !" මුර කාරයා කෑගැසුවේ ය.

"කරන්න තියෙන්නෙ පයිප්පය ගලවන එකයි" මැකරෝනි ළමයා කී ය.

තාත්තා ඔහු දෙස බැලී ය. තව පාන් වළලු දෙකක් ඉතිරි ව තිබූ රැහැන ඔහුගේ ඇසට ලක් විය.

"මට ඔය පාන් වළලු දෙක දෙන්න" තාත්තා කල්පනාකාරී ව කීවේ ය.



ළමයා පාන් වළලු දුන්නේ ය. තාත්තා ඒවා රැහැනින් ඉවතට ගෙන කොහු මිට වටා වළලු මෙන් සිටින්නට දැම්මේ ය. ඊට පසු මිටේ දෙකොන අල්වාගෙන එහි මැද කොටස කිඹුලාගේ කටට දුන්නේ ය. කිඹුලා උගේ හනු දිග හැර පාන් වළලු සහිත මුසුන් මිට ඩැහැ ගනිමින් කට පියා ගත්තේ ය.

මෙහි දී කළ යුතු දෙය කාටත් සැණෙකින් තේරුම් ගියේ ය. කොහු මිට අල්වා ගැනීමට සෑම පැත්තකින් ම අත් ඉදිරියට ආවේ ය.

"හෝ-හෝ....." යැයි උස ගැටයා සූදානම් වීමේ සංඥාව දුන්නේ ය.

"හීයෝ !" කියමින් සියල්ලෝ එක් වර ඇද්ද හ.

ලේසියෙන් නළයෙන් පිටතට ලිස්සා ආ කිඹුලා උගේ දත්වලින් කොහු මිටේ තදින් එල්ලී සිටියේ ය.

"හරි......!" ළමෝ ප්‍රීති ඝෝෂා කළ හ.

තාත්තා, මැකරෝනි ළමයා සහ කැමැත්තෙන් ඉදිරි පත් වූ තව කීප දෙනෙක් එකතු ව ජයග්‍රාහක විලාසයෙන් කිඹුලා වීදිය ඔස්සේ ගෙන ගිය හ.

ඔවුන් පසු පසින් පුංචි ළමෝ දිවූ හ. සෑම ගෙයක ම වාසය කරන්නෝ මේ අරුම පුදුම පෙරහර නැරඹීමට කවුළුවලින් පිටට එබුණ හ. තමන් ක්‍රීඩාංගනයේ අසුන්වල ඉන්නාක් මෙන් ඔවුන්ට හැඟුණි. එහෙත් සර්කසයක වුව ද කිඹුලන් නැති නිසා එය ඊටත් වඩා යහපත් විය.

23

මිදුල හරහා පියාසර කළ සැළ ලිහිණියා ටික වේලාවක් පරෙවි රංචුවක් අතරේ හිඳ සමනලයකු දැක ඌ පස්සේ එළවා ගියේ ය. සමනලයා ඌට අසු නො වී හමුද පාසලකට ආධුනික තරුණයින් කණ්ඩායමක් සරඹ කරමින් සිටි පිට්ටනියකට ඌ කැඳවා ගෙන ගියේ ය.

හටයෝ සීරුවෙන් සිටිය හ. ඔවුන්ගේ ඔප් නැගු බොත්තම් සහ ගාංචු හිරු රැසින් දිලිසිණ.

සෙස්සන්ට වඩා උසින් වැඩි හටයෙක් අණ දුන්නේ ය. හෙතෙම ඉර අව්ව නිසා ඇස් කුඩා කර තමාගේ හට පේළියෙහි කෙළවර දෙස ආඩම්බරයෙන් බැලුවේ ය. ඔහු ඉතා කැමැත්තෙන් අණ දුන්නේ ය.

අණ දෙන හටයා "පහසුවෙන් සිටින් !" යන විධානය දීමට කට හරිනවාත් සමඟ ම "පෙරට යා !" යැයි කවුදෝ පැහැදිලි ව කෑගැසී ය.

අන්දුන්කුන්දුන් වූ අණ දෙන හටයා නළාව පිඹීමට පෙර මුළු හමුදව ම ඉදිරියට යාමට පටන් ගත් හ. එක් වර බිම වදින හටයින්ගේ සපත්තුවලින් රිත්මයට අනුව හඬ නැඟිණ.

සැළ ලිහිණියා යළිත් පියාඹා ගියේ ය.

24

මියෙල්කා, ලියෝ සහ පීතර එක් ව වාල්යා සොයන්නට ගිය බව ඔබ දන්නෙහි ය.

මඟ දිගට ම පීතර තමාගේ පොත කියැවූයේ ය. ඔහු පාර අයිනේ තුබූ කණු, ගස් සහ තාප්පවල හැපෙමින් ද හඬ නඟා සිනා සෙමින් ද ගියේ ය.

ඔවුන්ට මඟ දී කිබුල් පෙරහැර හමු විය. පීතර කිඹුලාගේ ඇඟේ හැපෙන්නට ම ගිය නමුත් පොතේ අග පිටුව කියවමින් සිටි ඔහු එදෙස යන්තම් බැලුවා පමණි. අනෙක් අතට ලියෝ නැවතී ඇස් ඔරවාගෙන -කට අයාගෙන එදෙස බලා සිටියේ ය.

"ඔය ගොල්ලො කොහෙද යන්නෙ ?" තාත්තා මියෙල්කාගෙන් ඇසුවේ ය.

"ඉබ්බා ගේන්න" ලියෝ ගරු සරු ඇති ව තාත්තා දෙස බලා කීය. ඔහු කිඹුලා හම්බ වුණේ කොහොම දැයි අසන්නට සැරසුණේ ය. එවිට ම පීතර පොත අවසාන බව කියා එය හඬ නැගෙන සේ



වසා පිම්මේ දුවන්නට පටන් ගත් හෙයින් ලියෝ ද මියෙල්කා අතින් අල්ලා ගෙන ඔහු අනුව දිව්වේ ය.

මැකරෝනි ළමයා ද වචනයක් කථා නො කර කිඹුල් පෙරහැර අත් හැර ඔවුන් පස්සේ දුවන්නට පටන් ගත්තේ ය.

ඔවුන්ට ගං තෙර දී වාල්යා හමු විය. ඔහු දණ්ඩක් වතුරේ බැස කොනක ඉබ්බා බඳනා ලද දිග ලණුවක අනෙක් කොන අල්ලාගෙන සිටියේ ය. ඉබ්බා දිය පහර මැද පිහිනුවේ ය.

මේ දුටු මියෙල්කා අතිශයින් කෝපයටත් භීතියටත් පත් වූවා ය. "ඔය අපේ ඉබ්බා. ඔයාට කිසි අයිතියක් නෑ ඌ දියේ ගිල්ලන්න. වහා ම ඌ ආපහු දෙන්න." යි ඈ කෑගැවා ය.

"ආ...! කොහෙ ඉඳලද මෙයා ආවෙ....? ඌ මගේ ඉබ්බා." වාල්යා සෝපහාසයෙන් කෑගැසුවේ ය.

පීතර වාල්යාට කරුණු විස්තර කර දුන්නේ ය.

"අපිට අයිතියක් නෑ ඌ විකුණන්න. ඌ අයිති පාසලටයි. මෙන්න ඔයාගෙ පොත. ඒක අරගෙන අපට ඉබ්බා දෙන්න"

"හ් ම් ම්........! " වාල්යා විරිත්තුවේ ය. "මොන පාසල ද ?"

"මොන පාසලවත් නොවෙයි—පාසල" මියෙල්කා කීවා ය.

"මොන පාසලවත් නොවෙයි නම් ඉබ්බා අයිති මටයි. ඔව් ඒක එහෙම මයි."

ඔහු ඔවුන්ට පිටු පා අනෙක් අතට හැරී ඉබ්බා දිය යට යවන්නට ලනුව ඇද්දේ ය.

"එයා නං දූන් ඌ අපට කීයට වත් දෙන්නෙ නෑ, මං දන්නවා එයාගෙ හැටි" පීතර සංවේගයෙන් කීවේ ය.

"හා එයා දෙන්නේ නැද්ද ? අපි බලමු !" ලියෝ සාහසික ව කී ය. ඔහු වාල්යා වෙතට ගමන් කෙළේ ය.

"මේ, මෙහෙ එන්න, ලනුව අදින්න."

"ආ ! ලනුවත් ඔයාගෙද ?" වාල්යා සරදම් සරින් ඇසී ය. "මගෙ ලනුව මට ඔන වෙලාවක මිසක් ඊට ඉස්සෙල්ල අදින්නෙ නෑ."

"ඔයාට ඇහුණෙ නැද්ද අපි කිව්ව ඉබ්බා පාසලට අයිති බව ?" ලියෝ කෝපයෙන් ඇසී ය.

"බාග වෙලාවට එහෙම වෙන්න පුළුවන්" කියූ වාල්යා සිවුරු හඬලන්නට පටන් ගත්තේ ය.

ලියෝට මෙය දරා ගත නොහැකි විය. ඔහු වාල්යාගේ හිසේ පසු පසට වැරෙන් පහරක් දුන්නේ ය.

සටන ඇවිලිණ. වාල්යා ශක්තිමත් ලොකු ළමයකු වූ නිසා මියෙල්කා වියරුවෙන් මෙන් ඔහු වෙතට පැන ඔහුගේ කෙස්සෙන් අල්ලා හැකි තාක් වැරෙන් නොඇද්ද නම් ලියෝට වරදින්නට තිබිණ.

වාල්යා වේදනාවෙන් කෑගසා ලනුව අත හැරියෙන් ඉබ්බා දියේ ගිලී නො පෙනී ගියේ ය. දැන් ඉබ්බා නිදැල්ලේ ගඟ මැද්දේ ය. ඌ දිය යට ගියා නම් කිසිවකුට නැවත හමු නොවන්නට තිබිණ.

මියෙල්කා විලාප නඟන්නට පටන් ගත්තා ය. පිරිමි ළමෝ ගල් ගැහී බලා සිටිය හ. හදිසියෙන් ම මැකරෝනි ළමයා සිය බෑගය මියෙල්කා අතට දුන්නේ ය. "මේක අල්ලා ගන්න" කියූ ඔහු මඳ දුරක් දුව ගොස් ගඟට පැන දියෙහි කිමිදුණේ ය.

25

දූරියෝ පාන් කැබෙලි එහෙ මෙහෙ විසුරුවමින් සෙවන මාවත දිගේ ගමන් කළ හ. ඔවුහු සුරතල් බසින් කුරුල්ලන්ට හඬ ගෑ හ.

ගේ කුරුල්ලෝ ද පරෙවියෝ ද කපුටෝ ද පාන් කැබෙලි අවුලන්නට ආ හ. වරක් කළු බළලෙක් ද ආවේ ය. එහෙත් සැළ ලිහිණියා ආවේ නැත.

"ඌ මේ දූන් රෑං ගාලා ඒවි" කියමින් දූරියෝ කැති සැනසූ හ. එහෙත් සැළ ලිහිණියා ආවේ නැත.

"මේක හරියන්නෙ නෑ. අපි දූන්වීමක් ගහමු" අන්තිමේ දී තාන්යා කීවා ය.

බංකුවක් මත වාඩි වී ගණිත ප්‍රශ්න වගයක් විසඳමින් හුන් ශිෂ්‍යයකු වෙත දුව ගිය තාන්යා ඔහුගෙන් කඩදසි කැබෙල්ලක් ඉල්ලුවා ය. ශිෂ්‍යයා සිය කටු සටහන් පොතෙන් කොළයක් ඉරද්දී ඈ ඔහුට මුළු කතාව සැකෙවින් කීවා ය. ඔහු ඈට ලොකු නිල් - රතු පැන්සලක් ද දුන්නේ ය.

තාන්යා ලොකු නිල් - රතු අකුරුවලින් මෙසේ ලීවා ය.

> නැති වුණා.
>
> රජයට අයිති - කතා කරන
>
> "සැළ ලිහිණියෙක්"
>
> සම්බ වුණු කෙනෙක් කරුණාකර
>
> බ්ලොකින් වීදියේ අංක 17 නිවැසි
>
> පැස්ටුෂ්කොව්ලාට බාර දෙන්න.

දැරියෝ දූන්වීම සෙවන මාවතේ තිබුණු ලොකු ම ගසේ ඇලවූ හ. ඔවුහු තව ටික වෙලාවක් කුරුල්ලා සොයමින් ඒ මේ අත දිවූ හ. ඊට පසු ලිලී මෙසේ කීවා ය.

"මේක හරියන්නෙ නෑ. මෙහෙම සැළලිහිණියා සොයා ගන්න කොට අපේ හොඳ පණ යාවි ! අපි බෙදිල ගොහින් එක් එකෙනා වෙන වෙන පැතිවල හොයමු."

"කවුරු කොහාට ද යන්නේ ?" නීනා ඇසුවා ය.

"මම කියන්නම් වැඩක්! අපි සීට්ටු අදිමු. හොඳද කැතී ?" තාන්යා යෝජනා කළා ය.

කැතී හිස වැනුවා ය. සැළ ලිහිණියා සොයා ගැනීමට උපකාර වෙති යි සිතෙන ඕනෑ ම දෙයක් කිරීමට ඈ සූදනම් ය.

තාන්යා පරණ සිනමා ටිකට්ටුවක් ගෙන හතරට ඉරා කෑලි හතරේ මොනවා දෝ ලියා ඒවා තමාගේ අත් ලේන්සුවේ කොන් හතරේ ගැට ගැසුවා ය. ඉන් පසු "අල්ලාගන්න, එක්කෙනාට එක මුල්ලයි" කියමින් ඈ ලේන්සුව උඩ වීසි කළා ය.

දැරියෝ සතර දෙනා ලේන්සුවේ කොන් සතර අල්වා ගෙන ගැට ලිහුවෝ ය.

"මට සෙවන මාවත" නීනා කීවා ය.

"අපොයි ! මට මිදුල් පේළිය" ලිලී කීවා ය.

"මට මල් වත්ත" කැතී කිවා ය.

"මට අමාරු ම එක - පිට්ටනිය සහ ජලාසය" තාන්යා කීවා ය. "කමක් නෑ. මම සැළ ලිහිණියා සොයා ගන්නවාමයි" ඈ වැඩි දුරටත් සහතික කළා ය.

දැරියෝ සතර දෙනා ඔවුනොවුනට හිමි වූ පෙදෙස් කරා දිවූ හ.

26

අසරණ කැතී ඇගේ සමනල අතංගුවත් රැගෙන උයනේ ඒ මේ අතට වැටී තුබූ පාරවල් දිගේ ඇවිද්ද ය. ඇ බලාපොරොත්තු සුන් කර ගෙන සිටියා ය. මේ අතර හදිසියෙන් ම කහ පාට තිත් සහිත කළු කුරුල්ලෙක් ඇගේ ඇසට ලක් විය.

කුරුල්ලා උයනේ එළිමහන් මැඳුර ළඟ පඳුරකට වී හොටෙන් පිහාටු පීරමින් සිටියේ ය. කැතී අතංගුව ඔසවා දෑතින් ම අල්වාගෙන - හුස්ම තද කරගෙන හෙමින් හෙමින් ඒ දෙසට කිට්ටු කළා ය.

නඩෙෂ්ඩා පෙත්‍රාවිනා සහ අත දරුවා වඩාගත් ආයා ඒ පඳුරට ම පිටුපසින් තිබුණු කොළ පාටින් පින්තාරු කරන ලද බංකුවක වාඩි වී සිටිය හ.

නඩෙෂ්ඩා පෙත්‍රොවිනාගේ උකුල මත බෝතලයක් විය. 'වස' යන අකුරුත් කතිර බඳුවට තැබූ මිනී ඇට දෙකට උඩින් වූ හිස් කබලේ ලකුණත් රතු පාටින් මුද්‍රණය කරන ලද ලේබලයත් බෝතලයේ අලවා තිබිණ. මී පාසානම් මීලට ගැනීම ඇගේ ලැයිස්තුවේ සඳහන් ව තිබූ අවසාන වැඩය විය. දන් සියලු වැඩ හමාර තිසා ඇ පොඩි විවේකයක් ගන්නට සිතුවා ය. දවස තුළ ඇති වූ සිදුවීම්වලින් වෙහෙසට පත් වූ ස්නායු ඇති ව සිටි ඇට විවේකය තදින් ම ඕනෑ කර තිබිණ.

නඩෙෂ්ඩා පෙත්‍රොවිනා තමාට සිදු වූ ඇබැද්දිය පිළිබඳ විස්තරය තුන් වැනි වතාවටත් ආයාට කීවා ය. එහෙත් ඇට ආයාගෙන් අනුකූලතාව දැක්වෙන වචනයක් වත් නො ලැබිණ. කිඹුලා ගැන විස්තර වූ කොටස තමාට කරන ලද පෞද්ගලික අපහාසයක් ලෙස ආයා සැලකුවා ය.

"මාව රවට්ටන්න හදන්න එපා" ඈ තම සපත්තුවේ ඇඟිලි වැහෙන කොටස ලණු පොටකින් බඳිමින් කීවා ය. කොතෙකුත් දිවීම නිසා සපත්තුවේ අඩිය බුරුල් වී තිබිණ.

"මම ඔය කිඹුල් කතා ඕන පදම් අහල තියනවා. මම පිටිසර කෙල්ලක් උණාට ඕවයින් මාව තම්බන්න බෑ!"

"මේ අහන්න" නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ආයාගේ අවධානය තමා වෙත අදිමින් කීවා ය. "ඉස්සෙල්ලා ම ගෝවා ගෙඩිය.........." කියමින් ඈ දකුණතේ එක ඇඟිල්ලක් නැමුවා ය.

ආයා ඇගේ කතාව නොඅදහන බව පළ කරමින් උගුර පෑදුවා ය.

"ඊළඟට හාවා.........." කියමින් නඩෙෂ්ඩා පෙත්‍රොව්නා දෙ වැනි ඇඟිල්ල නමමින් පලි ගැනීමේ ආශාව දක්වන සිනාවක් සුණා ය.

නොඉවසිලිමත් බව දක්වමින් ආයා ගලක් ගෙන තම සපත්තුවේ අඩිය තලන්නට පටන් ගත්තා ය.

"අන්තිමට කිඹුලා" නඩෙෂ්ඩා පෙත්‍රොව්නා තුන් වැනි ඇඟිල්ල නමමින් අවසාන කළා ය.

"පල් පච !" ආයා පිළිකුලින් කීවා ය.

මේ වන විට කැතී ඔවුන් කිට්ටුවට ම ඇවිත් ය. සැළ ලිහිණියා නො සෙල්වී සිටියේ ය. ඈ ඇඟිලි තුඩුවලින් සිට අතංගුව ඉස්සුවා ය.

"ඉතින් පුදුම ද මට හිසේ ඇම්ම හැදෙන එක ?" නඩෙෂ්ඩා පෙත්‍රොව්නා ඇසුවා ය. මේ මොහොතේ දී ම සැළ ලිහිණියා හරියට ඇගේ හිසට උඩින් ඉගිල්ලුණේ ය. ඒ එක්කම සමනල අතංගුව ඇගේ කනේ ගැවීගෙන පාත් විය.

උඩ වීසි වූ ආයා දවසේ මුල් භාගය තුළ තමාට එතරම් බොරු කියූ කුඩා දූරිය දුටුවා ය. කැළඹීම නිසා ඈ අත දරුවා අතට ගත්තේ හිස පහළට සිටින්නට ය.

නිතර ම තමාගේ සතුරන්ගේ අලුත් අරියාදුවක් බලාපොරොත්තුවෙන් සිටින නඩෙෂ්ඩා පෙත්‍රොව්නා වහා ඉදිරියට පැන කැතීගේ අතින් අතංගුව උදුරා ගත්තා ය. කැතී ඈ හඳුනා ගත්තේ එවිට ය.

"අනේ ! අනේ ! බොහොම කණගාටුයි." බියසුලු ලෙස කියමින් කැතී පැන දිව්වා ය.

ආපසු හැරුණු නඩෙෂ්ඩා පෙත්‍රොව්නා වේගයෙන් දුවන කැතී අතංගුවේ කහ පාට ඇහි තුළින් දුටුවා ය. දූත් ඈට සියල්ල පැහැදිලි ය. ඇගේ සතුරෝ තවමත් ඈට අරියාදු කරන්නට මාන බලති!

27

කැතී සිය මැලවුණු මුහුණ පහත හෙළාගෙන ගමන් කළා ය. ඇගේ දෙනෙතින් ගලන කඳුළු බිඳු වැහි බිඳු මෙන් මග දිගට වැටිණ.

ගෙදර යනු මිසක අන් කළ හැකි දෙයක් ඇට නො වී ය. මුල දී අමාරුවෙන් තරප්පු පේළිය නැංග ඈ පසු ව දුවන්නට පටන් ගත්තා ය.

සතුන් හැම දෙනා ම ආපසු විත් තමා එන තුරු බලා සිටිනු ඇතැයි ඈට සිතිණ. උන් හැම සදහට ම නැති වෙන්නට ඇතැයි ඈට නැවත සිතිණ.

කැතී සෝපාවෙහි කොනක ගුළි ගැසී වැතුරුණා ය. ඈ දූත් දූත් දෙරෙහි සීනුව වදිනු ඇතැයි බයාදු ලෙස බලාපොරොත්තු වූවා ය.

අන්තිමේ දී සීනුව වැදුණේ ය. එය දිගට ම තියුණු හඬින් වැදුණේ ය. නැඟිට ගොස් දෙර හැරීමට තරම් ධෛර්යයක් කැතීට නො වී ය. ආච්චි ගොස් දෙර හැරියා ය.

මියෙල්කා සහ මැකරෝනි ළමයා කාමරයට පැන්නා හ. දිවීම නිසා මියෙල්කා ඩහදියෙන් තෙත් ව සිටියා ය. ඇඳුම් පිටින් ම පීනා තෙත්බරියන් වූ මැකරෝනි ළමයා දිවීම නිසා ම හොඳ හැටි වෙලී සිටියේ ය.

ඔවුහු ඉබ්බා රැගෙන ඇවිත් සිටිය හ!

කැතී ප්‍රීතියෙන් හඬ නඟා සිනා සුණා ය. ඔක්කොම හරි යැයි ඈට මොහොතකට සිතිණ. එහෙත් ඒ මොහොතකට පමණි. අනෙක් සතුන් ගැන ඈට සිහි විය.

"කිඹුලා තමයි ඉතා ම වැදගත් සතා. සැළ ලිහිණියෙකුයි හාවෙකුයි නම් අපට කොහොමත් සොයා ගත්තැකි." තාත්තා කැතී සනසමින් කීවේ ය.

"එහෙම ද ඔබේ කල්පනාව ?" මැකරෝනි ළමයා නොසතුටින් ඇසී ය.

"සුරතලට ඇති කරන සතුන් විකුණන සාප්පුවට ටැලිපෝන් කරල මම අහන්නම් ඔවුන් ළඟ හාවුන් ඉන්නවද කියල."

"එහෙ නැතුව ඇති" ළමයා කී ය.

"අපි බලමු" කියමින් තාත්තා රිසීවරය අතට ගත්තේ ය.

බළලා බිත්ති මුදුනේ ඇවිදීමෙන් පසු ව අලසකමින් මෙන් ජනේලය දෙසට නෙත් හෙළී ය. ඌ හදිසියෙන් ම කන් දෙක ඔසවා රවුල් ගස් පුප්පා තාත්තාගේ ඇඟේ හැපීගෙන කාමරය හරහා පැන ඇඳුම් අල්මාරිය ඇතුළට වැදුණේ ය.

තාත්තා අන්දුන්කුන්දුන් වී බලා සිටියේ ය.

ඇඳුම් අල්මාරිය තුළින් පොර බදන හඬක් ඇසිණ. මොහොතකින් එහි දෙර වේගයෙන් ඇරී සුදු පාට ලොම් ගුලියක් පිටතට වීසි විණ. ලෝම ගුලිය බිම වැදෙනුවාත් සමග ම එය දෙ කඩ විය. බළලා සහ හාවා දෙපසට වෙන් වූ හ.

"හානේ !" කියමින් කැතී හාවා රැගෙන පපුවට තුරුළු කර ගත්තා ය. එහෙත් ඌ හිර වී මැරෙතැයි බිය වූ ඈ වහා ම හාවා කූඩුවට දැම්මා ය.

"එකත් එකට ම ඌ මගේ හාවා වෙන්න ඕනෑ" ආච්චි සිනා සෙමින් කීවා ය.

"වෙන්න බෑ, ඌ මගේ හාවා" මේ වන විට ඇතැම් කරුණු ගැන නිගමනයන්ට බැස සිටි තාත්තා කී ය.

ආච්චිගේ වුවත් තාත්තාගේ වුවත් අසරණ හාවාට කෑමට යමක් නුදුන්නොත් ඌ බඩගින්නේ මිය යනු නිසැක ය. කැතී උගේ කූඩුවට ඕට් පිටි ටිකක් දැමුවා ය. ආච්චි ගෝවා කොළ ටිකක් ගෙනෙන්නට කුස්සියට ගියා ය.

මියෙල්කා සහ මැකරෝනි ළමයා කූඩුව ඉදිරිපිට ඇන තියාගෙන උන් හ. ළමයා ඌට මැකරෝනි ස්වල්පයක් දුන්නේ ය.

"බොහොම හොඳයි, දැන් අපට මිළට ගන්න වෙන්නෙ එක හාවයි" තාත්තා කීවේ ය.

ආච්චි නැවත ගෙට ගොස් ලාච්චු සහ පෙට්ටි සියල්ල ඇර බැලුවාය. දෙ වැනි හාවා කොතැනක වත් නො වී ය.

මේ වරත් තමාට අසු වූයේ මෙතෙක් කල් අල්වා ගන්නට පෙරුම් පුරමින් සිටි මීයා නො වන බව දැක අධෛර්යයට පත් වූ බළලා සිත් වේදනාවෙන් කවුළුවෙන් පිටතට පා නැඟීය.

යළිත් දෙරේ සීනුව වැදිණ. මේ වර එහි නාදය ඉතා මෘදු විය. එහෙත් කැතීට එය හෙණ හඬක් මෙන් බියකරු විය.

ඔක්කොම උණේ මගෙ වැරැද්දෙන් - ඒ එයා තමා" ඈ සිතුවා ය.

ඈ අත් මිට මොළවා තද කර ගනිමින් තමාට ම මෙසේ තොල් මතුළා ය.

"මට එයාට මුහුණ දෙන්න බෑ........ මට බෑ."

සීනුව නැවතත් වැදිණ. ආච්චි කැතී වෙතට දිව්වා ය.

"මේ ඔක්කොම මගෙ වැරැද්දයි, අඬන්න එපා, වස්තුව, මම ම එයාට කතා කරන්නම්."

තාත්තා සුසුම් ලා හිස වනා සාලයට ගියේ ය. බියෙන් මිරිකුණු මියෙල්කා ඇඳ යටට රිංගුවා ය. "ඔය මොකද ?" යි මැකරෝනි ළමයා ඇසූ නමුත් ඈ නිහඬ වූවා ය.

තාත්තා දෙර හැරියේ ය.

"ආ.......... සාශා !" ඔහු ප්‍රීතියෙන් කීවේ ය.

"සාශා ක්ලිමොව්, දකින්න බොහොම සන්තෝසයි......... කොහොම ද සැප සනීප ?"

ජැන්ඩියට ඇඳ සිටි - කදිම පෙනුමක් ඇති සාශා සාලයට ඇතුළු ව බුමුතුරුණේ පා පිස දැමුවේ ය. අනතුරු ව ඔහු උගුර පාද මෙසේ කීවේ ය.

"ඔබට බොහොම ස්තුතියි. අම්මත් තාත්තත් ඔබට ස්තුති කළා. මමත් ස්තුති කරනවා."

"එහෙනම් ඔබ සංගීත පාසලේ විභාගෙන් පාස් ද? " කැතීගේ තාත්තා ඇසී ය.

"විශිෂ්ට සාමාර්ථය, ක්‍රොච්ෂර්ගෙ ද්විත්ව ප්‍රස්ථාරවලට - ඔබ මට දවසට පැය තුනක් පුරුදු කරපු ඒවා" සාශා ප්‍රීතියෙන් ඉපිලෙමින් කීවේ ය.

"ඔබට ජය වේවා! දැන් ඉතින් අපේ පාසලේ අලුත් ශිෂ්‍යයෙක් හැටියට ම ඔබ ගැන සොයා බලන්න පුළුවනි. අපේ අනාගත වයලීන ශූරයා ! මගේ සුබ පැතුම් පිළිගන්න."

ඔවුහු දෙදෙනා ම ශබ්ද නඟා සිනාසුණ හ.

"ඔක්කොම ඔබ නිසයි" සාශා කී ය. "අම්මයි තාත්තයි........ මමයි ඔබට පිළිගන්වන්න කැමතියි මේ............ මේ............. චොකලට් වැඩ දාපු .... " සාශා තමාගේ පිටේ එල්ලා තුබූ විශාල කේක් පෙට්ටිය අතට ගෙන තාත්තා දෙසට දිගු කෙළේ ය.

"ආ......... හැබෑට ම........" තාත්තා කථාව ඇරඹුවේ ය. එහෙත් සාශා පෙට්ටිය බලෙන් මෙන් ඔහු අතේ තබා තරප්පු පේළිය දිගේ දුවන ගමන් මෙසේ කීවේ ය.

"ඔබට ස්තුති යි! ඔබට ස්තුති යි!"

හැම දෙනා ම නිශ්ශබ්ද ව බලා සිටි කාමරයට තාත්තා ආපසු ආවේ ය.

"කාටවත් කියන්න බැහැ ඊළඟ මොහොතෙ සිදු වෙන්නෙ මොකක් ද කියල" කී ඔහු කොක් හඬ ලා සිනා සුණේ ය. "කොයි හැටි වුණත් ඉතින් ලොකු පිහියයි පිඟනුයි ගනිමු."

"ඔය ගොල්ලො කැමති නම් මගේ කොටස මම මෙහෙ ඉඳන් ම ගන්නම් !" මියෙල්කා ඇඳ යට සිට කීවා ය.

ආච්චි ඉක්මනින් පිඟන් ගෙන ආවා ය. තාත්තා කේක් පෙට්ටිය බැඳ තිබූ පීත්ත පටිය ලොකු පිහියෙන් කපා පියන ඉස්සුවේ.

කපු පුළුන් මැදින් මතු වූ සුදු හාවා මේස රෙද්ද උඩට පැන්නේ ය.

"මොනවා !" කියමින් වාඩි වූ තාත්තා පුටුව වැරදී බිම ඇද වැටුණේ ය.

28

පණුවන් අවුලා කෑමෙන් පසු සැළ ලිහිණියාට පිපාසය ඇති විය. දුර සිට ජලාසයක් දුටු ඌ පියාඹා අවුත්, හත් අවුරුද්දක් තිස්සේ දියෙහි කිමිදෙන්නට තැත් කරමින් සිටින කිරි ගරුඬෙන් කළ නාන මිනිහකුගේ පිළිරුවක හිසෙහි මඳ විවේකයක් ගැනීමට වැසුවේ ය.

සැළ ලිහිණියා පිළිරුවට "හලෝ" කී ය. එහෙත් ඌ එය කිසි සේත් නොකිව යුතු ව තිබුණේ ය.

"අන්න ඌ........ ! කතා කරන සැළ ලිහිණියා ! දැන්වීමේ තිබුණ එකා, අල්ලපල්ලා!" පිරිමි ළමෝ කෑගැසූ හ. ගැහැණු ළමෝ යටි ගිරියෙන් මොර දුන් හ. ළමයි රංචුවක් ජලාසය වෙත දුව ආ හ.

බියට පත් පක්ෂියා දිය බොන්නට කාලයක් ද නොලැබ අහසට නැංගේ ය. ළමෝ ද වැඩිහිටියෝ ද ඌ පස්සේ එළවන්නට වූ හ. ඌ අන්තිමේ දී මිදුලක් මැද වූ ලොකු ගහක මුදුනේ කලබල නැති තැනක් සොයා ගත්තේ ය.

නගර සභාවේ සේවකයා පදික වේදිකාව සේදූ හැටියේ ම නිසා එහි ගල් අතරේ වූ සිහිති දිය කඩිතිවලට බැස යන හිරුගේ රැස් වැටී දිලිසිණ. සැළ ලිහිණියා ගසින් බැස එක් වලක් වෙතට පියාඹා දිය බොන්නට සැරසෙන විට ම දුඹුරු පාට බලු පැටවෙක් දුවගෙන විත් ඌට බුරන්නට විය.

සැළ ලිහිණියා අහසට නැංගේ ය. ඌ වහලවලට උඩින් රවුම් ගසා අවසානයෙහි සියල්ලට ම ඉහළින් තිබෙන ටැලිවිෂන් ඒරියලක වැසුවේ ය. එතැන නම් ආරක්ෂා සහිත විය. එහෙත් පිපාසය නොසන්සිඳිණ.

වැහි වතුර බැස යාමට තැනූ පීල්ලක කුණු වතුර ටිකක් තිබෙනු දුටු ඌ යළි පහළට පියැඹී ය. දඩයමක් සොයමින් වහළ උඩ ඔබ

මොබ ඇවිදින ආච්චිගේ සුදු බළලා වැහි වතුර පීල්ල මත සිටින කුරුල්ලා දුටුවේ ය. බළලා දන්වීම කියවා නොතිබූ නමුත් සැළ ලිහිණියා අල්ලා ගන්නට ඌටත් හේතු තිබුණේ ය.

බළලා හීන් සීරුවේ බඩගා ගොස් සැළ ලිහිණියා වෙතට පැන්නේ ය. සැළ ලිහිණියා නූලෙන් බේරුණේ ය. උගේ පෙඳයේ පිහාටුවක් බළලා ගේ අතට ගැළවී ආවේ ය.

බියෙන් තැති ගත් අසරණ සැළ ලිහිණියා මිනිත්තු කීපයක් අහසේ රවුම් ගසා ඌට පෙනුණ පළමු වැනි ජනේලය තුළින් ගෙට ඇතුළු විය.

තව වරක් බළලාට අහේතුව හරස් විය. උගේ ගොදුර අනූ නවයෙන් බේරී ගියේ ය.

29

"කලබල වෙන්න එපා" තාත්තා සුරතින් නළල පිරිමදිමින් කීවේ ය. "සෑම දෙයක් ම හේතු යුක්ති අනුව තේරුම් කළ හැකි වෙන්න ඕනෑ. පළමුවෙන් කියන්න මේ ඔබේ හාවා ම ද ?"

"ඔව්, ඌ මගෙ හාවා" කැතී උනන්දුවෙන් කීවා ය. තමා වග කිව යුතු සතුන්ගෙන් තව අඩු සැළ ලිහිණියා පමණක් නිසා ඇගේ ශෝකය තුනී වී තිබිණ.

මියෙල්කා සිතේ කිසි බරක් නැති ව හාවුන් සමග සෙල්ලම් කළා ය. ඈ එක හාවකු අමතා "අපි කියමු උඹට හිම වලහෙක් ය කියල" කීවා ය. "උඹ........ සුදු අලියෙක්" ඈ අනෙකාට කීවා ය.

"දෙවනුව ඌ කොහොම ද කේක් සාප්පුවට ලැබුණෙ ?" තාත්තා කියාගෙන ගියේ ය.

"මම දවසක් කාල තියනව ඉඟුරු කේක් අස්සයෙක්" මැකරෝනි ළමයා කටට ආවක් කීවේ ය.



"ඔයාට කැමති දෙයක් කියන්න. ඒත් මට පේනවා මෙතන මොකක් හරි වැරදීමක් තිබෙන බව" ආච්චි කීවා ය.

"වැරදීමක් ඇතත් නැතත් මම නම් මීට පස්සෙ මොන දේකට වත් පුදුම වෙන්නෙ නෑ............ වෙන එකක් තියා කැතීගෙ සැළලිහිණියා ඔළුවෙ උස තොප්පියක් දමා ගෙන අත් හැන්දෙන් බස්තමක්

අරගෙන ආවත්.......... පුදුම වෙන්නෙ නෑ" තාත්තා කීවේ ය.

දෙරේ සීනුව වැදුණේ ය.

"අන්න ඌ තමයි, සැළ ලිහිණියා තොප්පියක් දගෙන බස්තමක් අරගෙන ඇවිත් !" තාත්තා කීවේ ය.

ආච්චි දෙර හරින්නට ගියා ය.

"කැතරින් පැස්ටුෂ්කෝවා ගෙදර ඉන්නවද ?" කිසිවකු අසනු කැතීට ඇසිණ.

කටහඬ මිත්යාගේ ය. කැතී බියෙන් වෙව්ලුවා ය. මියෙල්කා යළිත් ඇඳ යටට බඩ ගෑවා ය. දෙර හැරිණ. මිත්යා සහ අන්ද්‍රි එලිපත්ත උඩ සිට ගත් හ.

කැතී ගේ කටේ කෙළ සිඳී ගියේ ය. ඈට "හලෝ" යන ආචාර වචනය වත් කියා ගන්නට බැරි විය.

කැතීට පිටුපසින් සිටි කිසිවෙක් "හලෝ !" කී ය. ඈ ආපසු හැරී බැලුවා ය.

සැළ ලිහිණියා කූඩුව ඇතුළෙහි සිටියේ ය. ඌ දිය බඳුන තුළට වී පිහාටු ගැසුවේ ය. දිය බිඳු සෑම අතට විසිරිණ.

කැතී ප්‍රීති සහගත පැහැදිලි හඬින් "හලෝ" කීවා ය.

මිත්යා සහ අන්ද්‍රි කුතුහලයෙන් යුතු ව ඔවුන්ගේ ඇස් ඉබ්බාගෙන් හාවුන් දෙසට ද හාවුන්ගෙන් කිඹුලා දෙසට ද කිඹුලාගෙන් සැළ ලිහිණියා දෙසට ද යැවූ හ. අන්තිමේ දී ඔවුන්ගේ මුහුණුවලට සිනා නැගිණ.

"සුබ සැන්දෑවක් වේවා" ඔවුහු දෙදෙනා ම ආචාර සම්පන්න ලෙස කී ය.

තාත්තා ප්‍රීතියෙන් කච්චිය උඩ වාඩි වී හුන්නේ ය.

"මම හිතනවා අපේ සතුන්ගෙන් ඔබට හිරිහැරයක් උනේ නෑ කියා" මිත්යා සන්සුන් ලෙස කීවේ ය.

"අපොයි, මුකුත් නෑ!" මුළු පවුල ම එක් වර කී හ.

"ඔබ ළඟ තවත් සතුන් ඉන්නවා නම් - අලියෙක් හරි කොටියෙක් හරි උනත් කමක් නෑ - අපට බාර දෙන්න, අපි බොහොම සන්තෝසයි" තාත්තා වැඩි දුරටත් කීවේ ය.

මිත්යා කුවිතාන්සිය ගෙන කියවන්නට විය.

"සුදු හාවුන් දෙන්නයි.........."

"මෙන්න" කැතී හා කූඩුව අන්ද්‍රිට දෙමින් කීවා ය.

"යුරෝපීය ඉබ්බන් එකයි....... "

"එකයි" කැතී සහ මියෙල්කා ඔහු අනුව කී හ.

"කතා කරන සැළ ලිහිණියන් එකයි...."

අන්ද්‍රි කුරුළු කූඩුව උඩට අත්ලේන්සුව වීසි කලේ ය.

"කිඹුලන් එකයි- එච්චරයි" මිත්‍යා ලී පෙට්ටියේ පියන වසමින් කීවේ ය.

"දූක්කද උං පයිප්පය ඇතුළෙ උන්න හැටි!" කියමින් මැකරෝනි ළමයා මහ හඬින් සිනා සෙන්නට විය.

"හා හා, ඇති ඇති !" තාත්තා සැර බැල්මක් හෙළා ඔහු නිහඬ කෙළේ ය.

මිත්‍යා සහ අන්ද්‍රි ඉදිරියට අවුත් කැතීට අතට අත දුන් හ. ඉන් පසු ඔවුහු ආච්චිට සහ තාත්තාට පමණක් නොව මියෙල්කාට පවා හිස නමා ආචාර කළ හ.

"ශුභ රාත්‍රියක් වේවා !" ඔවුහු වෙන්ව යාම සඳහා සමු ගන්නට කී හ.

එවිට ම ආච්චිගේ සුදු බළලා ජනේල පඩිය මත දිස් විය.

"ඔය ගොල්ලො කැමති නැද්ද මේ බළලත් අරගෙන යන්න ?" තාත්තා ඇසී ය.

"නෑ........... බොහොම ස්තුතියි අපට බළලෙක් ඕන නෑ" ළමෝ උත්තර දුන් හ.

එවිට ම නැවතත් දෙරේ සීනුව වැදුණේ ය.

"කවුද ඒ පාර ? මම හිතුවා එන්න හිටපු කවුරුත් ඇවිත් ඉවරයි කියා" කියමින් තාත්තා දෙර හරින්නට ගියේ ය.

ක්ලිමොව් මහත්මයා ලොකු කේක් පෙට්ටියකුත් උස්සා ගෙන ඇවිත් සිටියේ ය. තාත්තා ඔහුගේ ටයි පටියෙන් අල්ලා සොලවමින් මෙසේ ඇසුවේ ය.

"මේ බලන්න, මට ඇත්ත කියන්න ! කොහොම ද ඔබට අපේ හාවා ලැබුණේ ?"

"හාවා..........!" මොන හාවා ද?" ක්ලිමොව් පුදුමයෙන් ඇසී ය. ඔහුගේ මුහුණ දෙස මොහොතක් බලා සිටි තාත්තා ඔහු හාවා ගැන කිසිත් නොදන්නා බව තේරුම් ගත්තේ ය.

ඔහු එය දූන සිටියේ නැත. එද කන්තෝරුවේ වැඩ බහුල දිනයක් වූ හෙයින් ඔහුට කේක් ගෙඩියක් මිලට ගන්නට කාලය නො

ලැබිණ. වැඩ ඉවර වූ පසු කේක් ගෙඩිය ගෙන ගෙදර ආ ඔහුට සිය බිරිය සහ පුතා චිත්‍රපටියක් බලන්නට ගිය වග දැනගන්නට ලැබිණ. ඒ නිසා තමා ම එය පැස්ටුෂ්කොට්ට ගෙන ගොස් දීමට සුදුසු යයි ඔහු සිතුවේ ය. ඔහු වත් ඔහුගේ බිරිඳ හෝ පුතා හෝ වත් හාවා ගැන කිසිවක් නො දත් හ.

හාවා ගැන දැන සිටි එක ම තැනැත්තිය නඩෙෂ්ඩා පොත්‍රොව්නා ය. එහෙත් කිසිවෙක් ඇගෙන් අසන්නට නොගියහ.

ක්ලිමොව් මහතා නික්ම ගිය පසු "සමහර දේවල් තේරුම් ගන්න තාමත් අමාරුයි" කියමින් තාත්තා දෙර වැසුවේ ය. ඔහු ආපසු කාමරයට පැමිණ මෙසේ කීවේ ය.

"හොඳයි.......... මේක වත් මුගටියෙක් හරි කැන්ගරුවෙක් හරි නො වි හැබෑ කේක් ගෙඩියක් උණොත් - අපි ඒක කමු."

"කරුණා කරලා හැමෝ ම වාඩි වෙන්න" කියමින් ආච්චි මේසය වටේට පුටු තිබ්බා ය. තාත්තා ලොකු පිහිය ගත්තේ ය. එහෙත් ඔහු පීත්ත පටිය කපන්නට පෙර පෙට්ටියට කන තබා බැලුවේ ය. එය තුළින් කිසි ශබ්දයක් නො ආ හෙයින් ඔහු පරෙස්සමෙන් පීත්ත පටිය කපා පියන ඉස්සුවේ ය. එය සැබැවින් ම කේක් ගෙඩියක් විය. වටේට චොකලට්වලින් වැඩ දැමූ කදිම කේක් ගෙඩියක් විය. මැද රෝස පාට ක්‍රීම්වලින් සැදූ ලොකු රෝස මල් තිබුණේ ය.

"සුබ රාත්‍රියක් වේවා" කියමින් මැකරෝනි ළමයා නැගිට්ටේ ය. කවුරුත් පුදුමයට පත් ව ඔහුට නවතින්නට පෙරැත්ත කළ හ.

"බෑ, අම්මා මට මිනිත්තු දහයකින් මැකරෝනි අරන් එන්න කීවා. දැන් ඊට වැඩිය ඇති" කියමින් ඔහු මැකරෝනි පොදිය අතට ගත්තේ ය.

කව්ළුවෙන් පිටත බැලූ මැකරෝනි ළමයාට වීදිවල විදුලි පහන් දල්වා ඇති බව ද හඳ පායා ඇති බව ද පෙනිණ. වහා ගෙන් පිට වූ ඔහු අඳ අඳුරේ නොපෙනී ගියේ ය.



අනුවාදක ගැන.......

'සාහිත්‍යය සමාජයේ සුභ සාධනය සඳහා ය' යන්න තේමාව කොට ගත් ඔහු මොහොතක රසාස්වාදනයක් ලබා දෙන ප්‍රේම කතා නොලීවේ ඔහුගේ ප්‍රේමය දරු පරපුර ඇතුළු මුළු මානව සමාජය පුරාම පැතිරවීමේ අදහසින් වන්නට ඇත. ප්‍රේමයේ ප්‍රතිඵල වශයෙන් සමාජයට එක් වන දරු පරපුර සඳහා ඔහු ළමා කතා ලීවේය. සෝවියට් පරිවර්තනයක් වූ මෙම කැතී සහ කිඹුලා එහි මුල්ම පියවර විය. මුතු මාලය, ඔටුවාගේ සිහිනය, හැංගි මුත්තං, කුංචා-වීස්කම් දැරිය සහ එලෝ අමුත්තෝ ආදිය ඊළඟ පියවර විය. වරක වෙනස්වන සමාජ ස්වභාවයත් ජීවිතයේ සැබෑ ඇතුල් පැත්තත් කියන්නට ඔහු චීන සාහිත්‍යයෙන් උපුටා ගත් නව සඳ සහ තවත් කතා නිර්මාණය උපයෝගී කොට ගත්තේය. 1983 වසර ඔහුගේ සාහිත්‍යකරණයේ උච්චතම අවස්ථාව විය. අනුවාද සාහිත්‍යකරණය වෙනුවෙන් සෝවියට් ලේඛක බොලායෙෆ්ගේ 'වියෙල්වියෙක් ඇම්ෆිබියා' උභයජීව නමින් අනුවාදය කර වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මානයද හිමිකරගත්තේ ය.

-ජේ.පී.ගුණසේකර

ISBN 955-8425-14-X

මිල රු. 130/-

සූරිය ප්‍රකාශකයෝ

109, එස් මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.